**ශ්‍රී ලංකා HDFC බැංකුව -** වාර්ෂික වාර්තාව 2019

**இலங்கை வீடமைப்பு அபிவிருத்தி நிதிக் கூட்டுத்தாபன வங்கி -** ஆண்டறிக்கை 2019

**HDFC BANK OF SRI LANKA -** Annual Report 2019




2019 මූල්‍ය වර්ෂය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාවේ සිංහල, දමිළ සහ ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් මෙම පොතේ අඩංගු වේ

இந்தப் புத்தகம் HDFC வங்கியின் 2019ம் நிதியாண்டுக்கான வருடாந்த அறிக்கையின் சிங்கள, தமிழ் மற்றும் ஆங்கில மொழிப் பதிப்புகளைக் கொண்டுள்ளது

This book contains the Sinhala, Tamil and English versions of the Annual Report of HDFC Bank for the financial year 2019

**ශ්‍රී ලංකා HDFC බැංකුව**
වාර්ෂික වාර්තාව 2019

HDFC BANK
The Bank for your Home

# සවිබලගැන්වීමේ දැක්ම



# අන්තර්ගතය


වාර්තාව හැඳින්වීම/ 02

**HDFC බැංකුව පිළිබඳව**

අපේ දැක්ම/ මෙහෙයුම් සහ අගයන්/ 03
අපේ කතාව/ 04
අපේ ව්‍යාපාර ආකෘතිය / 06
නිෂ්පාදිත පෙළගැස්ම/ 08
ජාල සිතියම/ 09

**කාර්යසාධන සමාලෝචන**

මූල්‍ය විශේෂතා/12
සභාපතිගේ පණිවුඩය/ 14
සාමාන්‍ය කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය/17
2019 දී ප්‍රාග්ධනයට සිදු වූ වෙනස්කම්/22
මූල්‍ය සමාලෝචනය/23
මානව ප්‍රාග්ධනය/28
බුද්ධිමය ප්‍රාග්ධනය/31
සමාජ ප්‍රාග්ධනය/ 32
අවදානම් කළමනාකරණ වාර්තාව/ 37

**පාලනය සහ අභ්‍යන්තර පාලන**

අනුකූලතාව පිළිබඳ සභාපතිගේ ප්‍රකාශය/43
අනුකූලතා සමාලෝචනය/46
පාලනය සහ ආචාරධර්ම/79
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව/83
අභ්‍යන්තර පාලනය තුළ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය/88
අභ්‍යන්තර පාලන පිළිබඳ විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව/90
ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව/ 92
මණ්ඩල උප කමිටු වාර්තා/94
අධ්‍යක්ෂක මණ්ඩලය/101
අධ්‍යක්ෂක මණ්ඩලය පිළිබඳව/ 102
ආයතනික කළමනාකරණය/ 106
ආයතනික කළමනාකරණය පිළිබඳව/ 108
අංශ ප්‍රධානීන්/ 110
ප්‍රාදේශීය කළමනාකරුවන්/ 112
ශාඛා කළමනාකරුවන්/ 113

**මූල්‍ය වාර්තා**

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම/116
විගණකාධිපති වාර්තාව/ 118
ආදායම් ප්‍රකාශය/ 122
විස්තීරණ ආදායම් ප්‍රකාශය/ 123
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය/ 124
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය/125
මුදල් ප්‍රවාහ ප්‍රකාශය/ 126
ගිණුම්කරණ ප්‍රතිපත්ති/ 127
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්/ 137
මූල්‍ය උපකරණ සඳහා මිනුම්
ප්‍රාග්ධනයේ ප්‍රමාණවත්බව/165
අවදානම ගළපන ලද- ශේෂ පත්‍ර නිරාවරණය - රු.000/166
තොරතුරු බෙදාගැනීම/168
එකතු කළ අගය සහිත ප්‍රකාශය/171
දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය/172
ආයතනික තොරතුරු- ඇතුළත පසු කවරය

ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමට අපට ඇති හැකියාව, අප සතු ශක්තියයි.  අප ලද දියුණුවත් සමඟ, තිරසාරත්වය නිර්මාණය කිරීම සඳහා අපගේ උත්සාහය ඇරඹුණේ, ආර්ථිකමය අන්තර්ගතය, අසීමිත අවස්ථා සහ දිගුකාලීන තිරසාරත්වයක් සහිත පරිසරයක් නිර්මාණය කිරීමේ අප වැඩපිළිවෙළ මඟිනි.

මේ වසරේ දී, සුළු සහ මධ්‍යම ආදායම්ලාභී කණ්ඩායම්වල සිහින සැබෑ කරලීම සඳහා සහය වීමට අප අවධානය යොමුකල නිසා; එනම් එය අපව අන්‍යන්ගෙන් වෙනස්කොට දක්වන මූලෝපායක් වීමෙන්,  ජාතියේ සහ ජනතාවගේ ආර්ථික වර්ධනය තහවුරු කිරීම උදෙසා අපි වෙහෙස නොතකා සේවයෙහි යෙදෙමින් කටයුතු නවමු ලෙස දකින්නෙමු.

සියලු ශ්‍රී ලාංකිකයන්ට ප්‍රයෝජන සලසන, බලගැන්වීමේ දැක්මක් (A vision of empowerment) අප සතුව ඇත.

# සවිබලගැන්වීමේ දැක්ම

# වාර්තාව හඳුන්වා දීම

අන්තර්ජාතික වාර්තා කවුන්සිලය හඳුන්වා දුන් 2013 ඒකාබද්ධ වාර්තාකරණ ආකෘතිය මත පදනම්ව, මෙවරත් HDFC බැංකුව 2019 වර්ෂය සඳහා වූ සිය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරයි. මෙම වාර්තාව මඟින්, 2019 ජනවාරි 01 වන දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ කාලසීමාව තුළ බැංකුවේ මූල්‍යම සහ වෙනත් වැදගත් මාතෘකා ආවරණය කෙරේ. මීට අමතරව, කොළඹ කොටස් හුවමාරුව සහ වෙනත් අත්‍යවශ්‍ය රෙගුලාසි යටතේ වූ අනාවරණය කිරීම් ද මෙම වාර්තාවේ අඩංගු වේ.

පෙර වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කිසිදු තොරතුරක් නැවත සඳහන් කිරීමට HDFC බැංකුවට සිදුවූයේ නැත.

### මෙම වාර්තාව සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ පදනම

මෙම වාර්තාවේ අන්තර්ගතය තීරණය කිරීමට පදනම් වූයේ, වර්ෂය සඳහා වූ වැදගත් මාතෘකා හඳුනා ගනිමින් ඒවා සමාලෝචනය කිරීමත්, ඉන් උපායමාර්ගික හා තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමත් ය. මීට අමතරව, අවදානම් තක්සේරු කිරීමේ වෙනස්කම්, යහපාලනය සහ අනුකූල අවශ්‍යතා ද වාර්තාවේ අන්තර්ගතයට ඇතුළත් කිරීමට තීරණය විය. අනාවරණය සඳහා තෝරාගත් වැදගත් මාතෘකා තීරණය කරන ලද්දේ ප්‍රධාන කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරී (GM/CEO) ඇතුළු මූලික කළමනාකරණ නිලධාරීන් විසිනි.

අනාවරණය කිරීමේ මාතෘකා තීරණය කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත්තේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂා සහ ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ (අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අමතරව) අවශ්‍යතා ය. ඒ අනුව, සභාපතිගේ පණිවිඩය සහ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය මඟින්, දැනට බැංකුවේ පවතින තත්ත්වයට අදාළව ඇති, වඩා වැදගත් උපාය මාර්ග සහිත මාතෘකා ඉස්මතු කිරීම සිදුවන අතර සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී ඔවුන්ගේ ප්‍රකාශවලින් සාකච්ඡා කරන්නේ වර්ධන උපාය මාර්ග සහ සම්පත් වෙන්කිරීම සම්බන්ධව ය.

### මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ දායකත්වය

සමාලෝචනය යටතේ ඇති වර්ෂය තුළ, බැංකුව ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා සපුරාලූ ආකාරය සහ ඒ සඳහා බැංකුව ඉදිරියට ක්‍රියාත්මක වන ආකාරයේ සැලසුම් පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා සභාපතිවරයාගේ පණිවිඩය සහ ප්‍රධාන කළමනාකරු/ ප්‍රධාන විධායක නිලධාරීගේ (GM/CEO) සමාලෝචන බලන්න. (මෙම වාර්තාවේ අඩංගු, අනාගතය හා සම්බන්ධ ප්‍රකාශ වෙනස් විය හැකිය).

වාර්ෂික වාර්තාව, වැදගත් පාර්ශ්වකරුවන් අතර සන්නිවේදන මෙවලමක් වන නිසා මෙම වාර්තාව ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවට පරිවර්තනය කර ඇත.

මීට අමතරව මෙම වාර්තාවේ පිටපත් අදාළ රාජ්‍ය අමාත්‍යාංශ වෙත සපයා ඇති අතර වඩා පහසු ප්‍රවේශයක් සඳහා වෙබ් අඩවියට (www.hdfc.lk) උඩුගත කර ඇත.

### ඒකාබද්ධ වාර්තා කළ ප්‍රතිපත්ති සමඟ අනුකූල වීම

ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් මෙම වාර්ෂික වාර්තාවේ නිරවද්‍යතාවය තහවුරු කරනු ලැබ ඇති අතර අනෙක් සියලු ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු වල නිරවද්‍යතාවය හා විශ්වසනීයත්වය, අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන් විසින් තහවුරු කරනු ලැබ ඇත.

අනාවරණය කිරීම සඳහා ප්‍රධාන මාතෘකා හඳුනා ගැනීමෙන්, සමාලෝචනය යටතේ ඇති වර්ෂය සඳහා වඩා වැදගත් කරුණු අන්තර්ගත වූ සංයුක්ත සහ සම්පූර්ණ මුත් සංක්ෂිප්ත වූ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අප ප්‍රයත්න දරා ඇත.

මීට අමතරව, සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සෘජු මැදිහත්වීම ලබා ගනිමින්, වඩාත් උපායශීලී මෙන්ම අනාගතය සඳහා ද වූ ප්‍රතිරූපයක් ගොඩ නැගීමට අප උත්සහ දරා ඇත.

### මෙම වාර්ෂික වාර්තාව පිළිබඳව ඔබේ අදහස් මේ වෙත යොමු කළ යුතුය.


ප්‍රධාන මූල්‍ය නිලධාරී
**ඩී. විද්‍යානපතිරණ මහතා**
ඊ- මේල්: **cfo@hdfc.lk**
දුරකතන අංක: +9411 235 6802/ 9411 235 6829



**මෙම වාර්ෂික වාර්තාව පිළිබඳව ඔබේ අදහස් මේ වෙත යොමු කළ යුතුය.**

ප්‍රධාන මූල්‍ය නිලධාරී
**ඩී. විද්‍යානපතිරණ මහතා**
ඊ- මේල්: **cfo@hdfc.lk**
දුරකතන අංක: +9411 235 6802/ 9411 235 6829




# අපේ දැක්ම, මෙහෙවර සහ අගයන්

## අපේ දැක්ම

"ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන මූල්‍ය අංශයේ වෙළඳපොළේ ප්‍රමුඛයා බවට පත්වීම."

---

## අපේ මෙහෙවර

අපගේ හවුල්කරුවන්ගේ, පාරිභෝගිකයන්ගේ, කාර්ය මණ්ඩලයේ සහ ස්වභාවික පරිසරය අරමුණු කරගෙන අපි අපේ අරමුණ පුළුල්ව ගොඩ නගා ඇත්තෙමු.

- **අපේ හවුල්කරුවන් වෙත, අපේ මෙහෙවර උපරිම ප්‍රතිලාභ ලබා දීමයි.**
- **අපේ පාරිභෝගිකයන් වෙත, අපේ මෙහෙවර, අවශ්‍යතාවන් සපුරමින් හා නවමු සංකල්ප සමග ඔවුන්ගේ අපේක්ෂාවන් අභිබවා තෘප්තිමත් කරලමින් හෘදයාංගම සේවාවක් සැපයීමයි.**
- **අපේ කාර්ය මණ්ඩලය වෙත, අපේ මෙහෙවර ඔවුන්ගේ විවිධ හැකියාවන් හඳුනාගෙන, ඒවා වර්ධනය, උනන්දු කරවීම, අවබෝධ කරගැනීම සහ ඊට ඇඟයුම් ලබා දෙමින් ජාතික නිවාස දැක්ම වෙත ගමන් කිරීමට අවශ්‍ය මාර්ගය සපුරාලීමයි.**
- **ජාතික ආර්ථිකය සහ කර්මාන්ත නියාමකය වෙත, අපේ මෙහෙවර ජාතික නිවාස ප්‍රතිපත්තියට නායකත්වය දීමට, හැඩ ගැස්වීමට සහ මූල්‍ය සහයෝගය ලබාදීමට ප්‍රධාන ධාවකයා ලෙස කටයුතු කිරීමයි.**
- **අපේ ස්වභාවික පරිසරයට, අපේ මෙහෙවර තිරසාර ක්‍රමවේදයන් අපේ සියළුම කටයුතු සඳහා යොදා ගැනීමයි.**

---

## අපේ අගයන්

අපගේ වටිනාකම් අපගේ සංවිධානයේ සංස්කෘතිය පෝෂණය කරන අතර අපගේ සේවකයින්ගේ ආකල්ප හා හැසිරීම හැඩගන්වයි. එහෙයින්, අපගේ වටිනාකම් පැහැදිලිව සියලු සේවකයින්ට පැහැදිලිව සන්නිවේදනය කළ යුතු අතර, තීරණ ගැනීමේදී, දෛනික මෙහෙයුම් සහ බාහිර පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීමේදී, ක්‍රමෝපායයන් සකස් කිරීමේදී සිහි තබා ගත යුතු බව අප සලකන්නෙමු.

- **ගනුදෙනු වලදී හැමවිටම අවංකව කටයුතු කිරීම.**
- **නම්‍යශීලීත්වය හා වෙළඳපොළ වෙනස්කම් වලට මුහුණ දිය හැකි බව.**
- **මිත්‍රශීලීව සහ උපකාරශීලීව හැමවිටම කටයුතු කිරීම.**
- **හැකියාවන්, දැනුම සහ අත්දැකීම් වර්ධනය කරගනිමින් අපේ දැක්ම වෙත ළඟා වීම.**

# අපේ කතාව/ගමන්මග

## 1997

1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන සහ මූල්‍ය ආයතන පනත පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් නිවාස ඉදිකිරීමට මූල්‍ය සේවාවන් සැපයීමට බලය ඇති සහ මහජන තැන්පතු ලබාගත හැකි රාජ්‍ය සංස්ථාවක් බිහිවීම.

## 2000

1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන සහ මූල්‍ය ආයතන පනත ගැසට් කිරීම හා ඉන් නීත්‍යානුකූලව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථාව (HDFC) බිහිවීම.



ජාතික නිවාස කෙටුම්පත යටතේ ඒකාබද්ධිත ඉදිකිරීම් සංවිධානයක් ලෙස ලියාපදිංචි වීම.

## 1984

1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන සහ මූල්‍ය ආයතන පනත සංශෝධනය කරමින් විශේෂිත බැංකුවක් ගොඩනැගීම. එමෙන්ම, එහි නම "ශ්‍රී ලංකා නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව" ලෙස යෙදීම. (මෙතැන් පටන් "ශ්‍රී ලංකා HDFC බැංකුව" ලෙස හැඳින්වේ)

## 2003

# 2011

HDFC පනත තවදුරටත් සංශෝධනය වීම සහ වඩාත් පුළුල්ව ව්‍යාපාර කටයුතු කිරීමට හැකි පරිදි 1998 අංක 30 දරන බැංකු පනතෙහි IV වන උපලේඛනයේ සඳහන් ආකාරයට ඉඩ ලැබීම.



කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමෙන් පෞද්ගලික අංශයේ ආයෝජන බැංකුව වෙත ලබාගත හැකි වීම.

# 2005

නිෂ්පාදිත සහ වෙළඳපොළ විවිධාංගීකරණය ආරම්භ කිරීම.

# 2012

# අපගේ ව්‍යාපාර ආකෘතිය

HDFC ව්‍යාපාර ආකෘතියට මෑතක දී සිදු කරන ලද වඩාත් සුවිශේෂී විපර්යාසය වූයේ අයන්ත්‍රික (manual) ව්‍යාපාර ක්‍රියාවලියක සිට ඩිජිටල් තාක්ෂණය මත පදනම් වන ව්‍යාපාරයක් බවට සිදු කෙරෙමින් පවතින පරිවර්තනය යි. HDFC විසින් එහි මෙහෙයුම් පැතිකඩන් විස්මය දනවන ලෙස වෙනස් කිරීමට තම ව්‍යාපාර ක්‍රියාවලි ඔස්සේ නූතන තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඒකාබද්ධ කරමින් සිටී.බැංකුව විසින් නව, නූතන, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ නිෂ්පාදිත සහ සේවා හඳුන්වා දෙනු ලැබීම HDFC හි මෙහෙයුම් ආකෘතිය නවීකරණය කිරීමට ඇතුළත් වනු ඇත.

නිවාස උකස් ණය යටතේ 73%ක සමස්ත ණය දීමි, EPF මත පදනම් වූ නිවාස ණය සහ වෙනත් නිවාස ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ණය සමඟ 2019 වර්ෂයේ දී HDFC බැංකුව ප්‍රාථමික වශයෙන් නිවාස මූල්‍යන බැංකුවක් ලෙස රඳා පැවතුණි.බාහිර කම්පනවලට ඉතා ශක්තිමත් ලෙස ඔරොත්තු දීමට දායක වී ඇති ආයතනික ණය දීම්, කුඩා සහ මධ්‍ය පරිමාණ ණය දීම්, රන් ණය සහ කල්බදු ඇතුළු වෙනත් මූල්‍ය වෙළෙඳපොළවල් හි ප්‍රමුඛත්වය ගෙන ඉදිරියට යාමට බැංකුව අඛණ්ඩව ක්‍රියා

**දැක්ම**

"ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන මූල්‍ය අංශයේ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම"

**මෙහෙවර**

අපගේ හවුල්කරුවන්ගේ, පාරිභෝගිකයන්ගේ, කාර්ය මණ්ඩලයේ, ජාතික ආර්ථිකයේ, නියාමකයන්ගේ සහ ස්වභාවික පරිසරයේ සුබසිද්ධිය අරමුණු කරගෙන අපි අපේ මෙහෙවර පුළුල්ව ගොඩ නගා ඇත්තෙමු.

**අගයන්**

අපගේ වටිනාකම් අපගේ සංවිධානයේ සංස්කෘතිය පෝෂණය කරන අතර අපගේ සේවකයින්ගේ ආකල්ප හා හැසිරීම හැඩගන්වයි. එහෙයින්, අපගේ වටිනාකම් පැහැදිලිව සියලු සේවකයින්ට පැහැදිලිව සන්නිවේදනය කළ යුතු අතර, තීරණ ගැනීමේදී, දෛනික මෙහෙයුම් සහ බාහිර පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීමේදී, ක්‍රමෝපායයන් සකස් කිරීමේදී සිහි තබා ගත යුතු බව අපි සලකන්නෙමු.




**ප්‍රධාන ක්‍රියාකාරකම්**

නිවාස මූල්‍යයනය
තැන්පතු
කල්බදු
උකස් කිරීම්
සංවර්ධන ණය

**පාරිභෝගික කාණ්ඩ**

පෞද්ගලික අංශයේ සේවකයන්
වෘත්තිකයන්
රාජ්‍ය සේවකයින්
විශ්‍රාමිකයන්
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
ක්ෂුද්‍ර ව්‍යවසායකයින්

**මාධ්‍යයන්**

මාර්ගගත බැංකුකරණය
පාම්ටොප් (Palmtop)
බැංකුකරුවන්
ATM යන්ත්‍ර ශාඛා

**මූලික හවුල්කරුවන්**

රාජ්‍ය නියෝජිත ආයතන

කොට ඇත. මහජන තැන්පතු ඉතුරුම් නිෂ්පාදිත පෙළක් ඔස්සේ අරමුදල් සපයා ගැනීමේ වැදගත් මූලාශ්‍රයක් ලෙස රැඳී පැවතුණි.පාරිභෝගිකයන්ගේ දොරකඩ වෙත ළඟා වීම සඳහා ඉහළ වශයෙන් සාර්ථක වූ පාම්ටොප් බැංකුකරණය (palmtop banking) ද බැංකුව විසින් ගොඩ නඟා ඇත. රට පුරා විසිරී ඇති කුඩා සහ අවිධිමත් ව්‍යාපාර ටැප් කිරීම මඟින් ශීඝ්‍ර වෙළෙඳපොළ පිවිසුමකට පාම්ටොප් නාලිකාව මඟින් හැකියාව ලබා දී ඇත. මීට අමතරව, බැංකුව දීප ව්‍යාප්ත ත ATM ජාලයේ කොටස්කරුවෙකු වන අතර, වැඩි දියුණු කරන ලද මාර්ගගත සේවා සැපයීමට අන්තර්ජාල බැංකුකරණ පහසුකම දියුණු කරමින් සිටී. 2020 වර්ෂයේ දී බැංකුව විසින් ණ්මිච්ඡ ජාලය ඔස්සේ ජංගම දුරකථනය මත පදනම් වූ ගෙවීම් යෙදවුමක් සඳහා ද ආයෝජනය කෙරෙනු ඇත.

**අප වටිනාකම ගොඩනගන ආකාරය**

අපගේ පාම්ටොප් (Palmtop) බැංකුකරුවන් ඔබගේ දිවිය පහසු කිරීම සඳහා ඔබේ දොරකඩ වෙතට ම බැංකු කටයුතු ගෙන එනු ඇත.

අපේ ඉලක්කය කාලයත් සමග පාරිභෝගික ප්‍රමාණය වැඩිවන දිගු කාලීන සබඳතා ගොඩනඟා ගැනීමයි.

අපි අපේ පාරිභෝගිකයන්ගේ මූල්‍ය සාක්ෂරතාව ගොඩ නගමින්, ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවන්ට ගැලපෙන විවිධ බැංකු නිෂ්පාදන බුද්ධිමත්ව තෝරා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන්නෙමු.

**රටට දායකත්වය**

බදු මඟින් අප ජාතික මහා භාණ්ඩාගාරයට දායක වේ.

දරිද්‍රතාවය පිටුදැකීමේ රජයේ අරමුණු සඳහා සහය වීමට අඩු පහසුකම් සහිත වෙළඳපොළවල් වෙත සංවර්ධන ණය ලබාදීම.

රටේ ඌණ සංවර්ධිත ප්‍රදේශවල මධ්‍ය හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.

අවිධිමත් ආර්ථිකය, විධිමත් බැංකු ක්ෂේත්‍රය වෙතට ගෙන ඒම.

**මූල්‍ය ප්‍රාග්ධනය**

මහජන තැන්පතු අපගේ ප්‍රධාන අරමුදල් සපයා ගැනීමේ මූලාශ්‍රය යි. ඊට අමතරව, අපට කොටස් සහ ණය ප්‍රාග්ධනය තිබේ. අපේ ආදායම ව්‍යුත්පන්න වන්නේ,

- පොලී ආදායම
- පොලී නොවන ආදායම
- ආයෝජන ආදායම්
- ගාස්තු පදනම් කරගත් ආදායම් යනාදියෙනි.

**සමාජ සහ සම්බන්ධීය ප්‍රාග්ධනය**

HDFC යනු පාරිභෝගිකයන් හොඳින් හඳුනන, විශ්වාසවන්ත වෙළඳ සන්නාමයක්ව තිබේ.

වසර ගණනාවක් පුරා ගොඩනගන ලද මෙම කීර්තිනාමය අමිල වත්කමකි.

**මානව ප්‍රාග්ධනය**

අපගේ මානව සම්පත් පදනම පුහුණු සහ අත්දැකීම් සහිත ප්‍රධාන හා අනෙකුත් ශාඛා නිලධාරීන්ගෙන් මෙන්ම වර්ධනය වෙමින් පවතින පාම්ටොප් බැංකුකරුවන්ගෙන් ද සමන්විත වේග

**බුද්ධිමය ප්‍රාග්ධනය**

මධ්‍ය සිට අවම ආර්ථික අංශ දක්වා නිවාස මූල්‍ය කටයුතු පිළිබඳ ආයතනික දැනුම අප සතුව ඇත. දැන් මෙයට නූතන තොරතුරු තාක්ෂණික පද්ධතීන්ගේ සහාය ද ලැබේ.

**පාරිසරික වගකීම**

පාරිසරික වගකීමකින් යුතුව, වගකිව හැකි ණය දීමේ ක්‍රමෝපායන් සමග අපගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම අපේ අරමුණ යි.

# නිෂ්පාදන පෙළගැස්ම

## ණය

### කැදැල්ල
ප්‍රාථමික දේපළ උකස් මත ලබා දෙන නිවාස ණය යෝජනා ක්‍රමයකි.

### ශ්‍රම උදාන
EPF සාමාජිකයන්ට EPF ශේෂය මත ලබාදෙන නිවාස ණයකිග

### ලයිෆ්ස්ටයිල් ලෝන්
නම් කළ සැපයුම්කරුවන් හරහා ගෘහ උපකරණ මිලදී ගැනීමට ලබාදෙන ණයකිග

### සිතු සෙවණ
ඔබේ ජීවන රථාවට ගැලපෙනල අගය චික් කළ නිවාස ණයකි.

### අධ්‍යාපනික ණය
උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා කැමැත්තක් දක්වන දරුවන් සඳහා වන ණය යෝජනා ක්‍රමය

### රථවාහන කල්බදු
තනිපුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා වන රථවාහන කල්බදු

### සිරිසර නිවාස ණය
වත්මන් පාරිභෝගිකයන්ට තම ජීවන තත්ත්වය උසස් කරගැනීමට නිවාස වැඩිදියුණු කිරීම සඳහා දෙන ණය.

### දිරිය සහ විරුදිරිය
අභවප්‍රාප්ත යුධ විරුවන්ගේ වරප්‍රසාදලාභීන් හට සහ රජයේ විශ්‍රාමිකයන් හට සහය ලබා දීමේ අසමසම ණය යෝජනා ක්‍රමයකි.

### ගෝල්ඩ් ලෝන්
හදිසි මූල්‍ය අවශ්‍යතාවන් සඳහා රත්‍රං වටිනාකම අනුව ලබාදෙන ණය

### ආයතනික සහ සංවර්ධන ෆිනෑන්ස්
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට හා සංස්ථාපිතයන්ට උපකාර වීමට ඇති විශේෂිත ණය යෝජනා ක්‍රමයකි.

## ඉතුරුම්

### ප්‍රතිලාභ
දිවයින පුරා පිහිටි ATM ජාලය, මාර්ගගත බැංකුකරණ පහසුකම් සහ ජංගම බැංකු සේවා වෙත පිවිසීම යනාදී විශේෂ දීමනාවන් සහිත සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමකි.

### විශ්‍රාම රැකවරණ
නම්‍යශීලී තැන්පතු විකල්පයක් සහ වෙළඳපොළ ඉහළ තැන්පතු අගයක් සහ අසමසම වාසි රැසක් සමග නිර්මිත විශ්‍රාම සැලසුමකි.

### සෙට් ෆෝ ලයිෆ්
යෞවනයන්ට අනාගතය සැලසුම් කිරීම හඳුන්වා දෙන සුවිශේෂී ධන නිර්මාණ ක්‍රමවේදයකි. සෙට් ෆෝ ලයිෆ් මගින් වෙළෙඳපොළෙහි පවතින තැන්පතු අගයට වඩා ඉහළ වෙළඳපොළ අභිබවන ලදී පොළී අගයක් ලබාදෙයි.

### අරුඹු
ප්‍රථම වරට බැංකුවකින් විශේෂයෙන්ම දෙමළ ප්‍රජාව සඳහාම නිමැවූ නිෂ්පාදනයක් වන මෙය තිළිණ රැකවරණ සතු විශේෂාංගවලට සමානව ගොඩ නගා ඇත.

### විශ්‍රාම උදාන
වෙළෙඳපොළ අගයන්ට වඩා වැඩි පොළී අගයක් ඉපයීමට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් සැකසූ ස්ථාවර තැන්පතු ක්‍රමයකි.

### තිළිණ රැකවරණ
දරුවන්ගේ අනාගත මූල්‍ය සුරක්ෂිතතාව තහවුරු කරන අසමසම ආයෝජන සැලසුමකි.

### තිළිණ
සිත්ගන්නාසුලු ත්‍යාග ක්‍රමයක් ඇති, වැඩිවන පොළී අගයක් සහිත ළමා ඉතුරුම් ගිණුමකි.

### ශ්‍රී රත්නාභිමානී
ගිණුම් හිමියා සහ පවුල විශ්‍රාම ගැනීමට පෙර හා පසුව ද ආරක්ෂා කරලීමට සැකසූ රක්ෂණය මත පදනම් වූ විශ්‍රාම සැලසුමකි.

### ස්මාර්ට් ගෝල්ස්
සාපේක්ෂව කෙටි කාලයක් තුළ තම ඉලක්ක කරා ළඟා වීමට කැමති අය වෙනුවෙන් සැකසූ ඉතුරුම් නිෂ්පාදනයකි.

# ජාල සිතියම




| | | |
|---|---|---|
| 01. කොළඹ | 14. මොණරාගල | 27. වවුනියාව |
| 02. හෝමාගම | 15. තිස්සමහාරාම | 28. හලාවත |
| 03. හොරණ | 16. රත්නපුරය | 29. කුලියාපිටිය |
| 04. හයිඩ් පිටිය | 17. අම්පාර | 30. නිකවැරටිය |
| 05. නුගේගොඩ | 18. මඩකලපුව | 31. අනුරාධපුර |
| 06. පිළියන්දල | 19. නුවරඑළිය | 32. පොළොන්නරුව |
| 07. අවිස්සාවේල්ල | 20. කළුතර | 33. ත්‍රිකුණාමලය |
| 08. ගම්පහ | 21. අම්බලන්ගොඩ | 34. දඹුල්ල |
| 09. ජාඇල | 22. ගාල්ල | 35. කෑගල්ල |
| 10. කිරිබත්ගොඩ | 23. මාතර | 36. මාතලේ |
| 11. නිට්ටඹුව | 24. තංගල්ල | 37. කුරුණෑගල |
| 12. පෑලියගොඩ | 25. ඇඹිලිපිටිය | 38. මහනුවර |
| 13. බදුල්ල | 26. යාපනය | 39. ගම්පොල |

**39**

# දිවයින පුරා සිටින

## ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය උසස්කිරීම සඳහා වූ දැක්මක් අප සතුව ඇත



**නිවාස ණය**

සුළු සහ මධ්‍යම ආදායම්ලාභීන් සඳහා පුළුල් නිවාස ණය ක්‍රම

**ශ්‍රී ලංකා HDFC බැංකුව**

වාර්ෂික වාර්තාව 2019


Mermaid Girl

# වසරෙහි කැපී පෙනෙන මූල්‍ය පරිචයන්

| | 2019<br>රු. මිලියන | 2018<br>රු. මිලියන | වෙනස<br>% |
|---|---|---|---|
| **වර්ෂය සඳහා ප්‍රතිඵලය** | | | |
| ආදායම | 8,090 | 7,120 | 14 |
| බදු ගෙවීමට පෙර ලාභය | 1,244 | 919 | 35 |
| බදු සඳහා ප්‍රතිපාදන | 769 | 354 | 117 |
| බදුවලින් පසු ලාභය | 476 | 564 | (16) |
| රජයේ ආදායම | 774 | 359 | 116 |
| **වසර අවසානය වන විට** | | | |
| කොටස් හිමියන්ගේ අරමුදල | 5,119 | 4,757 | 8 |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු | 42,504 | 37,016 | 15 |
| ගනුදෙනුකරුවන්ගේ දළ ණය සහ අත්තිකාරම් | 42,360 | 38,827 | 9 |
| මුළු වත්කම් | 55,955 | 49,285 | 14 |
| **සාමාන්‍ය කොටසක බෙදීයාම් අනුව විස්තර** | | | |
| කොටසක ඉපැයුම (මූලික) (රු.) | 7.35 | 8.72 | (16) |
| **මූල්‍ය අනුපාත** | | | |
| කොටස් හිමි අරමුදල මත සාමාන්‍ය ප්‍රතිලාභය (%) | 9.63 | 12.56 | (23) |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (%) | 0.91 | 1.14 | (20) |
| මුළු වත්කම් මත කොටස්කරුවන්ගේ හිමිකම් (%) | 9.15 | 9.65 | (5) |
| **ව්‍යවස්ථාපිත අනුපාතයන්** | | | |
| ද්‍රවශීල වත්කම් (%) | 26.07 | 20.56 | 27 |
| පොදු හිමිකම් මට්ටම- 1 ස්තරය- අවම අවශ්‍යතාවය -7.0% | 18.21% | 16.41% | |
| 1 ස්තරය (%) - අවම අවශ්‍යතාවය- 8.5%% | 19.14% | 16.41% | |
| 2 ස්තරය (%) - අවම අවශ්‍යතාවය- 12.5% | 19.14% | 16.41 % | |
| **වෙනත් විස්තර** | | | |
| ශාඛා | 39 | 39 | - |
| සේවකයන් (කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව) | 558 | 561 | (1) |
| ණය ශ්‍රේණිගත කිරීම- ෆිච්/ ලංකා රේටින්ග්ස් | BB+(lka) | BB+(lka) | |

### ආදායම

මිලියන




### ණය අත්තිකාරම් සහ තැන්පතු

මිලියන




### ලාභදායීතාවය

මිලියන




### වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) සහ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROE)

මිලියන




### සම්පූර්ණ වත්කම්

රු. මිලියන




## බදුවලට පෙර ලාභය

# 35 %

## ඉහළ යාම

# සභාපතිනියගේ පණිවිඩය

**සේවා සැපයීම සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ පහසුව සහ ඔවුන්ගේ අපේක්ෂා ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා බැංකුව අඛණ්ඩ ප්‍රයත්න දැරූ අතර, වඩාත් ගුණාත්මක වූ සේවාවන් ගනුදෙනුකරුවන්ට සැපයීම උදෙසා ශාඛා ජාලය හරහා සිය තොරතුරු තාක්ෂණ පද්ධතියට වැඩි දියුණු කිරීම් හඳුන්වාදෙන ලදී.**

හිතවත් කොටස් හිමියනි,
2020 ජනවාරි 02 වන දින HDFC බැංකුවේ සභාපතිවරයා වශයෙන් මා විසින් විධිමත් අයුරින් භාරගන්නා ලද කර්තව්‍යය වන, 2019 මූල්‍ය වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් සහ HDFC බැංකුවේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කිරීමට ලැබීම මම භාග්‍යයක් කොට සලකමි.

අප කොටස් හිමියන් දන්නා පරිදි, සමස්තයක් ලෙස ගත්කළ, 2019 වර්ෂය ශ්‍රී ලංකා ආර්ථිකයට මෙන්ම බැංකු සහ මූල්‍ය සේවා අංශය සඳහාද දුෂ්කර වර්ෂයක් විය. එහෙත්, සමාලෝචනය යටතේ පැවති මාස 12ක කාල සීමාව තුළ, රු. මිලියන 476ක දළ ලාභයක් වාර්තා කිරීම වැනි ප්‍රශංසනීය මූල්‍යමය කාර්ය සාධනයක් HDFC බැංකුව අත්පත්කරගත් බව බව මම සතුටින් ප්‍රකාශකර සිටිමි. මෙය, 2018 වර්ෂයේ ලාභය වූ රු. මිලියන 564 සිට සිදුවූ පසුබෑමක් වන අතර මෙම පසුබෑම සිදුවන්නේ බදු ගෙවීම් 117% කින් ඉහළ යාම නිසාය. බැංකුවේ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳව වඩාත් පැහැදිලි තක්සේරුවක් සඳහා ප්‍රධාන විධායක නිලධාරීගේ (CEO) සමාලෝචනය අධ්‍යයනය කරන මෙන් මම සියලු පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටිමි.

### පාලනය සහ අනුකූලතාවය

මහ බැංකුවේ නියමකිරීම්වලට අනුකූලව බැංකුවේ අවම ප්‍රාග්ධන පදනම අමතර රු.මිලියන 250කින් ඉහළ නංවාගැනීම, 2019 වර්ෂයේ උද්ගත වූ මූලික අනුකූලතා අභියෝගය විය. අතිරේක පළමු මට්ටමත් (AT1) හරහා භාණ්ඩාගාරයට නිකුත් කරන ලද අතිරේක ප්‍රාග්ධනය ලබා ගැනීම හේතුවෙන් වර්තමානය වනවිට බැංකුව රු.බිලියන 5.0 ක ප්‍රමාණවත් ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ මහ බැංකුවේ නියමකිරීම් හා අනුකූල වී ඇත. අවම නියාමකය 12.5% ක් වූ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතිකය 19.14%ක් වැනි ඉහළ අනුපාතිකයක් දක්වා වර්ධනය කරගැනීමට, 2019 දෙසැම්බර් මස අවසානයේ දී HDFC බැංකුව සමත් විය. කෙසේ වෙතත්, 2020 වර්ෂයේ අවසානය වන විට නවතම සංශෝධනය වන රුපියල් බිලියන 7.5 ක අවම නියාමන ප්‍රාග්ධනයක් සමඟ HDFC බැංකුව මුහුණ පෑවේ තවත් අභියෝගයකට ය. HDFC බැංකුවේ වර්තමාන ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතිකය අවම නියාමකය ට වඩා ඉහළ මට්ටමක පැවති නිසාම මෙම නවතම ප්‍රාග්ධන වර්ධනයට අනුගත වීම සඳහා 2022 අවසානය වන තෙක් කාලය දිගු කරන ලෙස HDFC බැංකුව මහ බැංකුවෙන් ඉල්ලීමක් කර තිබිණ. අනුකූලතා සහ අවදානම් කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම 2019 වර්ෂයේ දී ප්‍රමුඛත්වයක් ලබා තිබුණේ බැංකුවේ සමස්ත වත්කම් තත්ත්වය සහ වටිනාකමක් ලබා දීමේ ක්‍රියාවලිය වෙත යොමුවීම උදෙසාය. මේ අනුව, අතිශයින් ඵලදායී වූ ප්‍රතිඵලය ද මම සතුටින් යුතුව ඉදිරිපත් කරමි. මහ බැංකු නියමයන්ට අනුව, බැංකුව විහි සමස්ත ප්‍රතිපත්තිමය පසුබිම සමාලෝචනය කර, මානව සම්පත් ප්‍රතිපත්ති 10ක් සහිතව විහි මෙහෙයුම් ප්‍රතිපත්ති යාවත්කාලීන කර ඇත. අනාගත ඵලදායිතාවය සඳහා වර්තමාන ප්‍රතිපත්තිමය පසුබිම උපකාරීවනු ඇතැයි මම විශ්වාස කරමි. මීට අමතරව, බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතිය, විශේෂයෙන් ම අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි, දැනටමත් බොහෝ වැඩි දියුණු කිරීම් වලට ලක්ව ඇත. මේ අතරම, තොරතුරු තාක්ෂණ පද්ධතියේ වැඩිදියුණුව සඳහා සිදුකරමින් පවතින ආයෝජන මඟින් තීරණ ගැනීමේ වේගවත් කළමනාකරණය, තොරතුරු ගලනය සහ සුවිසල් ඵලදායිතාවක් ඇතිවිය හැකිය.

බැංකුවේ අභ්‍යන්තර දියුණුව සඳහා තවදුරටත් ශක්තියක් සපයන, ශ්‍රී ලංකා බැංකු සංගමයේ තිරසාර බැංකු ප්‍රතිපත්තිවලට (Sustainable Banking Principles) 2019 දී අත්සන් තබා HDFC බැංකුව විහි සාමාජිකයෙකු බවට පත් විය.

### හවුල්කරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම

ඉහත සඳහන් කරන ලද ප්‍රාග්ධන අභියෝග නිසා 2019 මූල්‍ය වර්ෂය සඳහා HDFC බැංකුවේ කොටස් හිමියන්ට ලාභාංශ අනුමත කිරීමට බැංකුවට හැකිවූයේ නැත. කෙසේවෙතත්, ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාල සීමාවේ දී එක් කොටසක මිල රු.26.00 සිට රු.32.00 දක්වා ඉහළ යාම ප්‍රශංසනීය වන අතර එය කොටස් හිමියන්ට වටිනාකමක් එකතු කර ඇත.

මීට අමතරව, 51% ක මුළු හිමිකමක් සහිතව, HDFC බැංකුවේ අත්‍යන්ත සහ ප්‍රධානතම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් බැංකුවේ මුළු බදු ගෙවීම්වලින් රු. මිලියන 770ක ප්‍රතිලාභයක් අත්කර ගන්නා ලදී. මෙය 2018 රු.මිලියන 354ක් වූ බදු ගෙවීම්වලට සාපේක්ෂව රු.මිලියන 416ක වර්ධනයකි.

සේවා සැපයීමේදී පාරිභෝගික අපේක්ෂා ඉටු කිරීමටත් ඔවුන්ට පහසුව සැලසීම උදෙසාත් බැංකුව විසින් අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. එසේම, වඩා ගුණාත්මක වූත් වේගවත් වූත් සේවාවන් සැපයීම උදෙසා ශාඛා ජාලය හරහා සිය තොරතුරු තාක්ෂණ පද්ධතියට වැඩි දියුණු කිරීම් හඳුන්වා දෙන ලදී.

HDFC බැංකුවේ වෘත්තීය සංගමය සමඟ 2018 දී ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුමේ දී එකඟ වූ පරිදි, තෙවන සහ අවසාන වැටුප් වර්ධකය 2020 ජනවාරි මාසයේ දී බැංකුව විසින් අනුමත කරන ලදී. වෘත්තීය සංගමය විසින් ඉදිරිපත් කරන ලද ගැටළු රාශියකට විසඳුම් ලබා දෙන ලදුව, වර්ෂය පුරාම සුහද සබඳතාවයක් පවත්වාගන්නා ලදී. මානව සම්පත් ප්‍රතිපත්ති සංශෝධනය ද සේවක තෘප්තිය ඇතිවීම කෙරෙහි දායක විය.



**ඉදිරියට යාමෙන් අප අපේක්ෂා කරන්නේ අඛණ්ඩ මෙහෙයුම් කටයුතු දියුණු වීම සහ වැඩිදියුණු වූ සේවක ඵලදායිතාවයයි.**

# සභාපතිනියගේ පණිවිඩය

**උපාය මාර්ග සහ සම්පත් වෙන් කිරීම.**

කෙටි කාල සීමාවේ සිට මධ්‍යම කාල සීමාව පුරාම, ගණුදෙනුකාර පදනම පුළුල් කරමින් සහ ව්‍යාපාර පරිමාව ඉහළ දමමින්, තොරතුරු තාක්ෂණය මත පදනම් වූ වර්ධන උපාය මාර්ගයක පිරිවැය ඇතුළත් වන සේ ආයෝජනය කිරීම බැංකුව විසින් අඛණ්ඩවව සිදු කරනු ලැබ ඇත. සාමාන්‍ය ණය ප්‍රමාණය කුඩාවීම නිසා ඉහළ පිරිවැය ආකෘතියක් සහිත සාපේක්ෂ වශයෙන් කුඩා සහ විශේෂිත බැංකුවක් වන නිසා, බැංකු ශාඛා පුළුල් කිරීමේ සාම්ප්‍රදායික ආදර්ශනය සමඟ සංසන්දනය කර බලන කල්හි, ව්‍යාපාරය වර්ධනය කිරීම උදෙසා ගත හැකි වඩාත්ම පිරිමැසුම්දායී පියවර වන්නේ නූතන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ විසඳුමකි.

මෙම නවීකරණ උපාය මාර්ග මත පදනම්ව, කාඩ්පත් පාදක කරගත් මූල්‍ය සේවා, ජංගම දුරකථන යෙදුවුමක් (Mobile App), වැඩිදියුණු කරන ලද අන්තර්ජාල බැංකු සේවා (online banking service) වැනි නවමු ඩිජිටල් සේවා සඳහා බැංකුව මුදල් වෙන් කරනු ඇත. ප්‍රධාන බැංකු පද්ධතිය සහ ශාඛා අතර සම්බන්ධතාවය, පාරිභෝගිකයන් වඩාත් කාර්යක්ෂමව සේවා සැපයීම උදෙසා වන පුළුල් වෙනසක් ඇතිකිරීම උදෙසා සහයවීමට වැඩිදියුණු කෙරෙනු ඇත.

කායික ශ්‍රමය යොදාගෙන සිදුකරන ව්‍යාපාර ආදර්ශනයක සිට ඩිජිටල්කරණයට ලක්වූ ආදර්ශනයක් දක්වා වැදගත් වූ වෙනසක් HDFC බැංකුව අපේක්ෂා කරන බැවින් නූතන බැංකු පද්ධතිය සහ බැංකුවේ තොරතුරු තාක්ෂණ හැකියා වැඩි දියුණු කිරීම අවශ්‍ය කරුණක් වේ. එබැවින්, මූල්‍යමය වෙන් කිරීම් වල අඛණ්ඩ ප්‍රමුඛත්වය හිමිවන්නේ පුහුණුව හා සංවර්ධනය වෙනුවෙනි.

ව්‍යාපාර විවිධාංගීකරණ ක්‍රමෝපායකට හුරුවීම නිසා නිවාස කටයුතු කෙරෙහි HDFC බැංකුවේ යොමුවීම අවම කර ඇත. වර්තමානය වන විට 73.7% ක් වන නිවාස කටයුතු හා සම්බන්ධව බැංකුව සතු මුළු ආයෝජන ප්‍රමාණය සමඟ සංසන්දනය කර බැලීමේදී 2020 වර්ෂයේ අවසානය වන විට එය 70% කින් දායක වන බව අපේක්ෂා කෙරේ. මෙම විවිධාංගීකරණ ක්‍රමෝපාය අඛණ්ඩ සිදුකිරීම මගින් වත්කම් තත්වය වැඩි දියුණු කිරීම උදෙසා සහය වන අවදානම් තක්සේරුව නැවතත් තුලනය කිරීමක් අපේක්ෂා කළ හැකිය.

පවතින විවිධාංගීකරණ උපායමාර්ග නිසාම HDFC බැංකුව සිය මෙහෙයුම් කටයුතු වල සැලකිය යුතු වෙනස්කම් සිදු කර ඇත. එබැවින්, මීට වසර ගණනාවකට පෙර නිවාස මූල්‍යමය කටයුතු සඳහා පූර්ණ අවධානයක් යොමු කිරීම උදෙසා වැඩිදියුණු කරන ලද බැංකුවේ ආයතනික දැක්ම සහ මෙහෙවර සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක අධ්‍යක්ෂ මණ්ඩලය නියැලෙමින් සිටියි.

ඉදිරියට යාමෙන් අප අපේක්ෂා කරන්නේ අඛණ්ඩ මෙහෙයුම් කටයුතු දියුණු වීම සහ වැඩිදියුණු වූ සේවක ඵලදායීතාවයයි.

HDFC බැංකුවේ සභාපති ලෙස මා පත්කිරීමත්, මා කෙරෙහි තබා ඇති විශ්වාසයත් සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට සහ මුදල් අමාත්‍යවරයාට මම ස්තුතිය පුදකරමි. HDFC බැංකුවේ නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ව පිළිගැනීමටත්, පසුගිය වසර පුරාම අනෙකුත් සාමාජිකයන් සිදුකළ කැපකිරීම් උදෙසා ස්තූතිය පළ කිරීමටත් මම මෙය අවස්ථාවක් කරගනිමි. නියාමන අධිකාරීන් විසින් සපයනු ලබන අවවාද සහ උපදෙස්, බැංකුව ශක්තිමත් කිරීම සඳහා ඉතාමත් වටිනා අතර මම ඔවුන්ට ද ස්තූතිය පළ කරමි. HDFC කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබන දායකත්වයන් සියල්ල මා පිළිගන්නා අතර 2020 වර්ෂයේ වඩත් නව්‍ය වූ, ශක්තිමත් බැංකුවත් තැනීම උදෙසා HDFC කාර්යමණ්ඩලය සමඟ කටයුතු කිරීමට මම අපේක්ෂා කරමි.

මෙයට විශ්වාසී,



**වසන්ති මංචනායක මහත්මිය**
*(සභාපතිනී)*

15/05/2020

# සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (CEO) සමාලෝචනය

**මෙම වසර එක් තුල බැංකුවේ ප්‍රගතිය වෙනුවෙන් ගන්නා ලද ප්‍රධාන මෙන්ම විශාල පියවරක් වන්නේ, දීර්ඝ කාලයක් තිස්සේ ළඟාකරගනීමට තැත් දැරූ ප්‍රාග්ධන හිමිකාරීත්වය ඉහළ නැංවීමයි. මේ හරහා බැංකුවේ ප්‍රගතියට බාධාවක්ව පැවති නියාමනයන් රුසක් ඉවත් කරමින් මූල්‍ය තත්ත්වය ශක්තිමත් කරන ලදී,**

අනාගතය සඳහා මූල්‍යමය වශයෙන් සහ මෙහෙයුම් හා සම්බන්ධයෙන් HDFC බැංකුවේ උන්නතියක් ඇති කරමින් සැලකිය යුතු ජයග්‍රහණ රැසක් අත්කර දුන් යහපත් වර්ෂයක වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටට පත් වෙමි.

මෙම වසර එක් තුල බැංකුවේ ප්‍රගතිය වෙනුවෙන් ගන්නා ලද ප්‍රධාන මෙන්ම විශාල පියවරක් වන්නේ, දීර්ඝ කාලයක් තිස්සේ ළඟාකරගනීමට තැත් දැරූ ප්‍රාග ්ධන හිමිකාරීත්වය ඉහළ නැංවීමයි. මේ හරහා බැංකුවේ ප්‍රගතියට බාධාවක්ව පැවති නියාමනයන් රුසක් ඉවත් කරමින් මූල්‍ය තත්ත්වය ශක්තිමත් කරන ලදී,

මීට අමතරව, මහ බැංකුවේ අනුකූලතා අවශ්‍යතා සඳහා අප විසින් සැලකිය යුතු සංවර්ධනයක් ද සිදු කරන ලදී. උපායමාර්ගික වශයෙන් අතිශය වැදගත් වූ මෙම කරුණු මේ වන විට සභාපතිනිය විසින් සාකච්ඡා කරනු ලැබ ඇති බැවින් වර්ෂය තුළ HDFC බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සඳහන් කිරීම සඳහා මම මාගේ ප්‍රකාශය වෙන්කරමි.

### මුදල් හා සම්බන්ධ කටයුතු

මූල්‍යමය ක්‍රියාකාරිත්වයේ දී, යම් ප්‍රමාණයක දුර්වල ඉල්ලීම් හා කොන්දේසි සහ මූල්‍ය සේවා සපයන්නන් අතර ඇති දැඩි තරඟය හැරුණු විට, ණය සටහන් පොත තැන්පතු මත පදනම්ව HDFC බැංකුව ඒකාකාර වර්ධනයක් පවත්වා ගෙන ඇත. බැංකු 30ක් පමණ සහ බැංකු නොවන මූල්‍ය ආයතන 40කට අධික ප්‍රමාණයක් දිවයිනේ පිහිටුවා තිබුණ ද HDFC බැංකුව වෙත අඛණ්ඩව පැමිණි බැංකුවේ පැරණිතම ගනුදෙනුකාර පාර්ශ්ව බැංකුව කෙරෙහි තබා ඇති විශ්වාසය සහ පිළිගැනීම මෙයින් පැහැදිලි වේ.

රු. බිලියන 37.0 සිට රු. බිලියන 41.2ක් දක්වා වර්ධනය වූ ණය වත්කම් (loan book) සමඟ බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 49.28 සිට රු.බිලියන 55.9ක් දක්වා ද වර්ධනය විය. තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා අප අපගේ ඉතිරිකිරීමේ සේවා ප්‍රවර්ධනයට අඛණ්ඩව යොමුවූ බැවින් මුළු තැන්පතු පදනම රු. බිලියන 37.0 සිට රු. බිලියන 42.5 දක්වා වර්ධනය විය.

2018 දී රු. මිලියන 918ක් වූ බදු ගෙවීමට පෙර ලාභය 2019 වර්ෂයේ දී රු. මිලියන 1, 244ක් දක්වා 35%කින් ලෙස අතිශයින් තෘප්තිමත් වියහැකි ආකාරයට වර්ධනය කරගනිමින් අපි වර්ෂය අවසාන කළෙමු. කෙසේ නමුත්, මෙකී දෙගුණ වීමට වඩා වැඩි මුදලක් බදු වශයෙන් ගෙවීම නිසා 2018 වර්ෂයේදී බදු වලින් පසු ලාභයේ පසුබෑමක් දක්නට ලැබුණි.. 2018 දී බදු වලින් පසු ලාභය (PAT) රු. මිලියන 564 සිට 2019 දී රු.මිලියන 476 දක්වා අඩු වී තිබිණ. බැංකුවේ මූල්‍ය තත්ත්වයෙහි පසුබෑම පිළිබඳව වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා කරුණාකර මූල්‍ය ප්‍රාග්ධන කොටස අධ්‍යයනය කරන්න.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතන 100 අතරින් 2019 දී LMD දර්ශකයේ මුල් ස්ථාන 100ට ඇතුළත්වීමට HDFC බැංකුවට හැකිවීම තවත් එක් ධනාත්මක සිදුවීමකි. එම ලැයිස්තුගත කිරීමට ඇතුළත් වීම මඟින් පෙනී යන්නේ HDFC බැංකුව නවීකරණයට ලක් වීමෙන් පුළුල් පිළිගැනීමකට ලක් වන බවත්, වඩා තරඟකාරී ස්වභාවයකට පත් වෙමින් සිටින බවත්ය. මීට අමතරව, එම ලැයිස්තුගත කිරීම් මඟින් බැංකු සන්නාමයේ ප්‍රතිරූපය මෙන්ම ආයතනික ප්‍රජාව අතර කැපීපෙනීම ද වර්ධනය විය හැකිය.

### අක්‍රීය ණය ප්‍රතිපාදන

වර්ෂය පුරාම ප්‍රමුඛත්වයක් ගෙන තිබුණේ බැංකුවේ වත්කම් ප්‍රමාණයේ වර්ධනයයි. මේ අනුව, බලාපොරොත්තු වූ ආකාරයටම කෙටි කාල සීමාවේ සිට මධ්‍යස්ථ කාල සීමාව දක්වා බැංකුවේ වත්කම් තත්ත්වය ශක්තිමත් කරන, නියත වූ ප්‍රගතියක් අපි ඇති කළෙමු. සත්‍ය වශයෙන්ම, සියලු නව ණය සඳහා අයකර ගැනීම් සහ ණය නිර්ණායක සම්බන්ධව අප දැඩිව අවධානය යොමු කළ බැවින් 2019 වර්ෂයේ පළමු කාර්තුව තුළ අක්‍රීය ණය අනුපාතිකයේ අවකරණයක් ළඟා කර ගැනීමට අපට හැකි විය. කෙසේ වෙතත්, අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරය සහ දේශපාලනික වියවුල් සමඟ අක්‍රිය ණයවල විශාල මිල චලනයක් අපි නැවත දුටුවෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂය අවසානයේ දී 13.40%ක තිබූ අපගේ දළ අක්‍රීය ණය අනුපාතිකය 2019 වර්ෂයේ අවසානය වනවිට 13.75% ක් දක්වා සුළු ප්‍රමාණයකින් වර්ධනය විය.

වඩාත් හොඳ වත්කම් ප්‍රමාණයක් සමඟ ඉදිරියට යාම තහවුරු කිරීම සඳහා සමස්ත ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමාලෝචනයට ලක් කර ප්‍රතිව්‍යුහගත කර ඇත. අවදානම් කළමනාකරණ අංශය අංශයේ ඍජු අධීක්ෂණය යටතේ ඇති ණය පරිපාලන අංශයේ අවසන් අනුමැතිය අවශ්‍ය වන ණය බෙදා හැරීමේ ක්‍රියාවලියක්, 2019 ජනවාරි මාසයේ දී දෙවන ස්තරයේ මධ්‍යගත අනුමැති ක්‍රියාවලියක් වෙත මාරු කරන ලදී. කඩඉම් මට්ටමේ පිහිටි රුපියල් මිලියන 2.5 ක් වූ සියලුම ණයවල පසුගිය ස්වාධීන අවදානම් තක්සේරුව රුපියල් මිලියන 1.5 ට වඩා ඉහළ අගයකට ගෙන ආවේ, අවදානම් කළමනාකාර අංශයේ මැදිහත්වීම ශක්තිමත් කරමිනි. ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරන සියලු නව ණය කටයුතු නියාමනය කිරීම, පිහිටුවන ලද ණය නිර්ණායකවලට අනුකූල වීම තහවුරු කිරීම පමණක් නොව, මාර්ගගත තොරතුරු හුවමාරුව සහ අනුමැතිය ලබාදීම වේගවත් වීම උදෙසා නව පද්ධතිය විසින් භාවිතකරනු ලබන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යි. නව පද්ධතිය යටතේ නව ණය සඳහා වූ අක්‍රීය ණය අනුපාතිකය 2018 වර්ෂයේ 10% ප්‍රමාණය හා සංසන්දනය කරන විට 2019 වර්ෂයේ දී වැයවූයේ 0.96%ක ප්‍රමාණයක් දක්වා පහත බසිමිනි.

අක්‍රීය ණය කළඹ පාලනය කිරීමේ අනෙක් පැතිකඩ වූයේ අයකර ගැනීම් යන දුෂ්කර කාර්යය යි. තොරතුරු තාක්ෂණ මත පදනම් වූ, කල් ගොස් නොගෙවූ ණය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අපි කටයුතු කරමින් සිටින්නෙමු. මෙම පද්ධතිය මඟින් HDFC ශාඛා ජාලය පුරාම විහිදී ඇති රන් ණය හා කල්බදු කළඹ ආවරණය කෙරේ. 2020 වර්ෂයේ දෙවන කාර්තුව වන විට මෙම පද්ධතිය මඟින් සියලු ණය කළඹ ආවරණය කිරීමට හැකියාවක් ලැබෙන සේ පද්ධතිය පුළුල් කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. එසේම, HDFC හරපත් (ඩෙබිට් කාඩ් පත්) හරහා ඡඩි පද්ධති මඟින් ගනුදෙනු කිරීමේ පහසුකම් සැලසීමේ කාර්යය වෙනුවෙන් HDFC බැංකුවේ ප්‍රධාන බැංකු පද්ධතිය දියුණු කෙරෙනු ඇත. මෙම නූතනීකරණ අංග මඟින් පවතින වෙළඳපළ කෙරෙහි HDFC බැංකුවේ තරඟකාරීත්වය මෙන්ම ගනුදෙනුකරුවන්ගේ පහසුව ද වැඩිදියුණු කෙරෙනු ඇත.

### Talking tech තාක්ෂණික පද්ධතිය

නූතන පද්ධති යන පදනම යටතේ තාක්ෂණික විසඳුම් හඳුන්වාදීම, අනෙකුත් මූල්‍ය සේවා සපයන්නන් සේම HDFC බැංකුව ද සිදු කරමින් සිටින ක්‍රියාවලියකි. එබැවින්, පද්ධති දියුණුව සඳහා නව දෘඩාංග (Hardware) හා මෘදුකාංග

# සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (CEO) සමාලෝචනය



**එසේම, HDFC ඩෙබිට් කාඩ් පත හරහා POS පද්ධති මගින් ගනුදෙනු කිරීමේ පහසුකම් සැලසීමේ කාර්යය වෙනුවෙන් HDFC බැංකුවේ ප්‍රධාන බැංකු පද්ධතිය දියුණු කෙරෙනු ඇත. මෙම නූතනීකරණ අංග මඟින් පවතින වෙළඳපළ කෙරෙහි HDFC බැංකුවේ තරඟකාරීත්වය මෙන්ම ගනුදෙනුකරුවන්ගේ පහසුව ද වැඩිදියුණු කෙරෙනු ඇත.**

(Software) ලබාගැනීම සඳහා ආයෝජන කිරීම අපි අඛණ්ඩව සිදු කරමින් සිටින්නෙමු. තාක්ෂණික වශයෙන් සිදුවන මෙම පරිවර්තනය, හේතුකොටගෙන අවම කඩදාසි භාවිතය, භෞතිකමය වශයෙන් බෙදා හැරීම සහ ගමන් කිරීම් අවම වී HDFC හි කාර්යයන් වඩාත් පරිසර හිතකාමී ස්වභාවයක් ගනු ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික වශයෙන් බැංකුව සතු අතිශය වැදගත් අනුවර්තනය වන්නේ නූතන SD-WAN ජාලයකට (මෘදුකාංග යෙදවුම් ඇසුරින් ක්‍රමලේඛනය කරන ලද පුළුල් ප්‍රදේශ ජාලය) සංක්‍රමණය වීමයි. 2020 වර්ෂයේ දී එක්වරක් ක්‍රියාත්මක වීමෙන් පසු මෙම SD-WAN ජාලය HDFC බැංකුවේ තාක්ෂණය මත පදනම් වූ වර්ධන උපාය මාර්ග ව්‍යුහයෙහි එහි ප්‍රධාන ආධාරකය බවට පත්වේ. මෙමඟින් HDFC බැංකුවේ ප්‍රධාන කාර්යාලය සමඟ දිවයින පුරා ඇති ශාඛා 39ම අඛණ්ඩව සම්බන්ධ කරනු ලැබේ. එය, අවශ්‍ය වූ විට Cloud තාක්ෂණය ඔස්සේ ගබඩා ධාරිතාව වර්ධනය කරගනිමින්, විශාල ප්‍රමාණයේ දත්ත හුවමාරුව සිදු කරන තථ්‍ය කාලීන පද්ධතියක් වේ. එය ආපදා ප්‍රතිසාධන පද්ධතිය (Disaster recovery system) ස්වයංක්‍රීයව මෙහෙයවමින් සෑම අවස්ථාවකම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාම තහවුරු කරයි. මෙම තාක්ෂණික ව්‍යාපෘතිය සඳහා විකිණුම්කරුවකු මේ වන විටත් තෝරාගෙන ඇත. බැංකුව සතුව දැනටමත් පවතින ණය නිකුත් කිරීමේ පද්ධතිය අලුත්වැඩියා කෙරෙනු ලැබෙමින් පවතින අතර මේ වන විට එය එක් ප්‍රදේශයක පර්යේෂණ අවධිය තුළ දියත් කරනු ලැබ ඇත. 2020 වර්ෂය වන විට, නව පද්ධතිය දිවයින පුරා පුළුල් ලෙස ව්‍යාප්ත කෙරෙනු ඇත. අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලය වෙත කඩදාසි සහ ලේඛන ගෙනයාමට පෙර කාල සීමාව තුළ භාවිත කළ හස්තීය ක්‍රියාවලියට වඩා නව පද්ධතිය වේගවත් වන අතර විනිවිද ස්වභාවයකින් යුක්ත වේ.

ජපානයේ JCB ආයතනය සහ ලංකා ක්ලියර් (Lanka Clear) ආයතනය සමඟ එක්ව අන්තර්ජාතික EMV චිප් තාක්ෂණය සහිත, HDFC හි ATM කාඩ්පත 2020 දී දියත් කරනු ලැබේ. විශේෂිත බැංකුවක් වශයෙන් ජාත්‍යන්තර ගනුදෙනු කිරීම සඳහා HDFC බැංකුවට ඩොලර් ගිණුම් පවත්වා ගැනීමට අවසර නොමැති බැවින් මෙම ගැටලුවෙන් මිදීමට ප්‍රමුඛ පෙළේ වාණිජ බැංකුවක් සමඟ අප දැනටමත් කොටස්කරුවන් බවට පත්ව ඇත.

එසේම, HDFC ඩෙබිට් කාඩ් පත හරහා POS පද්ධති මඟින් ගනුදෙනු කිරීමේ පහසුකම් සැලසීමේ කාර්යය වෙනුවෙන් HDFC බැංකුවේ ප්‍රධාන බැංකු පද්ධතිය දියුණු කෙරෙනු ඇත. මෙම නූතනීකරණ අංග මඟින් පවතින වෙළඳපළ කෙරෙහි HDFC බැංකුවේ තරඟකාරීත්වය මෙන්ම ගනුදෙනුකරුවන්ගේ පහසුව ද වැඩිදියුණු කෙරෙනු ඇත.

LankaPay හි JustPay පද්ධතිය සමඟ සම්බන්ධ වී ගෙවීම් සිදු කළ හැකි ජංගම දුරකථන යෙදවුමක් 2020 වර්ෂයේ අවසානය වන විට හඳුන්වා දීමට අපි අපේක්ෂා කරමු. JustPay මඟින් සිය පවතින හෝ ඉතිරි කිරීමේ ගිණුම්වලින් විකුණුම්කරුගේ ගිණුමට සෘජුවම රුපියල් 25,000 දක්වා සිල්ලර ගෙවීම් සිදු කිරීමට පාරිභෝගිකයාට ඉඩ සැලසේ. මෙම ජාලය අනාගතයේ දී HDFC පාරිභෝගිකයන් සඳහා, ගෙවීම් සිදුකල හැකි අතිශය තරඟකාරී වේදිකාවක් ලෙස අඛණ්ඩව වර්ධනය වීම අපේක්ෂාකල හැකිය. මණ්ඩල හා කමිටු රැස්වීම් ද මුද්‍රිත ද්‍රව්‍ය රහිතව e-meeting පද්ධතියකින් පවත්වනු ලැබේ. වාර්තා සහ අනෙකුත් ලේඛන මාර්ගගත ලෙස උඩුගත කර ඇති අතර නිරීක්ෂණය ද කළ හැකිය.

පාරිභෝගිකයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා 2019 වර්ෂයේ දී සෑම HDFC ශාඛා කාර්යාලයකටම මධ්‍යගතව සැකසුණු ඩිජිටල් වෙළඳ දැන්වීම් පුවරු පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙමඟින් බැංකුවේ සියලු ණය හා තැන්පතු අනුපාතික ප්‍රදර්ශනය කෙරෙන අතර HDFC හි වෙළඳ දැන්වීම් විකාශනය කිරීමෙන් HDFC බැංකුවේ සේවා ප්‍රවර්ධනය කිරීමට ද භාවිත කෙරේ.

## අපගේ අනාගතය හැඩගැස්වීම

පසුගිය වසර 10 දී HDFC බැංකුවේ දළ අක්‍රීය ණය සාමාන්‍යය කර්මාන්ත සාමාන්‍යයට වඩා ඉහළ අගයක් ගෙන තිබිණ. මෙය සිදුවන්නේ HDFC බැංකුවේ සේවා ලබන, මූල්‍යමය වශයෙන් වඩාත් අවදානම් සහගත සහ අඩු ආදායමක් සහිත ජනතාව සමඟ සම්බන්ධ වූ , සාමාන්‍යයෙන් විශාල බැංකු මඟින් පාලනය කෙරෙන වැඩි අවදානම් තත්ත්ව නිසාය. එසේම, HDFC බැංකුව සතුව රුපියල් 400,000ක පමණ වඩාත් කුඩා විකිණුම් ප්‍රමාණයක් (Average-ticket size) ඇති බැවින් එයට ඉහළ මිල ආකෘතියක් ඇත. බහුතරයක් වූ අඩු ආදායම්ලාභී ජනගහනයට පෙර ණය ප්‍රමාණය දරාගත නොහැකි වීමට බලපාන බැවින්, ඉහළ අවදානම් සහ පිරිවැය ගණනය කිරීම සඳහා ඉහළ පොලී අනුපාතික අයකර ගැනීමේ සරල ක්‍රියාමාර්ග භාවිත කිරීමේ හැකියාවක් බැංකුවට නොමැත. එබැවින්, වෙළඳපොළෙහි තරඟකාරී බව පවත්වා ගැනීම සඳහා HDFC බැංකුවට තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ මෙහෙයුම් හා මූල්‍යමය තිරසාරත්වය යි. මෙම නොවැළැක්විය හැකි යථාර්ථය පිළිබඳව සියලු සේවකයන්ව දැනුවත් කෙරෙන අතර සේවකයන් අභිප්‍රේරණය කිරීම උදෙසා 2018 වර්ෂයේ දී නව ක්‍රියාකාරීත්වය ඇගයීම් පද්ධතියක් හඳුන්වා දෙන ලදී.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන්ගේ බොහෝ ප්‍රධාන අංශ සඳහා වැඩි දියුණු කිරීම් මේ වන විටත් අප සාර්ථකව ආරම්භ කර ඇති අතර මා විශ්වාස කරන පරිදි, බැංකුවේ අක්‍රීය ණය, කළමනාකරණය කරගත හැකි මට්ටමකට ගෙන වීම සඳහා අප ගමන් කරන්නේ නිවැරදි මාර්ගයේ ය. මීට අමතරව, අවම ක්‍රියාකාරීත්වයක් සහිත ශාඛා පිළිබඳව අපගේ අඛණ්ඩ අවධානය යොමුකර, පිරිවැය අඩුකරමින් ඵලදායීතාවය ඉහළ මට්ටමක තබා ගනිමින් බැංකුවේ නවීකරණ මාර්ගයට බලයක් සපයන්නෙමු. මෙමඟින් අවම සේවයක් ලබා ගන්නා පාරිභෝගික අංශ වෙත මූල්‍යමය සේවා අඛණ්ඩව සපයමින්, රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට සහය වීමට බැංකුවට හැකියාවක් ලැබෙනු ඇත.

නව බදු ක්‍රමය, මූල්‍ය සේවා සඳහා ඉල්ලුම නැවත ඇති කිරීමට පමණක් නොව විශේෂයෙන් 2020 වර්ෂයේ දී නිවාස මූල්‍ය සඳහා ද වාසිදායක වනු ඇතැයි මම විශ්වාස කරමි. එබැවින්, HDFC බැංකුවේ අභ්‍යන්තර වෙනස්වීම් සමඟ සම්බන්ධ වීම මඟින් 2020 මූල්‍ය වර්ෂය සඳහා HDFC බැංකු ක්‍රියාකාරීත්වයේ අඛණ්ඩ වර්ධනයක් අප හට බලාපොරොත්තු විය හැකි ය.

## ස්තුතිය පළ කිරීම්

සුපුරුදු පරිදි, අධ්‍යක්ෂක මණ්ඩලයට, හිටපු සභාපති ආචාර්ය රජීව් මීවක්කල මහතාට සහ HDFC බැංකුවේ වර්තමාන සභාපතිනී වසන්ති මංචනායක මහත්මියට, ඔවුන් ලබාදුන් සහය වෙනුවෙන් ස්තුතිය පුදකරමි. එසේම බැංකුව වෙනස් වීමේ ක්‍රියාවලිය පිළිගැනීම වෙනුවෙන් මම HDFC කාර්ය මණ්ඩලයට සහ වෘත්තිය සංගමයට ස්තුතිය පළ කරමි. අපගේ පාරිභෝගිකයන් හා තැන්පතුකරුවන් යනු අප ප්‍රධාන ආධාරකය වන අතර ඔවුන්ගේ අඛණ්ඩ අනුග්‍රහකත්වය හා පක්ෂපාතීත්වය සම්බන්ධයෙන් මම කෘතඥ වෙමි. HDFC බැංකුවේ ස්වරූපය වෙනස් වීමේ ගමන්මඟේ දී අප තවත් අභියෝගාත්මක වර්ෂයකට ඇතුළු වන බැවින් සියලු පාර්ශවකරුවන්ගේ සහය අපේක්ෂා කරමි.

මෙයට විශ්වාසී,



**පාලිත ගමගේ**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (CEO)
15/05/2020

# ඔබ කුමන තත්ත්වයක සිටියත්,

මූල්‍යමය වශයෙන් ප්‍රවේශවීමේ දැක්මක් අප සතුව ඇත



**පුද්ගලික ණය**
ඔබගේ ජීවන අරමුණු සෑම අයුරින්ම සුරක්ෂිත කිරීම සඳහා අපි විවිධත්වයෙන් යුතු පරාසයක පිහිටි පුද්ගලික ණය පිරිනමන්නෙමු.

**ශ්‍රී ලංකා HDFC බැංකුව**
වාර්ෂික වාර්තාව 2019


Five Minute Stories

# 2019 වසරේ ප්‍රාග්ධන වෙනස්කම්

### HDFC බැංකුවේ ප්‍රාග්ධන වර්ග

බැංකුවේ වර්තමාන සහ අනාගත තිරසාරත්වය වෙනුවෙන් බැංකුවට වඩාත් වැදගත් වන ප්‍රාග්ධනයන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් හඳුනාගෙන ඇත.

ඒවා නම්,

1. මූල්‍ය ප්‍රාග්ධනය
2. බුද්ධිමය ප්‍රාග්ධනය
3. මානව ප්‍රාග්ධනය
4. සමාජ ප්‍රාග්ධනය

### නිෂ්පාදිත ප්‍රාග්ධනය

HDFC බැංකුවට සැලකිය යුතු ඉඩමක් හෝ දේපළක් නොමැත. නිෂ්පාදිත වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇති ගෘහ භාණ්ඩ හා වාහන සඳහා පමණක් සීමා වී ඇති අතර සමාලෝචනයට ලක්වන කාල සීමාව තුළ සැලකිය යුතු අන්දමින් වෙනස් වී නොමැත.

### ස්වභාවික ප්‍රාග්ධනය

කුඩා ප්‍රමාණයෙන් යුක්ත වුවත්, සේවා සපයන්නෙකු ලෙස HDFC බැංකුව සැලකිය යුතු මට්ටමින් පාරිසරික බලපෑම් කෙරෙහි හේතු වී නොමැත. නිවාස හා ව්‍යාපාර ණය හරහා බැංකුවේ මුදල් යෙදවීමෙන් සිදුවන ඉඩම් නිරවුල් කිරීම, භූගත ජල නිස්සාරණය, බල ශක්තිය, ජල පරිභෝජනය සහ දූෂණය වැනි වක්‍ර පරිසර බලපෑම් බැංකුවේ මූලික පරිසර බලපෑම් වේ. කෙසේ වෙතත්, මෙවැනි බලපෑම් ගණනය කිරීමේ ක්‍රමවේදයක් බැංකුව සතුව නොමැති අතර මෙම කරුණ පිළිබඳව වාර්තා කිරීමක් සිදුකර නොමැත. ණය අනුමත කිරීමේ දී පාරිසරික රෙගුලාසි දැඩිව ක්‍රියාත්මක කිරීම මඟින් වක්‍ර හා ඍණාත්මක පාරිසරික බලපෑම් අවම කිරීමට බැංකුව ප්‍රයත්න දරයි.

මීට අමතරව, බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සම්පත් පරිභෝජනය (ජලය, විදුලිය සහ කඩදාසි) නිරීක්ෂණය කරමින් සේවකයන් තුළ සම්පත් සුරැකීමේ මානසිකත්වයක් ගොඩනැගීමට දිරිගැන්වේ. පාරිසරික බලපෑම් තවදුරටත් අවම කිරීම සඳහා බැංකුව සිය අභ්‍යන්තර ක්‍රියාවලි ශීඝ්‍රයෙන් ඩිජිටල්කරණයට ලක්කරයි.

# මූල්‍ය සමාලෝචනය

### මෙහෙයුම් ලාභදායීතාවය

2019 මූල්‍ය වර්ෂය යනු බදුගෙවීමට පෙර ලාභය ඇසුරින් සලකා බලන විට HDFC බැංකුවට ලාභදායීතාවයක් වාර්තාකල වර්ෂයකි. 2018 වර්ෂයත් සමඟ සංසන්දනය කර බලන විට, බදුගෙවීමට පෙර ලාභයෙහි 35%ක ඉහළ යාමක ප්‍රතිඵලයක් ලබාදෙමින්, මෙහෙයුම් ලාභදායීතාවය වර්ෂය පුරාම සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. වර්ෂය සඳහා වූ මෙහෙයුම් ප්‍රතිඵල ලෙස මූල්‍යමය වර්ධනය වීම්, ණය සහ අත්තිකාරම් පුළුල් වීම දැක්විය හැකිය. මෙහෙයුම් හා සම්බන්ධ බදු ගෙවීමට පෙර ලාභය වැඩිදියුණු කිරීම සඳහා එකට එක් වූයේ, කාලීන වත්කම් සහ වගකීම් කළමනාකරණය, දැඩි පිරිවැය පාලනය සමඟ වර්ෂය පුරාම ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යන ද්‍රවශීල වත්කම් කළඹයි. 2018 දී, රු. මිලියන 919ක් වූ බැංකුවේ බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 1,244 දක්වා ළඟා විය.

කෙසේ වෙතත්, වාර්තාගත අවසන් එකතුව 15.60%ක් වන අතර එය 2018 වර්ෂයේ රු. මිලියන 564 සමඟ සසඳා බලන විට රු. මිලියන 476 දක්වා පහත බැස ඇත. මීට ප්‍රධාන හේතුව වන්නේ 2018 ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක වූ ණය නැවත ගෙවීමේ බද්ද (Debt Repayment Levy) හේතුවෙන් ගෙවීමට සිදුවූ රු. මිලියන 161ක අතිරේක බදු ය.

එබැවින්, සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) මඟින් මනිනු ලැබූ බැංකුවේ සමස්ත ලාභදායීතාවය 1.14% සිට 0.91% දක්වා පහත බැස ඇති අතර කොටස් හිමියන්ගේ හිමිකම් මත ප්‍රතිලාභ (ROE) 12.5% සිට 9.63% දක්වා පහත බැස ඇත. 2018 මූල්‍ය වර්ෂය හා සැසඳීමේ දී ණය දීම්වලට අදාළ බදු නීති වෙනස් වීමෙන් බැංකුව ද සැලකිය යුතු ලෙස ප්‍රතිලාභ ලබා ඇත.

### මෙහෙයුම් ප්‍රකාශය

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම | 4,660 | 5,472 | 6,613 | 6,679 | 7,683 |
| අඩු කළ පොලී ආදායම | (2,539) | (3,509) | (4,742) | (4,441) | (4,783) |
| ශුද්ධ පොලී ආදායම (NII) | 2,121 | 1,963 | 1,871 | 2,238 | 2,899 |
| එකතු කළ අනෙකුත් ආදායම | 265 | 454 | 365 | 441 | 407 |
| මෙහෙයුම් ආදායම | 2,804 | 2,417 | 2,236 | 2,679 | 3,307 |
| අඩු කළ මෙහෙයුම් වියදම් | 1,288 | 1,409 | 1,472 | 1,668 | 1,740 |
| අඩු කළ අලාභහානි | 89 | 160 | (57) | 92 | (323) |
| බදු ගෙවීමට පෙර ලාභය | 1,009 | 848 | 821 | 919 | 1.244 |
| සියලු බදු ගෙවීමට පසු ලාභය | 509 | 483 | 414 | 564 | 476 |
| වත්කම් මත ප්‍රතිලාභ ROA % | 1.33 | 1.10 | 0.87 | 1.14 | 0.91 |
| කොටස් හිමියන්ගේ හිමිකම මත ප්‍රතිලාභ ROE % | 16.30 | 13.46 | 10.29 | 12.56 | 9.63 |

### අගය එකතු කළ බද්දට (VAT) පෙර ලාභය , ජාතිය ගොඩනැඟීමේ බද්ද (NBT), ණය නැවත ගෙවීමේ බද්ද (DRL) සහ සංස්ථාපිත බද්ද

රු. මිලියන




### පොලී සහ පොලී නොවන ආදායම්

පසුගිය මූල්‍ය වර්ෂයේ දී රුපියල් මිලියන 7,120 ක් වූ මුළු ආදායම (පොලිය සහ වෙනත් ආදායම්) 2019 දී රුපියල් මිලියන 8,090 කට ළඟා වූ අතර එය 14% ක වර්ධනයකි. මෙම තියුණු වර්ධනය සිදුවූයේ ප්‍රධාන වශයෙන්ම පොලී ආදායම 15% කින් ඉහළ යාම නිසාය. 2018 වර්ෂයේදී පොලී ආදායම රුපියල් මිලියන 6,679 ක් වූ අතර සමාලෝචනය යටතේ පැවති කාලසීමාව තුළ එය රුපියල් මිලියන 7,683 දක්වා වර්ධනය විය. වර්ෂය තුළ ඉහළ පොලී ඉපයීමක් සහිත වූ ණය සටහන් පොත් වර්ධනය, පොලී ආදායම් වර්ධනය සඳහා සහය විය. මහ බැංකුවේ අවම නියාමනයන්ට අනුකූලව ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය සහ ද්‍රවශීල ආවරණ අනුපාතිකයට සහය වීම සඳහා පැවති මූල්‍ය ආයෝජන, ව්‍යාපාරයක සාමාන්‍ය පටිපාටියෙහි පැවති ආයෝජනවලට වඩා විශාල ප්‍රමාණයකින් වර්ෂය පුරාම පොලී ආදායම වෙත දායක විය. පවතින ණය කළඹ නැවත නැවතත් සීමාවීමත් සමඟ වර්ධනය වන පොලී පසුබිමක් යටතේ සුදුසු පොලියක් සහිතව සියලු ණය ලබාදීම්වලට මිල නියම කරන ලදී.

### ආදායම

Rs. Mn



# මූල්‍ය සමාලෝචනය

### පොලී වියදම

පොලී ආදායම 15% කින් වැඩි වුවද, ලාභදායීතාවයේ සැලකිය යුතු වර්ධනයක් පසක් කරමින් 2018 මූල්‍ය වර්ෂය හා සැසඳීමේදී පොලී වියදම 7.7% කින් පමණක් වර්ධනය වී ඇත. මෙය ශුද්ධ පොලී ආදායම් (NII) අනුපාතය 33.5% සිට 37.7% දක්වා වර්ධනය කරමින් අවසාන එකතුවට සැලකිය යුතු හිතකර බලපෑමක් ලබා දී ඇත. අඩු ප්‍රතිලාභයක් සහිත ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කර ඇති තැන්පතු සංචිතය අවප්‍රමාණය කිරීම මගින් මූල්‍ය වෙළෙඳපොළ පසුබිම තුළ පවා පොලී වියදම වඩාත් හිතකර ලෙස කළමනාකරණය කිරීමට හැකි විය. ස්ථාවර තැන්පතු කළඹෙහි (Fixed Deposit Portfolio) වැදගත් කොටසක් වන තෙමස් සහ සයමස් ස්ථාවර තැන්පතු චංචල මූල්‍ය වෙළඳපොළ තුළ වගකීම් පදනම ප්‍රතිමිල කිරීම සඳහා සැලකිය යුතු පීඩනයක් එල්ල කරයි.

### පොලී වියදම

රු. මිලියන




### මෙහෙයුම් වියදම

පසුගිය වසර තුල රුපියල් මිලියන 1,668 සිට රුපියල් මිලියන 1,740 දක්වා මෙහෙයුම් වියදම 4.3% කින් වර්ධනය විය. මෙහෙයුම් පිරිවැයෙන් 67% ක් නියෝජනය කරන වර්ෂයේ කාර්ය මණ්ඩල පිරිවැය රුපියල් මිලියන 1,113 සිට රුපියල් මිලියන 1,164 දක්වා ඉහළ යාම සඳහා මූලික හේතුව වූ උසස්වීම් සහ 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වූ සාමූහික ගිවිසුම හේතුවෙන් වැටුප් ඉහළ යාම හිසා වර්ෂය තුළ කාර්යමණ්ඩල පිරිවැය 4.5% කින් ඉහළ ගොස් ඇත.

### මෙහෙයුම් වියදම

රු. මිලියන




### හාණිකරණය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක - 09) භාවිතය

ණය සහ අත්තිකාරම් හා ලැබිය යුතු අනෙකුත් ආදායම් සඳහා වූ හානිකරන ප්‍රතිපාදන වෙන්කිරීම් රුපියල් මිලියන 92.7 සිට රුපියල් මිලියන 322.8 දක්වා වර්ධනයක් වාර්තා කර ඇත. හිඟතාවයන් සඳහා මෙන්ම බලාපොරොත්තු වූ හිඟතාවයන් වෙනුවෙන් 2018 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS 9) මඟින් නියම කරන ලද අක්‍රමිකතා ආකෘතිය බැංකුව පූර්ණ වශයෙන් අනුගමනය කර ඇත. ඒ අනුව, 2018 සහ 2019 වර්ෂ සඳහා වූ හානිකර ප්‍රතිපාදනයන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9 ට අනුව ගණනය කර ඇති අතර අනුගමනය කරන ලද ප්‍රතිපත්ති සහ උපකල්පන ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ විස්තර කර ඇත.

### වත්කම් වල වර්ධනය.

බැංකුව සතු පූර්ණ වත්කම් වල අගය 2018 වර්ෂයේදී රුපියල් මිලියන 49,285 සිට රුපියල් මිලියන 55,954 දක්වා වර්ධනය වී ඇත. වසරක් පාසා සිදුවන වර්ධනයේදී, ණය, අත්තිකාරම් සහ ලැබීම් යන ප්‍රධාන ව්‍යාපාරයෙන් දක්වන ලද 8.6% වර්ධනයේ සහය මගින් බැංකුවේ මුලු වත්කම් ප්‍රමාණය 13.53% කින් වර්ධනය වී ඇත.

### වත්කම් හා වගකීම්

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| ණය සහ අත්තිකාරම් | 26,685 | 30,259 | 34,970 | 37,949 | 41,215 |
| ද්‍රවශීල වත්කම් සහ ආයෝජන | 13,896 | 13,142 | 13,142 | 9,606 | 12,861 |
| දේපළ පිරියත සහ, උපකරණ සහ ROUA | 435 | 478 | 513 | 466 | 731 |
| වෙනත් වත්කම් | 898 | 1,080 | 1,101 | 1,264 | 1,146 |
| මුළු වත්කම් | 41,913 | 45,678 | 49,724 | 49.285 | 55,954 |
| | | | | | |
| පාරිභෝගික තැන්පතු | 28,592 | 32,122 | 36,654 | 37.016 | 42,504 |
| ණය ගැනීම් | 9,037 | 8,862 | 7,917 | 6.653 | 6,600 |
| වෙනත් වගකීම් | 920 | 872 | 920 | 863 | 1,731 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | 3364 | 3,821 | 4,232 | 4.756 | 5,119 |
| මුළු වගකීම් | 41,913 | 45,678 | 49,724 | 49.285 | 55,954 |

### මුළු වත්කම් වර්ධනය

රු. මිලියන




### ණය සහ අත්තිකාරම්

HDFC හි ණය වත්කම් (loan book) 2015 දී තිබූ රුපියල් මිලියන 37,949 සිට 2019 දී රුපියල් මිලියන 41,216 දක්වා වර්ධනය විය. 2019 දෙසැම්බර් 31 වන දින වන විට ප්‍රධාන වශයෙන් (80% කට වඩා ඉහළින්) නිවාස ණය මත පදනම් විය. 2019 දී, ලීසිං, ක්ෂුද්‍ර මූල්‍ය ණය, ආයතනික හා ව්‍යාපාරය ණය විශාල වශයෙන් ණය කළඹෙහි වර්ධනය සඳහා දායක වී තිබේ. ණය වත්කම් විවිධාකාරයෙන්, සමානව දිවයින පුරාම විසිරී තිබේ. ණය වත්කම් වලින් 38% කට වඩා වැඩි ප්‍රමාණයක් නේවාසික උකස් ණය වලින් ද, 24% ක් සේවක අර්ථසාධක අරමුදල් (EPF) ශේෂයෙන් ද, 20% කට ආසන්න ප්‍රමාණයක් පුද්ගලික සහ ආයතනික ඇපකරුවන්ගෙන්ද, සුරක්ෂිත වී ඇත.

### ණය සහ අත්තිකාරම්

රු. මිලියන




### ණය වත්කම් සමාන්තර ලෙස බෙදී යාම

| | 2019 | 2018 |
|---|---|---|
| නිවාස ණය - උකස් | 15,640 | 15,014 |
| නිවාස ණය - සේවක අර්ථසාධක අරමුදල (EPF) මත පදනම් වූ | 10,064 | 8,441 |
| නිවාස ණය - ඇපකරු. | 8,067 | 6,691 |
| රන් ණය | 271 | 259 |
| ව්‍යාපාර - ලැබීම්වලට වඩා උකස් හා සුරැකුම්. | 1,704 | 2,040 |
| ලීසිං | 1,284 | 1,092 |
| කුලී සින්නක්කර | 6 | 16 |
| කාර්ය මණ්ඩල ණය - වැටුප් වලට වඩා උකස් හා සුරැකුම් | 1,576 | 2,236 |
| උපකරණ | 1,662 | 1,470 |
| පොලිය සහ වෙනත් ලැබීම් | 2,085 | 1,568 |
| මුළු ප්‍රමාණය | 42,359 | 38,826 |

### ආයෝජන කළඹ

වාර්තාගත මූල්‍ය කාර්ය සාධනයට උපාය මාර්ගික ආයෝජන මගින් තවදුරටත් සහය ලැබිණ. ව්‍යවස්ථාපිත වත්කම් අනුපාතිකය (SLAR) සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතයිකය (LCR), අනිවාර්ය ද්‍රවශීල වත්කම් කළඹට වඩා පවත්වා ගැනීම උදෙසාත් වෙනත් බැංකු, රජයේ බැඳුම්කර සහ වාණිජ පත්‍ර ආයෝජනය කිරීමෙන් එහි ආයෝජන කළඹ විවිධත්වයෙන් යුතු වීමටත් බැංකුව විසින් උපාය මාර්ගික තීරණ ගන්නා ලදී.

# මූල්‍ය සමාලෝචනය

**ආයෝජන කළඹ රු. බිලියන**

| | 2019 | 2018 |
|---|---|---|
| බැංකු සමඟ ස්ථාපනය වීම | 7,540 | 5,396 |
| මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ | 4,880 | 3,981 |
| මූල්‍ය වත්කම් - සාධාරණ අගයක දී මනිනු ලැබේ. | 19 | 19 |
| මුදල් සහ මුදල් සමාන වත්කම් | 421 | 210 |
| | 12,861 | 9,606 |

පෙර කාල සීමාවේ සිට ම දිගු කාලීන ණය ලබා දීම සහ කෙටිකාලීන වගකීම් අතර නොගැලපීමක් නිසා HDFC බැංකුවට බාධාවීම් ඇතිව තිබේ. කෙටිකාලීන වත්කම් වැඩි කිරීමත්, වත්කම් හා වගකීම් කල්පිරුම් පරතරය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවයත් අවබෝධ කරගෙන සමාලෝචනය යටතේ ඇති කාල සීමාව තුළ අපි විචක්ෂණශීලී ලෙස කෙටි කාලීන ආයෝජන කඩිනම් කළෙමු.

### තැන්පතු ජංගමකරණය

බැංකුවේ තැන්පතු පදනම රුපියල් මිලියන 37,016 සිට රුපියල් මිලියන 42,504 දක්වා වර්ෂය තුළ ඉහළ ගොස් ඇති අතර එහි ස්ථාවර තැන්පතු ආකර්ෂණය කර ගැනීම කෙරෙහි නැඹුරුතාවයත් සමග 15 % ක ශක්තිමත් වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරයි. 2018 වර්ෂයේ මුළු තැන්පතු වලින් 15.57% ක් පෙන්නුම් කළ ඉතුරුම් තැන්පතු 2019 වර්ෂයේ දී 15.46% ක් දක්වා පහත බැස ඇත. කෙසේ වෙතත් වර්ෂය තුළදී ඉතුරුම් පදනම රුපියල් මිලියන 5,764 සිට රුපියල් මිලියන 6,572 දක්වා 14% කින් වර්ධනය වී ඇත. HDFC ජංගම බැංකු මෙහෙයුම්වලින් ඉතුරුම් ජංගමකරණය සඳහා විශාල දායකත්වයක් ලැබී ඇති අතර අඩු හා මධ්‍යම ආදායම් ලබන්නන් ඉලක්ක කරගනිමින් අඩුවියදම් පිරිවැයක් අත්පත් කර ගැනීමට සමත් විය.

**තැන්පතු වර්ධනය**




### ණය ගැනීම සහ ආයතනික ණයකර

HDFC බැංකුව විසින් 2013 දී සාර්ථක ණයකරයක් සහ තවත් රුපියල් මිලියන 4,000 ක ණයකරයක් 2015 දී නිකුත් කරන ලදී. 2013 දී නිකුත් කළ ණයකර රුපියල් මිලියන 2000 ක් 2016, 2017 වර්ෂවලදී නියමිත දිනවල ගෙවා නිම කළ අතර තවත් රුපියල් මිලියන 1,080 ක් 2018 වර්ෂයේදී පියවන ලදී. ශේෂයෙන් රුපියල් මිලියන 2,591 ක ණයකර 2020 වර්ෂයේ දී ගෙවීමට නියමිතය.

### කොටසක් සඳහා වන ඉපයීම්

කොටස් හිමියන්ට වටිනාකමක් නිර්මාණය කිරීමට අපගේ ඉහළම ප්‍රමුඛතාවය හිමි වූ අතර සමාලෝචනය යටතේ පැවති කාල කාලසීමාව තුළ කොටස් හිමියන්ගේ අරමුදල් 7.6% කින් වර්ධනය විය. 2019 වර්ෂයේ දී එක් කොටසකට ඇති දළ වත්කම් වටිනාකම රුපියල් 73.51 සිට රුපියල් 79.11 දක්වා ඉහළ යමින් 7.6% ක වර්ධනයක් පෙන්වීය. කෙසේ වෙතත්, 2018 වර්ෂයත් සමඟ සසඳා බලන විට ණය ආපසු ගෙවීමේ බදු (DRL) සහ සංස්ථාපිත බද්ද නිසා වර්ධනය වූ බදු වගකීම් හේතුවෙන් වර්ෂය තුළ කොටසකට ඇති ඉපයීම් රුපියල් 8.72 සිට රුපියල් 7.35 දක්වා පහළ බැස ඇති බව පෙනේ. ණය ආපසු ගෙවීමේ බද්ද (DRL) 2018 ඔක්තෝබර් මස ආරම්භයේ සිට ගෙවිය යුතු විය. මීට අමතරව, ලීසිං සඳහා බදු ප්‍රතිලාභ නොමැති වීමෙන් සංස්ථාපිත බදු ද ඉහළ යන ලදී.

**එක් කොටසක් සඳහා වූ ඉපයීම්**




### ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය

පළමු ස්තරයට (Tier 1) අදාළ වන ප්‍රාග්ධන අනුපාතය සහ සමස්ත ප්‍රාග්ධන අනුපාතය 18.24% ක සහ 19.14% ක අවම අවශ්‍යතාවයෙන් ඉහළ පවතින අතර එය නියාමක අවම අවශ්‍යතාවයන් හා සසඳන කල 7.00%, 8.50% සහ 12.50% වේ. මූල්‍ය අංශයේ සංස්ථාපනය සඳහා වූ ප්‍රධාන සැලැස්ම අනුව 2014 ජනවාරි 17 දින නිකුත් කරන ලද මහ බැංකුවේ (CBSL) නියෝග අංක 02/17/402/0073/002 අනුව HDFC බැංකුව 2016 ජනවාරි 1 වන දිනට රුපියල් මිලියන 5,000 ක මූල ප්‍රාග්ධන ශේෂයක් පවත්වාගෙන යා යුතු විය. කෙසේ වෙතත්, බැංකුවේ ඉල්ලීම පරිදි අවම ප්‍රාග්ධනය සම්පූර්ණය කිරීම සඳහා කාලය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලසුමක් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලය

දීර්ඝ කරන ලදී. ඒ අනුව, 2017 ජනවාරි 01 වන දින වන විට රුපියල් මිලියන 4,000 ක ද, 2018 ජනවාරි 01 වන දින විට රුපියල් මිලියන 5,000 ක ද, ප්‍රාග්ධනයක් බැංකුව සතුව තිබිය යුතු විය. බැංකුවේ ඉල්ලීම් පරිදි රුපියල් මිලියන 5,000 පූර්ණ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 ජුනි 30 දින දක්වා කාලය තවත් දීර්ඝ කරන ලදී.අතිරේක මට්ටම (AT1) බැඳුම්කරයක් හරහා භාණ්ඩාගාරයට නිකුත් කරන ලද අතිරේක ප්‍රාග්ධනය 2019 වර්ෂයේ දී ළඟාකර ගැනීම නිසා, මේ වන විට බැංකුව රුපියල් බිලියන 5.0 ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවයකින් අනුකූල වී ඇත.

### ද්‍රවශීලතාවය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති විචක්ෂණශීලී සීමා සහ අපහසු කාලවල දී ප්‍රමාණාත්මකභාවය හඳුනා ගැනීම සඳහා වන ආන්තික සීමාවන්ට අනුකූලව, වත්කම් හා වගකීම් කමිටුව විසින් බැංකුවල ද්‍රවශීලතාවය මනිනු ලැබේ. අවම අවශ්‍යතාවය 20% ක් වුවද, වර්ෂය පුරාම 23% කට වඩා ඉහළ මනාවූ ව්‍යවස්ථාපිත වත්කම් අනුපාතයක් (SLAR) බැංකුව විසින් පවත්වාගෙන යන ලදී.

නියමිත අගයට වඩා ඉහළ මට්ටමක පිහිටි ද්‍රවශීල මට්ටමක් වශයෙන් අනෙකුත් බැංකු ආයතනවලින් අනුමත නොකළ ණය සීමාවක් පවත්වාගෙන යයි.

### වත්කම්වල ගුණාත්මකභාවය

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) උපදෙස් වලට අනුකූලව අක්‍රීය ණය (NPL) වර්ගීකරණය කිරීමේ පදනම 2019 සැප්තැම්බර් මාසයේ දී සංශෝධනය කරන ලදී. විය, වාර්තාගත මට්ටමට වඩා අක්‍රිය ණය අනුපාතිකයේ 3% ක පමණ පහත බැසීමකට හේතු විය. කෙසේ වෙතත්, අවශ්‍ය මට්ටමකට රැගෙන ඒම උදෙසා අක්‍රීය ණය කළඹ කළමනාකරණය කිරීමට අතිරේක ප්‍රයත්න අඛණ්ඩව දරණ ලදී. 2019/12/31 වන දිනට බැංකුවේ සමස්ත අක්‍රීය ණය ප්‍රමාණය 25.26% කි. වාර්ෂික පදනම මත මහ බැංකුවෙන් අයකරගනු ලබන EPF ශේෂ සහ ණය කළඹෙහි ඉහළ නොගෙවූ මට්ටම නිසා ඉහළ අක්‍රීය ණය හටගනියි.

EPF සමඟ නිවාස ණය සහිත නොවූවද ඉහළ ප්‍රමාණයක් ගත් HDFC බැංකුවේ අක්‍රීය ණය අනුපාතිකය, ඉහළ මට්ටමක පැවති අතර එය අඩු හා මධ්‍යම ආදායම් නිවාස ණය වෙළඳපොළ වෙත බැංකුවේ ප්‍රධාන අවධානය යොමු වී ඇති බව පෙන්වයි. බැංකුවේ කළමනාකාරිත්වය අක්‍රීය ණය අඩු කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කරන අතර අක්‍රීය ණය ප්‍රතිපාදන තනි දෙපාර්තමේන්තුවක නොතබා, බෙදාහරින ලදී.

# මානව ප්‍රාග්ධනය



### කම්කරු නීති සමඟ අනුගත වීම

බැංකුව කම්කරු නීතියට අනුකූල නොවීමක්, පමා වීමක් ආදී කිසිදු දඩයකයට හෝ දඬුවමකට මුහුණ දී නැතඟ EPF, ETF සහ පාරිතෝෂික ගෙවීම් ආදී සියලු ආයතනික සේවක ගෙවීම් බැංකුව විසින් නියමිත කාලයේ දී ගෙවා අවසන් කර ඇත.

### HDFC බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්ති

2019 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදුව මානව සම්පත් ආශ්‍රිත ප්‍රතිපත්ති 10ක් යාවත්කාලීන කරන ලදී.

1. බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය
2. පාරිතෝෂිත ප්‍රතිපත්තිය
3. දූෂණ වංචා පැමිණිලි කිරීම් හා සම්බන්ධ ප්‍රතිපත්තිය
4. භෞතික ආරක්ෂාව හා සම්බන්ධ ප්‍රතිපත්තිය
5. පුහුණු ප්‍රතිපත්තිය
6. ස්ථාන මාරු ප්‍රතිපත්තිය
7. දුක්ගැනවිලි හා සම්බන්ධ ප්‍රතිපත්තිය
8. උසස් වීම් ප්‍රතිපත්තිය
9. අනුප්‍රාප්තික සැලසුම් ප්‍රතිපත්තිය
10. කොන්ත්‍රාත් පදනම් හා සම්බන්ධ ප්‍රතිපත්තිය

### අනුප්‍රාප්තික සැලසුම් ප්‍රතිපත්තිය

බැංකුවේ අනුපාතික සැලසුම යාතේ එහි මධ්‍යම කාලසීමාවේ උපායමාර්ගික සැලසුමෙහි සුමට විහිදීම සහ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව සිදු කිරීම තහවුරු කිරීම උදෙසා මීළඟ වසර 2-3 සඳහා ප්‍රධාන සේවක පිරිස් හඳුනාගෙන ඇත.

### සාමූහිකත්ව ගිවිසුම සමඟ අනුකූලතාවය

HDFC බැංකුවේ නිත්‍ය සේවකයන්ගෙන් බහුතරයක් (99.7%) (ආයතනික කළමනාකරණය ද ඇතුළත්ව) ලංකා බැංකු සේවක සංගමයේ සාමාජිකයන් ය. 2018 දෙසැම්බර් මාසයේ දී HDFC බැංකුව විසින් එම සංගමය සමඟ වසර 3 ක නව සාමූහික ගිවිසුමක් අත්සන් කරන ලදී.

2020 ජනවාරි වන විට බැංකුව එම වසර 3 සමඟ අනුකූල වී වැටුප් වර්ධක සිදුකර 2018 සාමූහික ගිවිසුම සමඟ එකඟ විය.



*EXCO of CBEU, HDFC*

### ක්‍රියාකාරී බව ඇගයීම

2019 වර්ෂයේ දී නව ඇගයුම් පද්ධතියක් හඳුන්වාදෙන ලදී. මෙය KPI මත පදනම් ව වර්ෂය මුලදී ඇරඹෙන අතර මෙම නව ඇගයුම් ක්‍රියාවලිය මඟින් අරමුණුවලට ළඟා වීම අවධාරණය කර ඇත. මෙම නව පද්ධතිය මඟින් අරමුණු පාදක කරගත් ක්‍රියාකාරීත්වයක් සඳහා සේවකයන්ට අභිප්‍රේරණය කිරීමට බලාපොරොත්තු වී ඇත.

### 2019 දී මානව ප්‍රාග්ධනයට සිදුවූ වෙනස්කම්

වැටුප් වර්ධක හා ප්‍රතිලාභ මතු කරමින් එක් සේවකයෙකුට වැය කරන වියදම ඉහළ ගොස් ඇත.

| වර්ෂය | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| මුළු සේවක සංඛ්‍යාව | 647 | 640 | 647 |
| එක් සේවකයෙකුට වියදම (රුපියල් මිලියන) | 1.45 | 1.73 | 1.81 |

**සේවක වර්ගය මත මුළු සේවකයන් අතර 2018 හා 2019 දී වෙනස**

| | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| වර්ගය | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| ස්ථිර | 299 | 224 | 309 | 230 |
| ආධුනික | 26 | 8 | 12 | 2 |
| කොන්ත්‍රාත් | 19 | 10 | 54 | 8 |
| පුහුණුවන | 53 | 1 | 31 | 1 |
| මුළු ප්‍රමාණය | 397 | 243 | 406 | 241 |

**සේවක වර්ගය හා ස්ත්‍රී පුරුෂ භාවය මත මුළු සේවකයන් අතර 2018 දී හා 2019 දී වෙනස**

| | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| වර්ගය | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| ආයතනික කළමනාකරණය | 8 | 4 | 9 | 4 |
| ප්‍රධාන/ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | 6 | 7 | 4 | 8 |
| ප්‍රාදේශීය කළමනාකරුවන් | 6 | 1 | 5 | - |
| විධායක කාර්ය මණ්ඩලය | 85 | 117 | 83 | 115 |
| විධායක නොවන කාර්ය මණ්ඩලය | 168 | 110 | 171 | 110 |
| ව්‍යාපාර ප්‍රවර්ධනය හා සම්බන්ධ සහයකයන් | 46 | 3 | 46 | 3 |
| කණිෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන සහයකයන් | 25 | - | 22 | - |
| ව්‍යාපාර ප්‍රවර්ධනය හා සම්බන්ධව පුහුණුවන්නන් | 53 | 1 | 31 | 1 |
| බැංකුව තුළ තාක්ෂණික සහාය ලබාදෙන සහයකයන් (Palmtop) | - | - | 35 | - |
| මුළු ප්‍රමාණය | 397 | 243 | 406 | 241 |

# මානව ප්‍රාග්ධනය

### සේවක ප්‍රතිලාභ

සේවක වර්ගයට අනුව ප්‍රතිලාභ වෙනස් වුව ද, HDFC සේවකයන්ට අඛණ්ඩව උසස් මට්ටමේ ප්‍රතිලාභ ලැබේ.

| ප්‍රතිලාභය | ස්ථිර | ආධුනික | කොන්ත්‍රාත් | BPT |
|---|---|---|---|---|
| වෛද්‍ය ගාස්තු ප්‍රතිශෝධනය. | √ | √ | - | - |
| නිවාස ණය | √ | - | - | - |
| ආපදා ණය | √ | - | - | - |
| ඇපකරු ණය | √ | √ | - | - |
| බයික් ලීසිං | - | - | - | √ |
| දිරි දීමනා | √ | √ | √ | √ |
| වැටුප් සහිත නිවාඩු | √ | √ | √ | - |
| යැපීම් | √ | √ | √ | √ |
| අවධානම් දීමනාව (කැෂියර් සහ පාම්ටොප් පමණි) | √ | √ | √ | √ |
| කොමිස් | - | - | - | √ |
| වාහන ණය | √ | - | - | - |
| උත්සව අත්තිකාරකම් | √ | √ | √ | - |
| දුෂ්කර දීමනා | √ | - | - | - |
| ගෞරව දීමනා | √ | - | - | - |
| යතුරු භාරකාර දීමනාව (සේප්පු යතුර) | √ | - | - | - |
| ශාඛා කළමනාකාර දීමනාව | √ | √ | - | - |
| දෙවන නිලධාරී දීමනාව. | √ | √ | - | - |

### ඍෂක බැංකුවේ ක්‍රියාකාරීත්ව සම්මාන ප්‍රදානය

2018 වර්ෂයේ දී බැංකුවේ ප්‍රමුඛතම ක්‍රියාකාරී සේවකයන් හඳුනාගැනීම සඳහා වූ HDFC බැංකුවේ ක්‍රියාකාරීත්ව සම්මාන ප්‍රදානය (2019) දිවයින පුරා පිහිටි ශාඛාවල 500කට අධික කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් කොළඹ ගලධාරී හෝටලයේ දී පැවැත්විණ. HDFC බැංකුවේ නුගේගොඩ ශාඛාව, සම්මාන උළෙලේ දී ඉහළ ප්‍රශංසාවක් ලබාගත් අතර, 2017, 2018 වර්ෂවල දී වසර 25ක සේවය සම්පූර්ණ කල සේවකයන් 57 දෙනකු බැංකුවේ ගෞරවයට පාත්‍ර විය. ඔවුන්ගේ දිගු කාලීන කැපවීම සහ සේවය වෙනුවෙන් ඔවුන් සම්මානයට පාත්‍ර විය.





# බුද්ධිමය ප්‍රාග්ධනය



HDFC බැංකුව යටතේ ඇති HDFC වෙළෙඳ සලකුණු සහ උප සන්නාමය/ වෙළඳ සලකුණ වනුයේ HDFC හි බුද්ධිමය වත්කම් ය. මීට අමතරව, බැංකුවේ පාම්ටොප් (Palmtop) නිලධාරීන් විසින් භාවිත කරනු ලබන Palmtop මෘදුකාංගය, බැංකුව විසින්ම සකසන ලදුව වැඩි දියුණු කල මෘදුකාංගයක් වන අතර, එය බැංකුවේ බුද්ධිමය දේපළට අයත් වේ.

අත්දැකීම් සහ පුහුණුව ලත් බැංකු සේවක සමූහය, බැංකුවට තරඟකාරී ප්‍රතිලාභයක් ලබා දෙමින් බුද්ධිමය වත්කම අබණ්ඩව ශක්තිමත් කරයි. එබැවින්, සේවකයන්ගේ කුසලතා සංවර්ධනයත් පුහුණුවත් වෙනුවෙන් බැංකුව විශාල වශයෙන් ආයෝජනය කරයි.

### පුහුණුව සහ සංවර්ධනය

2019 වර්ෂයේ දී සිය සේවකයන්ගේ පුහුණුව සහ ශිෂ්‍යත්ව සඳහා බැංකුව විසින් දරන ලද වියදම රු. මිලියන 7.4කි. පුහුණු වැඩසටහන්වලින් විධායක සහ වෙනත් කාර්ය මණ්ඩල සේවකයන්ගේ සහභාගීත්වය 98%ක් වූ අතර, පුහුණුව සඳහා ආයතනික කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය 100%කින් සහභාගි විය.

**2019 වර්ෂයේ දී පුහුණුව සඳහා මුළු ආයෝජනය**

| | (රු. මිලියන) |
|---|---|
| පුහුණුව සහ ශිෂ්‍යත්ව | 6,498,395 |
| විදෙස් පුහුණු වියදම් | 935,995 |
| මුළු ප්‍රමාණය | 7,434,390 |

**2019 වර්ෂයේ දී පුහුණුව ලත් සේවකයන් ප්‍රතිශතය**

| ප්‍රවර්ගය | % |
|---|---|
| ආයතනික කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | 100% |
| විධායක සහ වෙනත් කාර්ය මණ්ඩලය | 98% |

# සමාජ ප්‍රාග්ධනය



### සමාජ ප්‍රාග්ධනය

HDFC බැංකුවේ ප්‍රාථමික සමාජ ප්‍රාග්ධනය වන්නේ දශක ගණනාවක සිට පැවතෙන නොසැලෙන ගෞරවනාමය සහ කීර්තිනාමයයි. මූල්‍යමය වෙළෙඳපොළ තුළ ප්‍රසිද්ධ ක්‍රියාකාරී ආයතනයක් බවට පත් කිරීම උදෙසා සමාජ ප්‍රාග්ධනය පිහිටුවීමෙන් දායක වන්නේ බැංකුවේ ශාඛා ජාලය, වෙනත් බෙදාහැරීම් අංශ, නිෂ්පාදන සහ සේවාය. මීට අමතරව, සිය පාරිභෝගිකයන් සහ වෙනත් බාහිර පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීම සඳහා ආයතනික වශයෙන් විවිධ වූ සමාජීය කටයුතු වල නිරත වේ. ණය කළඹ සහ තැන්පතු පදනමෙහි නොසැලෙන වර්ධනය, ශ්‍රී ලංකාවේ ඉහළ තරඟකාරී මූල්‍ය සේවා වෙළඳපොළෙහි HDFC බැංකුවේ ශක්තිය විදහා දක්වන්නකි.

### HDFC බැංකුවේ ශාඛා

මුළු HDFC ශාඛා සංඛ්‍යාව 39ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත් පාරිභෝගිකයන් සමඟ තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා යොදාගන්නා ඉලෙක්ට්‍රොනික සංඥා පුවරු හඳුන්වාදීම වැනි වර්ධනය වීම් රාශියක් ශාඛා ජාලයට ඇතුළත් කෙරිණි. අම්බලන්ගොඩ ශාඛාව වඩාත් ඉඩ පහසුකම් සහිත ගොඩනැගිල්ලක නැවත පිහිටවූ අතර 2020 වර්ෂයේ දී හෝමාගම ශාඛාවද, වඩාත් හොඳ ස්ථානයක පිහිටවනු ඇත. මහනුවර, අනුරාධපුර සහ කුරුණෑගල ශාඛා භූමිවල නව ATM යන්ත්‍ර තුනක් සවි කරන ලදී.

### HDFC Palmtop බැංකු සේවාව

පුද්ගලබද්ධ හා ක්ෂණික බැංකු සේවා සැපයීම සඳහාත්, දිවයින පුරා විසිරී සිටින පාරිභෝගිකයන් විශාල ප්‍රමාණයකට පුළුල් සේවාවක් සැපයීම සඳහාත් ඍජක බැංකුවේ ජංකපවිදව බැංකු සේවා බලකායේ නිලධාරීන් ප්‍රමාණය 106ක් දක්වා ඉහළ දමන ලදී. මෙය පාරිභෝගිකයන්ට විශාල පහසුවක් වන නිසාම, පාරිභෝගිකයන්ට ග්‍රාමීය හා නාගරික වෙනස නොදැනෙන සේ සේවා සපයමින් ප්‍රගතියක් ලබා ගැනීමට HDFC palmtop බැංකු නිලධාරීන්ට හැකි වී ඇත.

2019 වර්ෂයේ දී හොඳම palmtop නිලධාරීන් තිදෙනාව බැංකු සහයක ප්‍රවර්ගය යටතේ ස්ථිර සේවකයන් ලෙස පත් කරන ලදී. 2019 වර්ෂයේදී පැවැති සම්මාන උළෙලේදී ඔවුන්ගේ පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී.

### HDFC වෙබ් අඩවිය

ඍජක බැංකුව, වඩාත් නවීන වෙබ් අඩවියක් හඳුන්වාදීමෙන් ඊ-බැංකු (e-banking) හැකියාවන් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටියි. බැංකුවේ ඩිජිටල් අංශය (Digital Platform) පුළුල් කිරීම මඟින් සමාජ ප්‍රාග්ධන පදනම ගොඩනගා ගැනීමටත්, ඩිජිටල් ගනුදෙනුවලට ඉඩ සලසමින් ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩිදියුණු කිරීමටත් බැංකුව අපේක්ෂා කරයි.

### නව සේවා

ගනුදෙනුකරුවන්ගේ මූල්‍යමය අවශ්‍යතා හඳුනාගන්නා අලෙවිකරණ තක්සේරුවක් අනුගමනය කරමින්, HDFC බැංකුව නව සේවා නිර්මාණය කරමින් අලෙවිකරණයෙහි යෙදී සිටියි. සැලැස්මකින් යුතු මූල්‍යමය විසඳුම් මඟින් ගනුදෙනුකරුවන්ට සිය වර්ධනය සහ දියුණුව ළඟා කරගැනීමට මෙම සේවා මඟින් ඉඩ සැලසේ.

### HDFC හි Smart Goals - සිය අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට අවස්ථාවක් ලබා දීම

2019 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. HDFC හි නවතම ඉතිරි කිරීමේ ගිණුම වන Smart Goals, සුවිසල් සාර්ථකත්වයක් ලබන බවට සාක්ෂ්‍ය දරයි. ගනුදෙනුකරුවන්ට සිය මධ්‍යකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා නවමු විළඹුමක් විමඟින් සපයනු ලැබීම මීට හේතුව වේ. ඉහළ පොලී අනුපාතිකය, නම්‍යශීලී බව සහ පහසුව, මෙහි ආවේණික ලක්ෂණ වේ.




මෙම Smart Goals මඟින් පාරිභෝගිකයන්ට වසර 3ක් අවසානයේ දී සිය අරමුණු ඉලක්ක කිරීමට හැකියාව ලැබේ. එම අවස්ථාවේදී, නව මෝටර් රථයක් මිලදී ගැනීම, විවාහ වීම හෝ අධ්‍යාපනය සඳහා දුවා දරුවන් විදෙස්ගත කිරීම වැනි අපේක්ෂාවන් සපුරාගත හැකිය.

### HDFC බැංකුව People's Insurance සමාගම සමඟ සම්බන්ධ වේ

බැංකුවේ ණය ගනුදෙනුකරුවන්ගේ උකස් දේපළ රැක ගැනීම උදෙසා ගිනි සහ ස්වභාවික රක්ෂණයක් සැපයීමට People's Insurance ආයතනය සමඟ HDFC බැංකුව ගිවිසුමකට එළඹිණ. මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලද්දේ HDFC බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී (CEO)/ සාමාන්‍යාධිකාරී වන පාලිත ගමගේ මහතා සහ People's Insurance සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී දීපාල් අඛේසේකර මහතා විසිනි.

අවබෝධතා ගිවිසුම යටතේ, උකස් දේපළවලට ඇති අවදානම ආවරණය කිරීම සඳහා People's Insurance සමාගමෙන් ගිනි උපද්‍රව ආවරණ රක්ෂණ ක්‍රියාමාර්ගයක් ලබාගැනීමට HDFC හි ණය ගනුදෙනුකරුවන්ට හැකියාවක් ලැබේ. සිය උකස් නිවාස දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා, HDFC බැංකුවේ සියලු උකස් ණය පාරිභෝගිකයන්ට මෙම ආවරණය ලබා ගත හැකිය.

මෙම ආවරණය මඟින් ගිනි හා අකුණු සැර, ගංවතුර, සුළි සුළං, භූමි කම්පා සහ සුනාමි තත්ත්ව වැනි ස්වභාවික උපද්‍රව සඳහා පාරිභෝගිකයන්ට ආරක්ෂණය ලබාදෙමින් ඔවුන්ගේ මනසට සහනයක් ලබාදෙයි. මනා වූ අභ්‍යන්තර සේවා පාරිභෝගිකයින්ට සැපයීම සඳහා බැංකුවේ අඛණ්ඩ ක්‍රියාකාරී බවෙහි ප්‍රතිඵලය වූයේ HDFC බැංකුව සහ People's Insurance සමාගම අතර ඇති වූ සබඳතාවයයි. තවද, ගිනි හෝ ස්වභාවික අනතුරු හානි හැරුණු විට, බැංකුවේ උකස් නිවාස කළඹ ද මෙමඟින් රක්ෂණය වීම තහවුරු කෙරේ.



### අලෙවිකරණය සහ වෙළෙඳ නාමය ප්‍රසිද්ධ කිරීම

සිය වර්ධන දෘශ්‍යතාවය 2019 වර්ෂයේදී මනාව පෙන්නුම් කරමින් LMD දර්ශකයේ ප්‍රධාන සමාගම් 100 අන්තර්ගත ලැයිස්තුවේ පෙනී සිටීමට HDFC බැංකුවට හැකියාව ලැබුනු අතර විමඟින් දිවයිනෙහි සංස්ථාපිත අංශය පුරා සිය HDFC වෙළඳ නාමය වර්ධනය කර ගැනීමට ද බැංකුවට හැකි විය. මීට අමතරව, ඉහළ තරඟකාරී මූල්‍ය වෙළඳපලවල සිය වෙළඳ නාමය ප්‍රසිද්ධ වීම උදෙසා ප්‍රවර්ධන කටයුතුවල නියැලීම වෙනුවෙන් HDFC බැංකුව විසින් අඛණ්ඩව ආයෝජන සිදු කරන ලදී. බැංකුවේ ප්‍රවර්ධන හා අලෙවිකරණ ගමන් මාර්ගය මඟින් බැංකුවේ ණය කළඹ සහ ඉතුරුම් ගිණුම් වල අඛණ්ඩ වර්ධනයක් ලබාගන්නා ලදී. සමාජ මාධ්‍ය වල ඩිජිටල් අලෙවිකරණ කටයුතු මඟින් ලබාගත් කොටස් වර්ෂය තුළ වර්ධනය විය.

### HDFC හි නිත්‍ය පාරිභෝගිකයන්ව ඇගයීම

දුෂ්කර වර්ෂයන් තුළ වුවද බැංකුව විශ්වාස කර එය සමඟ සිටි දිගුකාලීන පාරිභෝගිකයන් සඳහා, ඔවුන්ව ඇගයීමට, බැංකුව විසින් 2019 වර්ෂයේදී තීරණය කරන ලදුව සොඳුරු ත්‍යාගයන් ඔවුන් වෙත යවන ලදී. ගනුදෙනුකරුවන් වෙනුවෙන්ම සැකසූ මූල්‍ය සේවා සැපයීම මඟින් ගනුදෙනුකරුවන්ගේ වර්ධනය සහ දියුණුව ඇතිකරමින් දිගුකාලීන සබඳතා ගොඩනඟා ගැනීම කෙරෙහි බැංකුව විශ්වාසය තබයි.

### විශ්‍රාමික සැලසුම් සඳහා පෝස්ටර් (Poster) වැඩසටහන

විශ්‍රාම සැලසුම් ඇසුරින් අනාගතය වෙනුවෙන් ළඟාකරගත හැකි මූල්‍යමය සුරක්ෂණය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමටත් බැංකුව සතුව ඇති විශ්‍රාම සැලසුම් විධි ක්‍රම පිළිබඳව ජනයා දැනුවත් කිරීමටත් දිවයින පුරා පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කෙරිණි.

### මිහිර (Mihira) - HDFC මඟින් සංවිධානය කරන ලද ළමා දින තරඟය

2019 වර්ෂයේ ලෝක ළමා දිනය වෙනුවෙන් "මිහිර" ළමා පුවත්පත සමඟ එක්ව HDFC බැංකුව විසින් දරුවන් සඳහා විශේෂ තරඟයක් සංවිධානය කරන ලදී. මිහිර පුවත්පත මඟින් කූපනයක් සමඟ හරස්පද ප්‍රහේලිකාවක් සකසන ලද අතර ඊට පිළිතුරු එවීමෙන් වයස අවුරුදු 11ට අඩු පාඨකයන්ට ඊට සහභාගි වීමට හැකි විය. 2019 අගෝස්තු මස සිට එම හරස්පද ප්‍රහේලිකාව පුවත්පතේ පළ කරන ලදී. හරස් පද සඳහා ඉඟි ලෙස සාමාන්‍ය දැනුම ලබාදීමට අමතරව,

# සමාජ ප්‍රාග්ධනය

ප්‍රහේලිකාව සඳහා ලබා දුන් තවත් ඉඟියක් වූයේ "HDFC බැංකුවේ ළමා ඉතුරුම් ගිණුමේ නම" යි. ලේක් හවුස්හි පවත්වන ලද දිනුම් ඇදීමකින් අනතුරුව ජයග්‍රාහකයන් තිදෙනෙකු ද, සැනසිලි ත්‍යාගලාභීන් 10ක් ද, තෝරාගන්නා ලදී. අනතුරුව, බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ දී උත්සවයක් ද පවත්වා අදාළ ජයග්‍රාහකයන්ට චිම තිළිණ ලබා දෙන ලදී.





**Build Sri Lanka (2019) ප්‍රදර්ශනයට සහභාගී වීම.**

ඊළඟෂ්‍ය හි පවත්වන ලද Build Sri Lanka (2019) වැඩසටහනේ දී සිය නිවාස මූල්‍ය සේවා ඉදිරිපත් කිරීම සඳහා HDFC බැංකුවට කුටියක් හිමිවිය. පාර්ශ්වකරුවන්ගේ අනාගත දියුණුව උදෙසා HDFC හි ආයතනික හා සංවර්ධන මූල්‍ය ණය ව්‍යාපෘති හරහා චිම පාර්ශ්වකරුවන්ට මූල්‍යමය සහය සැපයීමට මෙන්ම ගොඩනැගිලි හා ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු චිම පාර්ශ්වකරුවන් මුණ ගැසීමත් මෙහි ප්‍රධාන අරමුණ විය. සිය නිවාස සේවා ප්‍රවර්ධනය කිරීමටත් බැංකුව විසින් හැකියාවක් ලබා දෙන ලද නිවාස මූල්‍ය සේවා පරාසය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමටත් බැංකුව විසින් මෙය අවස්ථාවක් කරගන්නා ලදී.







**ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් (CSR)**

**ඉෂ්ය බැංකුව ශ්‍රී ලංකා බැංකු සංගමයේ (SLBA) තිරසාර බැංකු ප්‍රතිපත්තිවලට අත්සන් තබා ඇත.**

Sustainable Sri Lankan Vision 2025 සංකල්පය මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා බැංකු සංගමය (SLBA) විසින් දියත් කරන ලද තිරසාර බැංකු ප්‍රතිපත්ති (SBP) සඳහා HDFC බැංකුව විසින් අත්සන් තබන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවිධානය තිරසාර සංවර්ධන අරමුණු 2030 (UN-SDG) න්‍යාය පත්‍රයට දායක වීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම නිවාස මූල්‍ය බැංකුව වන HDFC බැංකුව Sustainable Sri Lankan Visiඔ 2025 සංකල්පය වෙත යොමු වී ඇත. ශ්‍රී ලංකාවේ නිවාස මූල්‍ය අංශයේ ප්‍රමුඛයා බවට පත්ව සිටින HDFC බැංකුව පසුගිය වසර 35 තුළ අඩු සහ මධ්‍යම ආදායම්ලාභී පවුල්වල සමාජ ආර්ථික නැගීම සඳහා විශාල වශයෙන් දායක වී ඇත. ප්‍රතිපත්තිමය රාමුවක් සහ තිරසාර සංවර්ධන උපාය මාර්ගයක් තුළ සිය ව්‍යාපාර කටයුතු සහ මෙහෙයුම් සකසා ගත් HDFC බැංකුව සිය හැකියාව ශක්තිමත් කර ගනිමින්, පාරිසරික හා සමාජයීය අවදානම් කළමනාකරණය හා පාලනය සිදු කරමින් සිය ව්‍යාපාර උපාය මාර්ගය නැවත සකසාගෙන ඇත. HDFC හි ව්‍යාපාර උපාය මාර්ගය ගොඩනැගී ඇත්තේ එහි මූලික අගයන් මත වන අතර ඒවා ශ්‍රී ලංකා බැංකු සංගමයේ (SLBA) තිරසාර බැංකු ප්‍රතිපත්ති වලට අනුව සැකසී ඇත.

ගිවිසුම් අත්සන් කරනු ලබන්නේ රවී ද සිල්වා මහතා (ප්‍රධාන ලේකම් - SLBA) වමේ සිට තෙවැන්නා, පාලිත ගමගේ මහතා (ප්‍රධාන විධායක නිලධාරී - HDFC බැංකුව) විසිනි.



**2019 ලෝක ජනාවාස දිනයේදී සිදුකල දැනුවත් කිරීමේ වැඩසටහන**

"නවීන තාක්ෂණ ශිල්ප ක්‍රම නව ප්‍රවේශයක් කරගනිමින් අපද්‍රව්‍ය ධනයක් කරගනිමු" යන ජනාවාස දින තේමාව යටතේ 2019 ඔක්තෝබර් 07 දිනට යෙදුණු ලෝක ජනාවාස දිනයේ දී HDFC බැංකුව විසින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දී (SLBC) සජීවී රේඩියෝ වැඩසටහනක් විකාශනය කරන ලදී. මෙහි අරමුණු වූයේ මනා ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධව මහජනයාව දැනුවත් කිරීමත්, විශාල ප්‍රජාවකට පණිවිඩය ව්‍යාප්ත කිරීමත් ය.

ඒ අනුව, කොළඹ පිහිටි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දී ශ්‍රාවකයන් පිරිසක් ඉදිරියේ දී "සතෝක්ෂණය" නම් සාකච්ඡාමය වැඩසටහන පැය 2ක කාලයක් පැවැත්විණ. මහාචාර්ය අජිත් ද අල්විස් - ව්‍යාපෘති අධ්‍යක්ෂ (COSTI ආයතනය), L.S. පලංසූරිය මහතා (සභාපති - NHDA ආයතනය), මාධව වෛද්‍යරත්න මහතා ඈදඅතිරේක ලේකම් (මෙගාපොලිස්) - මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය%, පාලිත නානායක්කාර මහතා (නාගරික කොමසාරිස් - කොළඹ

මහ නගර සභාව), J.M.V. ඉන්ද්‍රරත්න මහතා (මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්), ඉන්දු වීරසූරිය මිය (ව්‍යාපෘති අධ්‍යක්ෂ - නාගරික) යන විද්වත්හු මෙම අවස්ථාවේදී අදහස් දැක්වූහ.

ඝන අපද්‍රව්‍ය කළමණාකරණ පද්ධතියක තිරසාරත්වය පිළිබඳව ජනතාවට අවබෝධ කරවීම පාදක කරගෙන නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ශ්‍රී ලංකාවේ දේශීය ආයතන වල පැවතීම සම්බන්ධව මෙම මඩුල්ල සාකච්ඡා කළ අතර, බලංගොඩ නගර සභාව මගින් දැනට පවත්වාගෙන යනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියා පටිපාටියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද, සාකච්ඡා කරන ලදී.





**HDFC** බැංකුව උතුරේ පවුල් සඳහා ගංවතුර සහනාධාර ලබාදෙයි

HDFC බැංකුව විසින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ වෙනත් අත්‍යවශ්‍ය දෑ රැගෙන ගොස් ලබා දී, ගංවතුරෙන් අවතැන් වූ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නාතන්කුඩියිරුප්පු ප්‍රදේශයේ පවුල්වලට උපකාර කරන ලදී. මෙම පුණ්‍යමය ක්‍රියාව තෙපොංගල් උත්සවයට සමගාමීව සැලසුම් කර, සංවිධානය කරන ලද්දේ බැංකුවේ සුභසාධක සංගමය හා ක්‍රීඩා සමාජයේ එකතුවෙනි.

සහල්, සීනි, ලුණු, පරිප්පු, තෙල්, අල, පිටි, සබන්, දත් බෙහෙත්, දත් බුරුසු ආදී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අඩංගු වියළි සලාක පාර්සල් ගම්මුන්ට සපයන ලදී.





**ආරක්ෂිත ස්ටිකර් ඇලවීමේ වැඩසටහන**

HDFC බැංකුව විසින් ආරක්ෂක තත්වය මත පදනම්ව, පවතින අවදානම වැළැක්වීම සඳහා මාර්ගෝපදේශනයක් ලබාදෙමින් පොදු ප්‍රවාහන මාර්ග පදනම් කරගෙන මහජනතාව දැනුවත් කිරීම සඳහා ස්ටිකර් ඇලවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ප්‍රවාහන කොමිසම සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟ එක්ව දිවයිනේ සියලු පළාත් ආවරණය කරමින් බස් රථවල ආරක්ෂිත ස්ටිකර් 75,000 ක් අලවන ලදී. මෙම ස්ටිකර් සිංහල හා දෙමළ භාෂාවෙන් ලියැවී තිබුණු අතර එහි හදිසි අවස්ථාවන්හිදී අවශ්‍ය වන දුරකතන අංක ද සඳහන් කර තිබිණ. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති තුසිත කුලරත්න මහතාට, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති උපාලි මාරසිංහ මහතාට සහ ජාතික ප්‍රවාහන කොමිසමේ සභාපති ජනක මල්ලිකාරච්චි මහතාට ස්ටිකර් තොගය නිල වශයෙන් භාර දෙන ලදී.

ගුණසිංහපුර පෞද්ගලික බස් නැවතුමේ සහ පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළේ බස් රථ වල ස්ටිකර් ඇලවීම සඳහා HDFC බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය.

# සමාජ ප්‍රාග්ධනය





## HDFC සංවර්ධන ව්‍යාපෘති

### HDFC බැංකුව කිරි නිෂ්පාදන කර්මාන්තයට සහය වීම සඳහා IESE සමඟ සම්බන්ධ වෙයි

Market Oriented Dairy (MOD) යනු ඇමරිකා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් (USDA) මූල්‍ය පෝෂණය ලද ව්‍යාපෘතියක් වන අතර අන්තර්ජාතික විධායක සේවා බලකාය (IESC) මඟින් එය ක්‍රියාත්මක විය. මෙම එධෘ ව්‍යාපෘතියේ අරමුණු වන්නේ නැවුම් කිරි නිෂ්පාදනය ඉහළ දැමීමත්, කිරි නිෂ්පාදන වටිනාකම් දාමයෙහි ගුණාත්මක බව සහ ගොවිපළවල ඵලදායිතාවය වර්ධනය කිරීමත්ය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමඟ MOD සමීපව කටයුතු කරයි.

ආදායනයන්ගේ  ගුණාත්මකතාවය වර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහය හා පුහුණුව සැපයීම, කිරි ආශ්‍රිත කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම, විකුණුම්කරුවන්ට, ගනුදෙනුකරුවන්ට සහ වෙනත් සේවා සපයන්නන්ට පහසුකම් සැලසීම, නිෂ්පාදනය සහ ඵලදායීතාවය වර්ධනය වීම උදෙසා නව තාක්ෂණ ක්‍රමවේදයන් නොමිලේ ලබා ගැනීම වැනි කාර්යයන් රැසක් MOD ව්‍යාපෘතිය මඟින් සැපයේ.

2014 වර්ෂයේ දී HDFC බැංකුව විසින් මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) සඳහා සහභාගිත්ව, මූල්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහා බැංකුව (CBSL) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. එබැවින්, මහා පරිමාණ කිරිගොවීන් අතර මෙම ණය යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව සක්‍රීය ලෙස යෙදී සිටියි.

අවබෝධතා ගිවිසුම් මඟින් බැංකුවේ ව්‍යාපාර සහ සංවර්ධන ණය කළඹ ශක්තිමත් වන අතර දැනට දුර්වල තත්ත්වයේ පවතින ව්‍යාපෘති නගාසිටුවීම සහ දැනට සිටින කිරි ගොවීන්ගේ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ඔවුන්ට තාක්ෂණික සහාය ලබාදීම සිදුවේ.



බැංකුව වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරී (CEO)/ සාමාන්‍යාධිකාරී, පාලිත ගමගේ මහතා, ණය අංශයේ ප්‍රධානී මංජුල දිසානායක මහතා සහ සංස්ථාපිත සහ මූල්‍ය සංවර්ධන අංශයේ කළමනාකරු අනුර දිසානායක මහතා ද, IESC වෙනුවෙන් එහි ව්‍යාපෘති අධ්‍යක්ෂ මැතිව් කෘෘස් මහතා ද, එම ආයතනයේ ම චැඩ් හෙන්ර් ෆෝඩ් මහතා ද, මෙම ගිවිසුමට අත්සන් කළහ.

# අවදානම් කළමනාකරණ වාර්තාව

**"පාර්ශ්වකරුවන් සමඟ ඇති බැඳීම ළඟාකර ගැනීම සඳහා අවදානම තක්සේරු කිරීමේ ඵලදායී පාලන ක්‍රම ඇති කරමින් මනා වූ සංස්ථාපිත පාලන ක්‍රියාමාර්ග කෙරෙහි අපි විශ්වාසය තබන්නෙමු"**

### සමස්තය

**මූල්‍ය වෙළඳපළ වල ස්වභාවය බව නිසාම වර්තමානයේ දී අවදානම් කළමනාකරණය ඇත්තේ දැඩි රෙගුලාසි අධීක්ෂණයක් යටතේය. නොවැළැක්විය හැකි අස්ථාවර ස්වභාවයක් ව්‍යාපාරවල පවතින නිසා එය ග්‍රහණය කර ගැනීමට අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්ව ඇති අවදානම් කළමනාකරණය, සංස්ථාපිත පාලනයේ ප්‍රධාන කොටසකි.**

බලපත්‍රලාභී, විශේෂිත බැංකුවක් ලෙස, HDFC බැංකුව, සියළුම පාර්ශ්වකරුවන් වෙත වගවීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සඳහාම අනුගත වූ අභ්‍යන්තර සංස්කෘතියක් ගොඩනගා තිබේ. බැංකුව අවදානම් වලට මුහුණ දෙන සියලු අනුකූල අවදානම් ප්‍රවර්ග යන් හා ප්‍රාග්ධන අවදානම් කොටස් සමස්ත අවදානම් කළමනාකරණ පද්ධතියට සහාය දැක්වීම සඳහා සංශෝධනය කර තිබේ. පවත්නා සමාලෝචන හා සංශෝධනවලට අනුව, අවදානම් තක්සේරු කිරීම, ප්‍රමාණාත්මකකරණය, කළමනාකරණය කිරීම හා වාර්තාකරණය, එදිනෙදා ඇතිවන අවදානම් කළමනාකරණය සඳහා සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ ක්‍රමවේදය මඟින් තවදුරටත් ශක්තිමත් කර ඇත. මෙකී කටයුතු බැංකුවේ අවදානම් කළමනාකරණය වර්ධන මූලෝපාය සමඟ එකට බැඳී පවතින තිබෙන අතර බැංකුවේ හදවත ලෙස සලකනු ලබන ව්‍යාපාරය සහ අවදානම් කළමනාකරණය යන අරමුණු සහ වගකීම් නිසි ලෙස පෙළගස්වන ලදී. දැඩි අවදානම් හිමිකාරිත්ව සංස්කෘතිය මඟින් වගකීම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතර එය ව්‍යාපාරික තිරසාර බව සඳහා දායක වන බව අප විශ්වාස කරන්නෙමු.

### අවදානම් සංස්කෘතිය

දැඩි අවදානම් සංස්කෘතියක්, IRMF හි සාර්ථකත්වය කෙරෙහි බෙහෙවින් බලපායි. අප විශ්වාස කරන ආකාරයට බැංකුවේ දෛනික කටයුතු වෙත බලපෑම් කිරීමට ඇති විය හැකි අවදානම්

හඳුනාගෙන ඒවා ඵලදායීව කළමනාකරණය කිරීමට සහාය වන අධික්‍රියාකාරී අවදානම් වටහා කරගැනීමේ සංස්කෘතියක් මඟින් අපගේ මධ්‍ය සිට දිගු කාලීන වර්ධන ඉලක්ක තිරසාරව සපුරාගැනීමට හැකි වෙයි. ශක්තිමත් කළමනාකරණ ක්‍රියාමාර්ග මඟින් අප සේවකයන් ක්‍රියාකරන ආකාරය, සිතන ආකාරය හා අභියෝගවලට මුහුණ දෙන ආකාරය වෙනුවෙන් සියලුම මෙහෙයුම්වල අවදානම් සංස්කෘතිය තක්සේරු කිරීම සිදුවේ. පුද්ගල භූමිකා වශයෙන් සම්බන්ධ වන අවදානම් හඳුනා ගැනීම සහ විනිවිදභාවයෙන් යුතුව හඳුනාගත් අවදානම් පිළිබඳව සන්නිවේදනය සහ වාර්තා කිරීම සිදුකරන අතරතුරම සිදුවිය හැකි දැඩි අවදානම් අවස්ථා පිළිබඳව අදාළ අධිකාරීන් එවිගස ක්‍රියාත්මක වීමත් මෙමඟින් සිදුවේ.

### අවදානම් පාලන ව්‍යුහය

HDFC අවදානම් කළමනාකරණ ආකෘතිය සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් ඇති අතර එය විනිවිදභාවයෙන් යුතුව අවදානම් වාර්තා කිරීම් සහ සමස්ත අවදානම සාකච්ඡා කිරීම් පාලක මණ්ඩලය සහ එහි කමිටු අධීක්ෂණ යටතේ සිදු කරයි. බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ විධායක කණ්ඩායම ව්‍යාපාරය වෙත බලපාන බැංකුවේ අවදානම් මත දිගුකාලීන දිශාව තීරණය කරයි. අවදානම් කළමනාකරණය, ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් අවදානම් ක්‍රමෝපාය සැකසීම සහ අවදානම් කළමණාකරණ ප්‍රතිපත්තිය සැකසීමටත්, පුළුල් හා ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය සඳහා සහයෝගය ලබා දීමටත් ස්වාධීන නිරීක්ෂණයක් සපයයි. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීමෙහි අවසාන හා සාමූහික වගකීම මෙන්ම එහි කාර්යක්ෂමතාව අබණ්ඩව අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වන වගකීම ද අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇත.



# අවදානම් කළමනාකරණ වාර්තාව

### අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ සෑම අවදානමක්ම නිතර ඇගයීමට ලක් කිරීම, නිරීක්ෂණය කිරීම හා පාලනය කිරීම සෑම අවස්ථාවකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාලනය කරනු ලැබේ. මෙය ළඟා කර ගැනීම සඳහා සමෝධානිත අවදානම් කළමනාකරණය පිළිබඳ මණ්ඩල අනු කමිටුව බැංකුවේ අවදානම් හඳුනා ගැනීම,ඇගයීම, අධීක්ෂණය සහ පාලනය කිරීම සඳහා සමෝධානිත අවදානම් කළමනාකරණ රාමුව (IRMF) යොදා ගනී. IRMF හි හදවතෙහි "තෙපෙළ ආරක්ෂණ" (Three-lines-of-defence) ආකෘතිය බැංකුව පුරාම අවදානම ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය සහපීවන ක්‍රියා හා වගකීම් තහවුරු කරයි.

### HDFC හි තෙපෙළ අවදානම් කළමනාකරණය




ඉදිරිපෙළ ආරක්ෂණය මගින් අවදානම් අංශයේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් නිරීක්ෂණය හා අධීක්ෂණය කිරීම සිදුවේ.

අවදානම් අංශය බැංකුවේ සමස්ත කළමණාකරණ ක්‍රියාවලිය සඳහා අධ්‍යක්ෂක කමිටුව/ BIRMC සහ වෙනත් විධායක කමිටු මගින් ලබා දී ඇති පරාමිතීන් අනුව අවදානම් මෙහෙයුම් මට්ටම් දෛනිකව නිරීක්ෂණය හා මිනීමේ වගකීම දරයි. මෙම අංශය නිෂ්පාදන හෝ ව්‍යාපාර මූලෝපායී සංවර්ධනය සහ නව ව්‍යාපාර මාර්ගයන් වෙත පිවිසීම සඳහා මූලික සැලසුම් අවධියේ සිට ම අවදානම් කළමනාකරණ දෘෂ්ඨි කෝණයෙන් පූර්ණව දායක වේ.

වත්කම් හා වගකීම් කමිටුව, ණය කමිටුව, ආයෝජන කමිටුව, තොරතුරු තාක්ෂණ නියමු කමිටුව, ICAAP සමාලෝචන කමිටුව සහ ක්‍රමෝපායික ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමේ කමිටුව ඇතුළු කළමනාකරණ කමිටු ගණනාවක් හරහා දෙවන පෙළ ආරක්ෂක මට්ටම ක්‍රියාත්මක වේ. මෙම කමිටු වල වගකීම් හා කාර්යයන් මණ්ඩල අනුමැතිය ලත් නියාමන කොන්දේසි (TOR)මඟින් නියම කර ඇති අතර ව්‍යාපාරයන් සහ අවදානම් කළමනාකරණය අතර ප්‍රශස්ත තුලනය සඳහා එක් එක් කමිටුවේ සාමාජිකත්වය අර්ථ දක්වා ඇත.

ඉහළ මට්ටමින් ස්වාධීන අවදානම් නිරීක්ෂණය, වලංගු කිරීම, ප්‍රතිපත්ති සමාලෝචනය හා අනුකූලතාවය ක්‍රියාත්මක කිරීම මණ්ඩල සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), මණ්ඩලයේ විගණන කමිටුව සහ අදාළ පාර්ශ්වීය ගනුදෙනු කමිටුව මගින් සිදු කෙරේ.

### මණ්ඩල සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

BIRMC යනු අවදානම් කළමණාකරණ කාර්යය අධීක්ෂණය කරනු ලබන මණ්ඩලයේ අනු කමිටුවයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන ආයතනික පාලන අවශ්‍යතා ඇතුළත් අධ්‍යක්ෂක මණ්ඩල සම්මත ප්‍රඥප්තියේ වගන්ති යටතේ BIRMC කටයුතු කරයි. මෙම BIRMC මඟින් ණය අවදානම, වෙළඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම, සයිබර් ආරක්ෂණ අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඇතුළුව බැංකු පුරා වූ අවදානම් කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කරනු ලබයි.

BIRMC සෑම කාර්තුවකටම වරක්වත් රැස්වන අතර එමඟින් අවදානම් තොරතුරු සහ අනාවරණ සමාලෝචනය කරයි. අවදානම් වාර්තාවන්හි බැංකුවේ ප්‍රාග්ධනය, අවදානම් තැන්පතු, සීමාවන්, ප්‍රත්‍යාබල පරීක්ෂා කිරීම් සහ බැංකුව මුහුණ දෙන ඕනෑම මූලෝපායික අවදානමක් සම්බන්ධයෙන් අවදානම් විශ්ලේෂණයන් ඇතුලත් වේ. මීට අමතරව, ණය අවදානම, වෙළඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, තොරතුරු පද්ධති ආරක්ෂණ අවදානම හා අනුකූලතා අවදානම වැනි ප්‍රධාන අවදානම් අංශ ආවරණය වන වාර්තා ද ඊට ඇතුළත් වේ.

### අවදානම් ධාරිතාව

අවදානම් ධාරිතාව යනු නියාමන අවශ්‍යතා, ණය ගැනීමේ ගිවිසුම් සහ පාලන අරමුණු සඳහා වූ අභ්‍යන්තර සීමා මත පදනම්ව, බැංකුවට අවදානම් ගත හැකි උපරිම මට්ටමයි. අවදානම්

ධාරිතා සහ දැරිය හැකි මට්ටම් හඳුනාගත් සෑම අවදානම් අංශයක් වෙතම පැහැදිලිව අර්ථ දක්වා තෙපෙළ ආරක්ෂණය හා අවදානම් කළමනාකරණයන් යොදවා පූර්ව අර්ථදක්වන ලද දරාගැනීමේ මට්ටම් තුළ නිරීක්ෂණය අවදානම් ධාරිතා රාමුව මඟින් සිදු වේ. අනාගත සාර්ව ආර්ථික කම්පනයන් දරාගැනීමට බැංකුව සමත් ද යන වග සහතික කිරීම සඳහා ප්‍රත්‍යාබල පරීක්ෂණ සිදු කරන ලදී.

අවදානම් දරාගැනීමේ සීමාව පසුකර ගොස් ඇති අවස්ථාවක හෝ බැංකුවට සුදුසු නොවන මට්ටම් කරා ළඟාවන විට, පිළිගත් පරාසය තුළට නැවත ගෙන ඒම සඳහා අවදානම් අඩු කිරීමේ ක්‍රමවේද හා ව්‍යාපාර පාලක යොදා තිබේ. එබැවින් අවදානම් ධාරිතාව හා දරාගැනීම ප්‍රාග්ධන, ඉපැයුම් අස්ථාවරත්වය සහ අවදානම් සාන්ද්‍රණය ආදිය සඳහා නව හෝ වැඩි දියුණු කළ සීමාවන් හෝ ගුණාත්මක පරීක්ෂා කිරීම් වැනි මෙහෙයුම් මිනුම් බවට පරිවර්තනය වේ.

### ප්‍රත්‍යාබල පරීක්ෂාව (Stress Testing)

ප්‍රත්‍යාබල පරීක්ෂාව අප අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වූ අංගයකි. අහිතකර සිදුවීම් ඇතිවීමට පෙර, අහිතකර සාර්ව ආර්ථික ගැටුම් සඳහා බැංකුවේ අවදානමට ලක්වීමේ හැකියාව හඳුනා ගැනීම, ඒය අවම කර ගැනීමේ ක්‍රියාවන් හඳුනාගැනීම සහ නිර්වචනය කර තිබීම වැදගත් වේ. සෑම ප්‍රධාන අවදානම් වර්ගයක් සඳහාම අවම වශයෙන් කාර්තුවක් පාසා පරීක්ෂණයට ලක් කරනු ලබන අතර, ණය දීම, පොලී සංවේදී වත්කම් / වගකීම් සහ ද්‍රවශීලතාව ව්‍යාපාරයේ ඉතා සංවේදී අංශ සඳහා කළඹ සම්බන්ධ ආතති පරීක්ෂාවන් කාර්තුවක් පාසාම සිදු කෙරේ. ආතති පරීක්ෂණ ප්‍රතිඵල දේහලීය අගයයන් ක්‍රමාංකනය කිරීමට හා බැංකුවේ අවදානම් ධාරිතා සීමාවන් ස්ථාපිත කිරීම සඳහා යොදා ගනී. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණ ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) සමඟ සම්බන්ධව නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාව සිදු කරනු ලැබේ. සියලුම ප්‍රත්‍යාබල පරීක්ෂණ නිල වශයෙන් ලේඛනගත කර ඇති අතර, විවිධ අවස්ථාවලට ගැලපෙන සේ සියලුම අඩුපාඩු සකස් කර කළමනාකරණ කමිටු හා මණ්ඩල වෙත වාර්තා කරනු ලැබේ.

### අවදානම අනුරූපණයකොට දැක්වීම

බැංකුව සමඟ ඇති අවදානම අවම කිරීම සඳහා දරන්නා වූ අඛණ්ඩ ප්‍රයත්නයන් අතරම, සෑම අවදානම් මූලිකාංගයකම දැඩි බව සහ වාර ගණන දක්වන අවදානම් අනුරූපණයක් (සිතියම් දැක්වීමක්) සකසනු ලැබේ. අවදානම් කළමනාකරණය කිරීමට හැකියාව ලබාදෙන සම්බන්ධිත අවදානම සම්බන්ධව පුළුල් දැක්මක් සහිතව මනා කළමනාකරණයක් ද මෙමඟින් සපයනු ලැබේ. භාරගැනීම, හුවමාරුව, වැළකීම සහ අවදානම් අවම කිරීම යන විකල්ප තෝරාදෙමින් සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳව සමාගමට අවබෝධයක් ලබාදෙන්නේ අවදානම් අනුරූපණ ක්‍රියාවලිය මඟිනි.

### අපගේ ප්‍රධාන අවදානම්

**බැංකුවේ සියලු අවදානම් දැක්වෙන වගුව**

| | | | | |
|---|---|---|---|---|
| **ණය අවදානම හා ණය කළඹ අවදානම** | NPL අනුපාතය (EPF නොමැතිව) | **සහතික කරන්නන් මත ණය සාන්ද්‍රණය** | **අක්‍රමිකතා ආවරණය** | **කළඹ සීමාව** |
| **ද්‍රවශීලතා අවදානම** | ස්ථාවර තැන්පතු සංයුතිය/සාන්ද්‍රණය | මුළු වත්කම් මත ආයෝජනය | ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය | ද්‍රවශීල ආවරණ අනුපාතය |
| **පොළී අගය හා වෙළඳපොළ අවදානම** | AWPR මත ස්ථාවර තැන්පතු වාරික අවදානම | ස්ථාවර තැන්පතු බවට පත් කළ ණය | පොළී ආදායමට සාපේක්ෂව වියදම | මුළු වත්කම් වෙත ණය ගැනීම |
| **මෙහෙයුම් හා වෙනත් අවදානම්** | NLL කපා හැරීම් %) | ශාඛා විගණන (අඩු අනුපාතය %) | ශේෂ පත්‍රයේ වර්ධනය (වාර්ෂික) | එකකට ලාභය (රු.) |
| **නුබුන්වත්කම හා ප්‍රාග්ධනය මත අවදානම** | අවම ප්‍රාග්ධනය හිඟය | ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය | ස්කන්ධ සහ මුළු වත්කම් අනුපාතය | අවදානම් සහිත වත්කම් අනුපාතය |

# අවදානම් කළමනාකරණ වාර්තාව

තිරසාර වර්ධනය සඳහා අපට බලපාන ඉහළ අවදානම් විශ්ලේෂණය කර හඳුනාගෙන ඇත. මෙම අවදානම් අපගේ සමස්ත අවදානම් පාලන ක්‍රමෝපායේ මූලික සාධකය වන අතර ඒ අනුව බැංකුවේ ඒකාබද්ධ අවදානම් පාලන රාමුවේ කොටසක් වන අබණ්ඩ වැඩිදියුණු කිරීම් සමඟ අබණ්ඩ පරීක්ෂාවට ලක් කෙරේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවදානම් වාර්තා කිරීමේ විෂය පථය හා ප්‍රධාන අන්තර්ගතයන්**

| අවදානම් වර්ගය | විෂය පථය හා ප්‍රධාන අන්තර්ගතයන් |
|---|---|
| සමස්ත අවදානම | ● අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණ ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) සමාලෝචනය.<br>● නියාමන හා උපදේශන / අභ්‍යන්තර සීමාවන් ඇතුළු නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තත්ත්වය සහ ප්‍රවණතාවන් සමස්ත අවදානම් සීමාකාරී පද්ධතිය හා සංසන්දනය කිරීම<br>● ප්‍රධාන අවදානම් සහ සමස්ත හෙලිදරව් කිරීම් ආතති පරීක්ෂාවට ලක් කිරීම්<br>● ඉහළ හා වාර්තාගත මූලෝපායික හා සමස්ත ව්‍යාපාර අවදානම විශ්ලේෂණය |
| ප්‍රාග්ධන අවදානම | ● නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම |
| ණය අවදානම | ● පූර්ව ණය අවදානම් කළමනාකරණය<br>● මිලියන 1.50 කට වඩා වැඩි ණය සඳහා අවදානම් අනුපාතය<br>● ණය අවදානම් ප්‍රතිපත්ති සහ බලය පැවරීම<br>● ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය<br>● කාර්ය මණ්ඩලය පුහුණුව හා දැනුම් හුවමාරු සැසි<br>● ණය පරිපාලන අංශය යටතේ වියදම් මධ්‍යගත කිරීම<br>● ණය සමාලෝචන යාන්ත්‍රණය<br>● අවදානම් ඇගයීමේ මාදිලිය සඳහා වලංගුතාවය<br>● අවදානම් ධාරිතා (Risk appetite) සීමා නිරීක්ෂණය<br>● භාණ්ඩාගාර මධ්‍යම කාර්යාල සහ සීමා සමාලෝචනය<br>● නව අවදානම් පාදක මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම |
| වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම | ● ද්‍රවශීලතා සහ වෙළඳපොළ අවදානම් කළමනාකරණය ප්‍රතිපත්ති සමාලෝචනය හා යාවත්කාලීන කිරීම්<br>● ද්‍රවශීලතාව සහ භාණ්ඩාගාර වෙළඳපොළ අවදානම් විශ්ලේෂණය<br>● භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය හා සීමා සමාලෝචනය<br>● BASEL III අවශ්‍යතා අනුව ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය<br>● ALCO නිර්දේශ සමාලෝචනය |
| මෙහෙයුම් අවදානම්, සහ පද්ධති ආරක්ෂණ අවදානම් | ● ව්‍යාපාර අබණ්ඩ සැලැස්ම හා ආපදා ප්‍රතිස්ථාපනයට ක්‍රියාත්මක කළ සරඹ (disaster recovery drills) වාර්තා කිරීම<br>● මෙහෙයුම් අවදානම කළමනාකරණය ප්‍රතිපත්ති සමාලෝචනය හා යාවත්කාලීන කිරීම<br>● ප්‍රධාන අවදානම් දර්ශකය නිරීක්ෂණය හා වාර්තා කිරීම<br>● අභ්‍යන්තර අලාභ සිදුවීම් සහ බාහිර සිදුවීම් වලින් ඇතිවන අවදානම විශ්ලේෂණය කිරීම<br>● තොරතුරු තාක්ෂණ පද්ධති අවදානම අධීක්ෂණය කිරීම හා නීති අවදානම මානව අවදානම |
| අනුකූලතා අවදානම | ● නීති හා රෙගුලාසිවලට බැංකුවේ අනුගත වීමේ තත්වය<br>● යොදාගත් අනුකූලතා පරීක්ෂණ සහ අනුකූලතා අවදානම් මට්ටම් ඇගයීමෙහි ප්‍රතිඵල<br>● නව නීති සහ රෙගුලාසි පිළිබඳ වාර්තා කිරීම<br>● අනුකූලතාවය සම්බන්ධිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම |

## ප්‍රාග්ධන කළමනාකරණය

රජයේ බැඳුම්කරයකින් රු. මිලියන 250 ක් සහ අතිරේක ස්ථර 1 (ATI) ප්‍රාග්ධනය සමඟ අවම නියාමන ප්‍රාග්ධනය රු. මිලියන 5000 ක් ලබාගැනීමට බැංකුව සමත් විය.

කෙසේ වෙතත්, මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSB) සඳහා ඊළඟ මට්ටමේ අවම ප්‍රාග්ධන සීමාව රු. මිලියන 7500 ක් දක්වා ඉහළ දමන ලද අතර එය 2016-12-12 දින සිට ක්‍රියාත්මක වේ. එබැවින්, නියමිත කාල සීමාව තුළ අවම ප්‍රාග්ධන සීමාව සපුරා ගැනීමේදී බැංකුවට බරපතල අභියෝගයන්ට මුහුණ දීමට සිදුවන නිසා ප්‍රධාන විකල්ප 02 ක් අනුගමනය කරන ලදී.

- අභ්‍යන්තරව (Internal) උත්පාදනය කරන ලද ලාභ / රඳවා ගත් ඉපැයීම් තුළින් නියාමන අවම ප්‍රාග්ධනය සපුරාලීම සඳහා මූල්‍ය මණ්ඩලයෙන් වසර 02 ක කාලයක් දීර්ඝ කිරීම.
- දැනටමත් යෝජනා කර ඇති (Proposed) පරිදි වෙනත් බැංකුවක් සමඟ ඒකාබද්ධ වී අවම ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා යන "ජාතික නිවාස බැංකුවක්" ගොඩනැගීම.

කෙසේවෙතත්, කොටස් ප්‍රාග්ධනයේ හිඟයට වන්දි ගෙවීම සඳහා බැංකුව ඉදිරි වසර 03 තුළ ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයක් පවත්වාගෙන යනු ඇත. බැංකුවේ පළමු ස්ථර ප්‍රාග්ධනය සමන්විත වන්නේ BASEL III ට අනුකූල AT1 බැඳුම්කරයට අමතරව කොටස් ප්‍රාග්ධනය සහ රඳවා ගත් ඉපැයීම් වැනි අක්‍රීය කොටස් හිමියන්ගේ කොටස් වලින් සැලකිය යුතු කොටසකි. බැංකුවේ ශක්තිමත් කරන ලද අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් ක්‍රියාවලිය (ICAAP), BASEL 111 ප්‍රාග්ධන සම්මේලනයේ අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලියට අනුකූල වේ. අභ්‍යන්තර හෝ බාහිර කම්පන අවශෝෂණයට යටත්ව, සලකුණු කර ඇති අවදානම් සාධක ආවරණය කරමින් බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම කෙරෙහි ICAAP අවධානය යොමු කරයි. ඒ අනුව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයක් පවත්වා ගනිමින් 2022 වර්ෂය අවසන් වන විට රු. මිලියන 7500 ක් වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

**2022 දක්වා බැංකුවේ ප්‍රාග්ධන මුදල් වියදම්**




## 2019 දී HDFC හි අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම

නැගී එන අනුකූලතා අවශ්‍යතා, කර්මාන්ත නවෝත්පාදන, තාක්ෂණික වැඩිදියුණු කිරීම් - කඩාකප්පල් කිරීම් හේතුවෙන් HDFC බැංකුවේ අවදානම් කළමනාකරණ සැලසුම් වෙනස්කම් ගණනාවක් සිදුවී ඇති අතර එය වඩාත් දැඩි හා පුළුල් අවදානම් කළමනාකරණයට දායක වී තිබේ. වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියේදී මහ බැංකුවේ සහ BASEL III හි නියාමන පිරිවිතරයන්ට අමතරව ව්‍යාපාර උපායමාර්ග, කර්මාන්ත සාධක සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්හි අඛණ්ඩ වෙනස්කම් ද සලකා බලන ලදී. අවදානම් කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන වැඩිදියුණු කිරීම් පහත දැක්වේ.

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව (IRMF) සහ අවදානම් ප්‍රතිපත්ති, අත්පොත්, අවදානම් ආකෘති යනාදිය අවධාරණය කිරීම සමඟ සමාලෝචනය කරන ලදි. 2019 වර්ෂය තුළ බැංකුවේ ව්‍යාපාර ආකෘති අවශ්‍යතා සහ නියාමන අවශ්‍යතා සමඟ සම්පාත විය.

- IRMF සහ BASEL III අවශ්‍යතාවයන් සඳහා කරන ලද වෙනස්කම් අනුව බැංකුවේ දුර්වලතා සහ ප්‍රතිපාදන ප්‍රතිපත්ති නැවත පෙළගැස්වීම. ඒ අනුව, ණය පැහැර හැරීමේ සම්භාවිතාව (PD), නිරාවරණ පැහැරහැරීම (ED), පාඩු ලබා දී ඇති පැහැර හැරීම (LGD) වැනි ණය අවදානම් ප්‍රමාණාත්මක ප්‍රමිතීන් බැංකුව නැවත අර්ථ දැක්වීය.

- මිලියන 1.5 ට වඩා අඩු සෑම ණය යෝජනාවක්ම ව්‍යාපාරික රේඛාවලට සම්බන්ධ නොවන ස්වාධීන අධිකාරියක් විසින් ඇගයීමට ලක් කිරීම සහතික කිරීම සඳහා නව ණය වැඩ ප්‍රවාහයක් ක්‍රියාත්මක කිරීම.

- ණය ලබා දීමේ ක්‍රියාවලිය නැවත සැලසුම් කිරීම, අධිකාරිය පැවරීම සීමා කිරීම, බෙදාහැරීමේ අනුමැතිය කේන්ද්‍රගත කිරීම, නෛතික අයකර ගැනීමේ ක්‍රියාමාර්ග කඩිනම් කිරීම, නව අපරාධ කළමනාකරණ පද්ධතියක් අත්පත් කර ගැනීම වැනි අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සමඟ ඉහළ NPL අනුපාත කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම.

- ණය පහසුකම් අවධාරනය කරන නිශ්චිත අවදානම මැන බැලීමට සහ ගුණාත්මක පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීමට හැකිවන පරිදි අවදානම් පදනම් කරගත් මිලකරණ (RBP) යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

- ණය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී ශක්තිමත් අවදානම් සංස්කෘතියක් කාවැද්දීම සහ ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM) ශක්තිමත් කිරීම තුළින් ණය අවදානම් ඇගයීමේ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම බැංකුවේ වර්තමාන අවදානම් සහ ඉවසීමේ මට්ටම පිළිබිඹු කිරීම සඳහා දූරදර්ශී අවදානම් සීමාවන් සමාලෝචනය කර NPL අනුපාත, ණය සාන්ද්‍රණය, තැන්පතු සාන්ද්‍රණය, LCR,SLAR,CAR ඇතුළු සියලුම ප්‍රධාන අවදානම් සාධක නැවත අර්ථ දැක්වීම.

- ශාඛා මෙහෙයුම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා බැංකුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සහ යතුරු අවදානම් සාධකය (KRF) සමඟ පෙලගැසී ඇති මෙහෙයුම් උපකරණ පුවරුවක් ක්‍රියාත්මක කිරීම සහ නිරන්තරයෙන් ආතති තත්වය පරීක්ෂා කිරීම, විවිධ තත්වයන් යටතේ බැංකුවේ විභව හෝ පිළිගත හැකි අවදානම් සහ අවදානම් හඳුනා ගැනීම, බැංකුවලට ඔරොත්තු දීමේ හැකියාව සහ ශක්තිමත් බව සහතික කිරීම, විවිධ ක්ෂුද්‍ර හෝ සාර්ව පාරිසරික කම්පන අවශෝෂණය කර ගැනීම.

# අවදානම් කළමනාකරණ වාර්තාව

- මෙහෙයුම් අවදානම්, ණය අවදානම සහ අවදානම් මත පදනම් වූ සංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා බැංකුවේ කාර්ය මණ්ඩලයේ මනසෙහි අවදානමට සූදානමක් ඇති කිරීම.

### 2020 වර්ෂයේ ප්‍රධාන අභියෝග

තාක්ෂණික දියුණුව, නවෝත්පාදන හා සංකීර්ණ බැංකු නිෂ්පාදන, තාක්ෂණය පදනම් කරගත් වංචා, නියාමන හා අනුකූලතා අවශ්‍යතා දැඩි කිරීම, ඉහළ බදු අය කිරීම හේතුවෙන් අඩු අගය චිකතු කිරීම යනාදිය බැංකු පද්ධතියට අභියෝග රැසක් උද්ගත කොට තිබේ. කර්මාන්ත අභියෝගයන්ට නිරාවරණය වන අතරම, ඉදිරි වසරවලදී HDFC බැංකුව ද සුවිශේෂී අභියෝගයන්ට මුහුණ දෙනු ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් යටතේ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම
- ණය ශ්‍රේණිය BB+ සිට ආයෝජන ශ්‍රේණිය දක්වා ඉහළ නැංවීම
- සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- සාන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා අරමුදල් යාන්ත්‍රණය ප්‍රතිව්‍යුහගත කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය දක්වා ව්‍යාප්ත වූ ණය ආධාර වැඩසටහන කළමනාකරණය කිරීම.

# අනුකූලතාවය පිළිබඳ සභාපතිගේ ප්‍රකාශය

අපගේ ආයතනික පාලන වාර්තාව 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට ලැබීම ඉතා සතුටට කරුණකි.

### අපගේ ප්‍රවේශය

ආයතනික පාලනය සඳහා HDFC බැංකුවේ ප්‍රවේශය අරමුණු කර ඇත්තේ තිරසාර සැලැස්මක් මත දිගු හා කෙටිකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික සැලසුම් රාමුව ශක්තිමත් කිරීමයි. තිරසාරභාවය යනු දිගු කාලීනව බැංකුවේ මැදිහත්වීමෙන් ළඟාකරගැනීමට අපේක්ෂා කරන අවසාන අගයයි. එබැවින් වර්තමානයේ අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කෙරෙනුයේ තිරසාරභාවය දෙසටය.

ඒ අනුව HDFC හි අනුගමනය කරන ලද යහපාලන මූලධර්ම හරහා බැංකුවේ වටිනාකම් එකතු කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිසි අවදානම් පාලන ව්‍යුහයක් හා නිසි අභ්‍යන්තර පාලන පද්ධති සමඟ ආයතනය කෙරෙහි ඉහළ වගවීමක් සහ විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමට අභ්‍යන්තර පාර්ශ්වකරුවන් උත්තේජනය කරයි. එය තිරසාර වර්ධන වාතාවරණයක් සඳහා ඵලදායී භාරකාරත්වය සහ කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතිය ප්‍රවර්ධනය කරයි.

### බැංකු පාලන ව්‍යුහය

බැංකු හා පාලන උප කමිටු තුනකින් සමන්විතව ව්‍යුහයක් මත බැංකු පාලක ව්‍යුහය සකස් කරන ලදී. ප්‍රධාන කළමණාකාර/ප්‍රධාන විධායක නිලධාරියා ඉහළම විධායකයා ලෙස කටයුතු කරයි. ඔහු අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් සහිත පාලන මණ්ඩලයට සහ ප්‍රධාන කළමනාකාරිත්වයට වගකිව යුතු සහ වගඋත්තර බැඳිය දිය යුතුය. සහායක කණ්ඩායම් ලෙස පුද්ගල සංවිධානයේ නායකත්වය ඊළඟ මට්ටමට ගෙනයාමට සහභාගී වූ තිදෙනාටම සාමූහික වගකීමක් ඇත. කෙසේ වෙතත්, ඔවුන්ගේ ධූරාවලිය මත පදනම්ව, ඉහත පාර්ශව තුනම බැංකුවල සමස්ත කාර්යසාධන ඉලක්ක සඳහා තනි තනිව හා සාමූහිකව වගකිව යුතුය.

### වාර්තා

එබැවින් හොඳ ආයතනික පාලන මූලධර්ම බැංකුවේ පවත්නා පාලන ව්‍යුහයට පදනමක් නිර්මාණය කළේය. එබැවින් HDFC අනිවාර්ය පදනම මත, බැංකුකරණ පනත අංක 1 සම්මත කර ගත්තේය.( ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අදාළ වන පරිදි 2007 අංක 12 (සහ ඊට පසුව කරන ලද සංශෝධනය). අපගේ අනුකූලතා තත්ත්වය වාර්තා වන්නේ, ආයතනික රජයේ වාර්තාවේ 1 වන කොටසෙනි.

ඊට අමතරව, ශ්‍රී ලංකාවේ සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් 2017 දී නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම ක්‍රමවේදය සම්මත කර ගත් අතර, අපගේ අනුකූලතා තත්ත්වය සංස්ථාපිත රජයේ වාර්තාවේ දෙවන කොටසෙහි සඳහන් වේ.

තවද කොළඹ ව්‍යාපාර දේපල හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති සඳහා අපගේ අනුකූලතා තත්ත්වය (7.10 වගන්තිය යටතේ) ආයතනික රජයේ වාර්තාවේ තුන්වන කොටසේ වාර්තා වේ.

### ස්වාධීන සහතිකය

මහ බැංකුවේ ආයතනික පාලන නියමයන්ට බැංකුව අනුකූල වීම සම්බන්ධ බාහිර විගණකගේ සොයාගැනීම් තවදුරටත් අපි වාර්තා කරමු. ශ්‍රී ලංකා ප්‍රමිති ආශ්‍රිත සේවා පරිචයන් පිළිබඳ ප්‍රකාශය 4400 යටතේ නිකුත් කරන ලද විගණකවරුන්ගේ සත්‍ය කරුණු සොයා ගැනීමේ වාර්තාවේ සියලු නිගමනයන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.



**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
*සභාපතිනිය*

කොළඹ, ශ්‍රී ලංකාව
30-04-2020

# ජාතියක් ගොඩනැගීම

## සඳහා අපගේ ව්‍යවසායකයින්ට සහාය වීම



**ශ්‍රම උද්‍යාන ණය**
ඔබේ මීළඟ මහා පරිමාණ ව්‍යාපාරය සාර්ථක ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ සඳහා අපි ඔබට මඟ පෙන්වන්නෙමු.


SINGER

# අනුකූලතා සමාලෝචනය

2019 වර්ෂය සඳහා වන  බැංකුවේ අනුකූලතා තත්වය ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළඳපොළ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් නිර්වචනය කරන ලද සංස්ථාපිත පාලන රාමුව යටතේ අනුමත කර ඇත.

**1 කොටස**

**බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පරිපාලන මඟපෙන්වීම සමඟ අනුකූල වීම.**

| කොටස | ආයතනික පාලන අවශ්‍යතාව | | විගණකාධිපතිගේ වාර්තාව අනුව අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| 3(1) | අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම් | | |
| 3(1)(i) | අධ්‍යක්ෂක මණ්ඩලය බැංකුවේ සුරක්ෂිතතාව හා අඛණ්ඩතාව ශක්තිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග | | |
| | a) | අධ්‍යක්ෂක මණ්ඩලය බැංකුවේ මූලෝපායික අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම පරීක්ෂා කිරීම්<br><br>බැංකුවේ පූර්ණ මූලෝපායික අරමුණු සහ ආයතනික වටිනාකම් පිළිබඳව බැංකුව සන්නිවේදනය කර ඇති බව පරීක්ෂා කිරීම් | **අනුකූලවී ඇත**<br>2017-2020 කාල පරිච්ඡේදය සඳහා මණ්ඩල අනුමත සංයුක්ත සැලැස්ම තුළ උපාය මාර්ගික අරමුණු සහ වටිනාකම් සංස්ථාපනය කෙරෙයි. 2019 අයවැය සංස්ථාපිත සැලැස්ම මත පදනම්ව සකස් කරන ලද අතර ඒ දෙකම බැංකුව තුළ සාකච්ඡා කරන ලදී. |
| | b) | බැංකුවේ සමස්ත ව්‍යාපාර උපාය මාර්ග පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කිරීම් පරීක්ෂාව<br><br>සමස්ත ව්‍යාපාර මූලෝපාය සමස්ත අවදානම් ප්‍රතිපත්තියේ අඩංගු වන බව අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණයන් ඇතුල් කර තිබෙන බව පරීක්ෂා කිරීම<br>සමස්ත ව්‍යාපාරික උපායමාර්ගයේ අවම වශයෙන් මීලඟ වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක අඩංගු වන බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>2017-2020 කාල පරිච්ඡේදය සඳහා සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගය ඇතුළත් වන මණ්ඩල අනුමත සංයුක්ත සැලැස්ම.<br><br>අවදානම්  ප්‍රතිපත්ති අවදානම් ධාරිතා රාමුව සංස්ථාපිත සැලැස්මට අනුකූලව මණ්ඩලය විසින් අනුමත කර ඇත. |
| | c) | මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අවදානම්<br><br>කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමවේදයන් විචක්ෂණශීලී වන අතර ඒවා නිවැරදිව ක්‍රියාත්මකවේදැයි පරීක්ෂා කිරීම් | **අනුකූලවී ඇත.**<br>අවදානම් දෙපාර්තුමේන්තුව සහ ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව පිහිටුවා ඇති අතර කමිටුව විසින් අනුගමනය කරනු ලබන අවදානම් ප්‍රතිපත්තිය සහ ඉහත සඳහන් පරිදි වේ.<br>ඒකාබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව පාලක පද්ධති  ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය හා ප්‍රධාන අවදානම් කළමනාකරණය |
| | d) | තැන්පතු හිමියන් ණය හිමියන් කොටස් හිමියන් සහ ණය ගැණුම්කරුවන් ඇතුළු සියලු පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් මණ්ඩලය අනුමත කර තිබේ දැයි පරීක්ෂා කිරීම | **අනුකූල වී ඇත.**<br>තිරසාර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර තිබේ. |
| | e) | බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මක භාවය සහ අවංකභාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර තිබේ දැයි පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත.**<br>මණ්ඩල විගණන කමිටුව සහ මණ්ඩලය විසින් කලින් කලට අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳව සමාලෝචනය කර ඇති අභ්‍යන්තර විගණන අංශය අභ්‍යන්තර පාලන ක්‍රම ඇඟයුමට ලක් කරමින් විගණන කමිටුවට වාර්තා ඉදිරිපත් කරයි. |
| | f) | මණ්ඩලය ශ්‍රී ලංකා විණකාධිකරණ ප්‍රමිති නිර්වචනයට අනුකූලව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කර ඇති අතර ඒවා නම් (1) ප්‍රතිපත්තියට සැලකිය යුතු ලෙස බලපෑම් කිරීම (2) සෘජු ක්‍රියාකාරකම් සහ; (3) ව්‍යාපාර ක්‍රියාකාරකම් මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය පාලනය කිරීම යන්නන් සඳහා අදාලදැයි පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත.**<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අනුයුක්තව මණ්ඩලය කටයුතු කරයි. |

| කොටස | ආයතනික පාලන අවශ්‍යතාව | | විගණකාධිපතිගේ වාර්තාව අනුව අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | g) | මණ්ඩල ප්‍රතිපත්තියට අනුකූලව මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කටයුතු නිසි අධීක්ෂණයට ලක් කර ඇති ද යන්න් පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>මණ්ඩල මට්ටමින් කාර්ය සාධන වර්තා සලකා බලනු ලැබූ අතර අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වරින් වර නිරීක්ෂණ සිදු කරන ලදී කොටසකට අනුකූලවී ඇත. |
| | h) | මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් විසින්ම සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අධිකාරී සහ ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රයන් පිළිබඳව මණ්ඩලය විසින් අර්ථ දක්වා ඇති ද යන්න පරීක්ෂා කිරීම් | **අනුකූලවී ඇත**.<br>සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම HDFC පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇත.<br><br>ප්‍රධාන කළමනාකරණ නිලධාරී ඉලක්කයන් සමස්ත අයවැය ඉලක්ක හා අදාල දෙපාර්තුමේන්තු ඉලක්ක සමඟ සම්බන්ධ වේ.<br><br>ඒ අනුව 2019 වර්ෂය සඳහා සියලු ප්‍රධාන කළමනාකාර සාමාජිකයන්හට KPI පවතී. |
| | i) | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පාලන ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාවය කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කර ඇති( (1) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම නාමයෝජනා බාරදීම සහ තේරීම (2) බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ (3) දුර්වලතා නිර්ණය කිරීම හා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>මණ්ඩලයට ස්වයං ඇගයුම් ක්‍රියාවලියක් ඇති අතර එහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පාලනය කරන ක්‍රමවේදයන් ඇගයීමද ඇතුළත් වේ 2019 වර්ෂය සඳහා ස්වයං ඇගයීම 2020 මාර්තු මාසයේදී සිදු කරන ලද අතර ඒවා 2020 අප්‍රේල් 30 වන දින සමාලෝචනය සඳහා මණ්ඩලය වෙත සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.<br><br>KMP ඇතුළු සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීම් සඳහා ප්‍රතිපත්තියක් යොදන ලදී. |
| | j) | අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ඇති බවට පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>මණ්ඩල අනුමත අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාත්මක කර ඇත. 2019 පෙබරවාරි 14 වන දින 2019 වර්ෂය සඳහා වූ අනුප්‍රාප්තික සැලැස්ම අනුමත කර ඇත. එය නැවත 2019.10.21 සංශෝධනය කර ඇත. |
| | k) | ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම□ සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම හා ආයතනික අරමුණු කරා ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ විධිමත් රැස්වීම් න්‍යාය පත්‍ර ගතකර තිබෙන බව පරීක්ෂා කිරීම. | KMP උපාය මාර්ග ප්‍රතිපත්තිවල කාර්ය සාධනයන් හා වෙනත් අදාල අංශයන් සඳහා වූ මණ්ඩල අනු කමිටු සාකච්ඡා කළමනාකරණ කමිටු සහ මණ්ඩල සාකච්ඡාවන්ට නිතර සහභාගී වේ. |
| | l) | නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග හා ක්‍රියාවලීන් සිදුකර ඇති අතර බැංකුව නියාමකයින් සමඟ සම්බන්ධතා පවත්වාගෙන යන බව පරීක්ෂා කිරීම. | **අනුකූලවී ඇත** |
| | m) | බාහිර විගණන නිලධාරීන් බඳවා ගැනීම හා අධීක්ෂණය කිරීම සඳහා ස්ථාපිත ක්‍රමවේදයක් අධ්‍යක්ෂක මණ්ඩලය සතුව ඇති බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් රටේ ව්‍යවස්ථාව හා HDFC පනත අනුව ආයතනයේ බාහිර විගණකවරු යනු විගණකාධිපතිවරයා වේ. |

# අනුකූලතා සමාලෝචනය

| කොටස | ආයතනික පාලන අවශ්‍යතාව | විගණකාධිපතිගේ වාර්තාව අනුව අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(1)(ii) | මණ්ඩලය විසින් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී (CEO) පත් කර ඇති බව පරීක්ෂා කිරීම.<br><br>සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් හා වගකීම් මෙහි එන නියෝගයන්ගේ 3 (5) සමඟ අනුකූල වන බව පරීක්ෂා කිරීම. | **අනුකූලවී ඇත**<br>HDFC පනත සමතුලිතතාවය තහවුරු කිරීම සඳහා සභාපති සහ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙන් වෙන් කරයී විෂය භාර අමාත්‍යවරයා විසින් සභාපතිවරයා පත්කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරියා පත්කර ඇත.<br><br>HDFC පනතෙහි ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් පැහැදිලිව අර්ථ දක්වා ඇත. |
| 3(1)(iii) | මණ්ඩලයේ නිතිපතා රැස්වීම් පවත්වනු ලබන අතර අවම වශයෙන් මාසයකට වරක් ලෙසින් වසරකට 12 වරක් මණ්ඩල රැස්වීම් පවත්වනු ලබන බව පරීක්ෂා කිරීම. | **අනුකූලවී ඇත**<br>මණ්ඩල රැස්වීම් මාසිකව ද විශේෂ රැස්වීම් අවශ්‍යතාව අනුව ද සිදුකෙරිණි.<br><br>2019 වර්ෂය තුළ රැස්වීම් 13 ක් පවත්වන ලදී. |
| 3(1)(iv) | සියළු අධ්‍යක්ෂකවරුන්ට බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධන සහ අවදානම් කළමනාකරණ වෙත සබැඳි කාර්යන් සහ යෝජනා සාමාන්‍ය මණ්ඩල රැස්වීම් වෙත ඇතුළත් කිරීමට ඉඩ දීමට මණ්ඩලය සතුවන ක්‍රියා පටිපාටියක් තිබෙන බව පරීක්ෂා කිරීම. | **අනුකූලවී ඇත**<br>සභාපතිවරයා ලේකම්වරයා වෙත න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන අතර සියළුම අධ්‍යක්ෂවරුන් හට සභාපතිවරයාට හා ලේකම්වරයාගේ උපදෙස් අවශ්‍ය කාරණා සම්බන්ධයෙන් ගැළපෙන ලෙස ක්‍රියා කළ හැක. |
| 3(1)(v) | මණ්ඩලය විසින් සෑම අධ්‍යක්ෂකවරයෙක්ටම සහභාගී වීමට අවස්ථාව ලබා දීම සඳහා විධිමත් මණ්ඩල රැස්වීමක් සඳහා අවම වශයෙන් දින 7කටවත් පෙර දැනුම් දෙනු ලබයී අනෙක් සියලුම මණ්ඩල රැස්වීම් සඳහා ද දැනුම් දීමක් සිදු කරන බව පරීක්ෂා කිරීම. | **අනුකූල වී ඇත**<br>මණ්ඩල රැස්වීම් සඳහා දැනුම් දීම සහ න්‍යායපත්‍රය හා මණ්ඩලයේ පත්‍රිකා නියමිත කාලය ඇතුළත සංසරණය කිරීම සිදු කරනු ලැබේ. |
| 3(1)(vi) | මින් පෙර අවම වශයෙන් මාස 12 ක කාලසීමාවක් තුළ රැස්වීම් වලින් තුනෙන් දෙකක වත් රැස්වීම් වලට සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය කටයුතු කර තිබේ. කෙසේ වෙතත් අදාල අධ්‍යක්ෂවරයාගේ රැස්වීම්වලට විකල්ප අධ්‍යක්ෂකවරයෙකු සහභාගි වීම පැමිණීමක් ලෙස පිළිගත යුතු බව පරීක්ෂා කිරීම. | **අනුකූලවී ඇත**<br>සෑම අධ්‍යක්ෂකවරයෙකුම දෙන ලද රැස්වීම් ගණනකට සහභාගි විය. |
| 3(1)(vii) | 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන සපුරා ඇති සමාගම් ලේකම්වරයෙක් බැංකුව විසින් පත් කර ඇති අතර ඔහුගේ ප්‍රධාන වගකීම වන්නේ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් කටයුතු ඉටු කිරීම සහ ප්‍රඥප්තිවල සඳහන් අනෙකුත් කාර්යයන් සහ වෙනත් රෙගුලාසි ඉටු කිරීම පරීක්ෂා කිරීමයි. | **අනුකූලවී ඇත**<br>බැංකු පනතේ විධිවිධානයන්ට අනුකූල යෝග්‍යතාවන් ඇති නීතිඥවරයකු ලේකම්වරයකු ලෙස පත් කර තිබේ.<br><br>මණ්ඩලය වෙත ලේකම් කාර්යාල සේවා සැපයීම හා තත්වයන්ගේ හා වෙනත් රෙගුලාසිවල දක්වා ඇති කටයුතු ඉටු කිරීමට ඇය වගකිව යුතුය. |
| 3(1)(viii) | සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබා ගැනීම සඳහා සියලු අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලබා දීමේ ක්‍රියාවලිය. | **අනුකකූලවී ඇත**<br>සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබා ගැනීම සඳහා සියලු අධ්‍යක්ෂවරුන්ට උපරිම අවස්ථාව තිබේ. |

| කොටස | ආයතනික පාලන අවශ්‍යතාව | විගණකාධිපතිගේ වාර්තාව අනුව අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(1)(ix) | සමාගම් ලේකම් මණ්ඩල රැස්වීම්වල සභා වාර්තාවන් පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛන නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වෙත ක්‍රියා පටිපාටියක් පවතී. | **අනුකූලවී ඇත**<br>සමාගම් ලේකම්ට අතීත මණ්ඩල පත්‍රිකා සහ සභා වාර්තා වලට පිවිසුම් ඇති අතර සියළු වාර්තා තමා සන්තකයේ තබා ගනී. |
| 3(1)(x) | මණ්ඩල රැස්වීමක වාර්තා වල පහත සඳහන් දෑ අඩංගු දැයි පරීක්ෂා කිරීම:<br><br>(අ) මණ්ඩලය විසින් එහි සාකච්ඡා වලදී භාවිතා කරන දත්ත සහ තොරතුරු වල සාරාංශය.<br><br>(ආ) මණ්ඩලය විසින් සලකා බලන කරුණු<br><br>(ඇ) මණ්ඩලය සිය රාජකාරී නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලීව ඉටු කළේද යන්න පැහැදිලි කළ හැකි කරුණු සෙවීමේ සාකච්ඡා සහ මතභේද හෝ විසම්මුතිය පිළිබඳ කරුණු;<br><br>(ඇ) මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ අදාළ නීති හා රෙගුලාසි පිළිපැදීම පෙන්නුම් කරන කරුණු;<br><br>(ඉ) බැංකුව නිරාවරණය වන අවදානම් පිළිබඳ අවබෝධය සහ අනුගමනය කළ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක්; සහ<br><br>(ඊ) තීරණ සහ මණ්ඩල යෝජනා | **අනුකූලවී ඇත**<br>අත්‍යාවශ්‍ය විස්තර මණ්ඩල සභා වාර්තාවේ සඳහන් වේ. |
| 3(1)(xi) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාධාරණ ඉල්ලීමක් සුදුසු කොන්දේසි යටතේ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>නිසි තත්වයන් යටතේ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන් හට ප්‍රතිපාදන තිබේ. |
| 3(1)(xii) | අභිමත ගැටුම් වලක්වා ගැනීම හෝ උනන්දුවක් දක්වන ගැටුම් වලක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන් සම්බන්ධව තීරණය කිරීම, වාර්තා කිරීම, විසඳීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් තිබේදැයි පරීක්ෂා කිරීම.<br><br>අධ්‍යක්ෂවරයකු ඔහු / ඇය හෝ ඔහුගේ / ඇයගේ සමීපතම ඥාතියෙකු හෝ අධ්‍යක්ෂවරයකුට සැලකිය යුතු උනන්දුවක් ඇති උනන්දුවක් දක්වන ඕනෑම මණ්ඩල යෝජනාවකට ඡන්දය දීමෙන් වැළකී සිටීදැයි පරීක්ෂා කිරීම.<br><br>මණ්ඩල රැස්වීමේදී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා ගණපූරණයෙහි ඔහු / ඇය ගණනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම. | **අනුකූලවී ඇත** |
| 3(1)(xiii) | මණ්ඩලයට බැංකුවේ අධ්‍යක්ෂණය හඳුනා ගැනීමට හා පාලනය තීරණය කිරීම සඳහා විශේෂිතවූ විධිමත් ක්‍රියා න්‍යායක් ඇති බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>අධිකාරී අනුපිළිවෙල 2013.07.26 දින සිට සම්මත කර ඇත. |

# අනුකූලතා සමාලෝචනය

| කොටස | ආයතනික පාලන අවශ්‍යතාව | විගණකාධිපතිගේ වාර්තාව අනුව අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(1)(xiv) | බැංකුවට තම වගකීම් සපුරා ලීමට නොහැකි හෝ බංකොලොත් වීමට හෝ ක්‍රමානුකූලව තැන්පත්කරුවන්ට සහ අනෙක් ණය හිමියන්ට ගෙවීම් අත්හිටුවීමට සූදානම් වන විට එය හඳුනාගැනීමේ ක්‍රියාවලීන්ට පසුවී ඒ පිළිබඳව කිසියම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර බැංකු අධීක්ෂණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂක වෙත බැංකුවේ තත්වය හැකි ඉක්මණින් දැනුම් දෙනු ලබන බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>බැංකුවේ නුබුන් වත්කම් පිළිබඳ සැකයක් ඇතිවූ අවස්ථාවන් නොමැත. බැංකුවේ තත්වය සහතික කිරීම සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය ප්‍රකාශනය මඟින් බැංකුවේ තත්වය තහවුරු කරයි. |
| 3(1)(xv) | මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම් අනුව මණ්ඩලය මඟින් බැංකුව ප්‍රාග්ධනීකෘත කර ඇති බව පරීක්ෂා කිරීම | **අර්ධ වශයෙන් අනුකූල වේ**<br>ප්‍රාග්ධන ප්‍රමාණ අනුපාතය බැංකුව විසින් සපුරා ඇත. බැංකුව අවම ප්‍රාග්ධන මට්ටම වන රු. බිලියන 5 ක් වේ. කෙසේ වෙතත්, 2017 ඔක්තෝබර් 05 දින අංක 05 දරණ බැංකු පනතේ 02 වන වගන්තියට අනුව 2020.12.31 වන විට අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වන බිලියන 7.5 ට සැපිරීමට බැංකුව අනුකූල විය යුතුයි. |
| 3(1)(xvi) | මණ්ඩලය ප්‍රසිද්ධ කරන බැංකු වාර්ෂික වාර්තාවේ වාර්ෂික ආයතනික පාලන වාර්තාවන් මෙම නියමයන් හි නියාම අංක 3 හා අනුක්ත වන බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>මෙම වාර්තාව වාර්ෂික වාර්තාවේ අඩංගු කර ඇත. |
| 3(1)(xvii) | වික් වික් අධ්‍යක්ෂවරයෙකු වාර්ෂිකව සිදු කරන ස්වයං තක්සේරු ක්‍රමයක් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර එම ඇගයීම්වල වාර්තා පවත්වාගෙන යන බව පරීක්ෂා කිරීම | 2020 මාර්තු 18 වන දින ස්වයං-ඇගයුම් සිදුකර ඇති අතර මෙම වාර්තාවන් මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යයි. |
| 3(2) | මණ්ඩලයේ සංයුතිය | |
| 3(2)(i) | 3(2)(i) මණ්ඩලයේ 7කට වැඩි හා 13කට නොඅඩු අධ්‍යක්ෂකවරුන් | **අර්ධ වශයෙන් අනුකූල වේ**<br>මණ්ඩලය 2019 නොවැම්බර් මස අවසානය දක්වා අධ්‍යක්ෂවරුන් 08 දෙනෙකුගෙන් සමන්විත විය. මැතිවරණයෙන් පසු මණ්ඩලය සමන්විත වූයේ අධ්‍යක්ෂවරුන් 06 දෙනෙකුගෙන් පමණි. |
| 3(2)(ii) | (a) ප්‍රධාන විධායක නිලධාරි තනතුර දරන අධ්‍යක්ෂවරයෙකු හැර අන් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු කාලය වසර නවය ඉක්මවා නැති බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>2019 වර්ෂය අවසානය වන විට අධ්‍යක්ෂවරුන් කිසිවෙකුගේ වසර නවය ඉක්මවා ගොස් නැත. |
| | (b) කිසියම් අධ්‍යක්ෂවරයකු වසර 9 කට වැඩි කාලයක් සේවය කරන විට තාවකාලික විධිවිධාන අදාළ වන බව පරීක්ෂා කිරීම | **අනුකූලවී ඇත**<br>කිසිදු අධ්‍යක්ෂවරයකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවයට අනුව වසර නවය ඉක්මවා නැත. |
| 3(2)(iii) | ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොඉක්මවන බව. | **අනුකූලවී ඇත**<br>මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් කිසිවිකකුත් නැත. |
| 3(2)(iv) | මණ්ඩලයේ ස්වාධීන විධායක-නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් සිටීම යන අවස්ථා දෙකින් වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවක් තිබෙන පරීක්ෂා කිරීම. විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඔහු / ඇය නම් ස්වාධීන යැයි සැලකිය හැකිද යන්න පරීක්ෂා කිරීම. | 2019/12/31 දින වන විට අධ්‍යක්ෂ මංඩල සංයුතිය 06 කි. එහි සියළු දෙනාම විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ වරුවේ. කෙසේ වෙතත් 09/11/2019 දින ඉල්ලා අස්වූ ජාතික හිවාස සංවර්ධන අධිකාරිය නියෝජනය එක් අධ්‍යක්ෂකවරයකු විසින් වසර අවසානය වන විට 49.73% ක කොටස් ප්‍රමාණයක් දරයි. |
| | a) බැංකුවෙන් සියයට 1 කට වඩා සෘජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයක් දරයි. | **මතු වී නැත.** |

| කොටස | ආයතනික පාලන අවශ්‍යතාව | | විගණකාධිපතිගේ වාර්තාව අනුව අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | b) | ඔහු / ඇය අධ්‍යක්ෂක ධුරයට පත්වීමට පෙර වසර දෙකක කාලයක් තුළ හෝ එහි 3 (7) දිශාවෙහි විස්තර කර ඇති පරිදි බැංකුව සමඟ කෙරෙන ඕනෑම ව්‍යාපාර ගනුදෙනුවක් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවයි. | |
| | c) | අධ්‍යක්ෂ ධුරයට පත්වීමට පෙර වසර දෙකක කාලය තුළ බැංකුව විසින් සේවයේ යොදවා ඇත. | |
| 7.10.6 (අ) සහ 7.10.6 (ඇ)<br>(xx) සභාපතිවරයාගේ සුදුසුකම් | **අනුකූලවී ඇත.**<br>කරුණාකර පිටු 83 සිට 87 දක්වා වූ අධ්‍යක්ෂකවරුන්ගේ පැතිකඩයන් බලන්න. | | | |
| 7.10.6 (අ) සහ 7.10.6 (ඇ)<br>(xxi) කමිටු රැස්වීම් සඳහා ප්‍රධාන විධායක නිලධාරියාගේ CEO සහ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ (CFO) ගේ සහභාගීත්වය | **අනුකූලවී ඇත.** | | | |
| 7.10.6 (ඇ)<br>(xxii) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය | | | | **අදාල නොවේ.**<br>(ශ්‍රී ලංකා විගණකාධිපති-වරයා බැංකුවේ බාහිර විගණකාධිපති-වරයා වේ.) |

# පාලනය සහ ආචාර ධර්ම

**මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීම - 2019**

| නම | 31/12/2019 දින වන විට අධ්‍යක්ෂක තත්වය (Directorship status) | නියමිත වූ රැස්වීම් ගණන | පැමිණි රැස්වීම් ගණන |
|---|---|---|---|
| ආචාර්ය ආර්. එච්. මීවක්කල මහතා (2019 නොවැම්බර් 19 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 13 | 13 |
| ආර්. ඒ. චුලානන්දා මිය | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 13 | 12 |
| එන්. විජයනාතන් මහතා | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 13 | 11 |
| රොහාන් ද සිල්වා මහතා | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 13 | 09 |
| ආචාර්ය කේ. ඩී. ගුණවර්ධන මහතා (2019 මාර්තු 14 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 10 | 10 |
| එන්. ආර්. අහීස් මිය (2019 මාර්තු 25 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 10 | 08 |
| ආචාර්ය එස්. එන්. මොරායස් මහතා (2019 ජූනි 28 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 05 | 05 |
| යූ. එච්. සී. ප්‍රියන්ත මහතා (2019 අගෝස්තු 22 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 09 | 09 |
| එල්. එස්. පලන්සූරිය මහතා (2019 මාර්තු 14 වන දින පත් කරන ලද අතර 2019 නොවැම්බර් 28 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන නොවන අධ්‍යක්ෂක | 10 | 09 |
| එල්. ජයසිංහ මහතා (2019 ජූනි 28 වන දින ඉල්ලා අස් විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 08 | 08 |
| ඩී. පී. විමලසේන මහතා (2019 පෙබරවාරි 27 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |

* 2019 වසරේ පැවැත්වූ මණ්ඩල රැස්වීම් ගණන - 13

# පාලනය සහ ආචාර ධර්ම

**නාම යෝජනා කමිටු රැස්වීම් - 2019**

| නම | 31/12/2019 දින වන විට අධ්‍යක්ෂක තත්වය | නියමිත වූ රැස්වීම් ගණන | පැමිණි රැස්වීම් ගණන |
|---|---|---|---|
| ආචාර්ය ආර්. එච්. මීවක්කල මහතා (2019 නොවැම්බර් 19 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටුවේ සභාපති) | 04 | 04 |
| ආර්. ඒ. චුලානන්දා මිය | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 05 | 05 |
| යූ. එච්. සී. ප්‍රියන්ත මහතා (2019 අගෝස්තු 22 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 04 | 04 |
| ඩී. පී. විමලසේන මහතා (2019 පෙබරවාරි 27 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 01 | 01 |

*2019 වසරේ පැවැත්වූ නාම යෝජනා කමිටු රැස්වීම් ගණන - 05

**මානව සම්පත් / පාරිතෝෂික කමිටු රැස්වීම් - 2019**

| නම | 31/12/2019 දින වන විට අධ්‍යක්ෂක තත්වය | නියමිත වූ රැස්වීම් ගණන | පැමිණි රැස්වීම් ගණන |
|---|---|---|---|
| ආචාර්ය ආර්. එච්. මීවක්කල මහතා (2019 නොවැම්බර් 19 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටුවේ සභාපති) | 04 | 04 |
| යූ. එච්. සී. ප්‍රියන්ත මහතා (2019 අගෝස්තු 22 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |
| රොහාන් ද සිල්වා මහතා | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 00 |
| ආචාර්ය කේ. ඩී. ගුණවර්ධන මහතා (2019 මාර්තු 14 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |
| පාලිත ගමගේ මහතා | සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී | 04 | 04 |

*2019 වසරේ පැවැත්වූ මානව සම්පත් සහ පාරිතෝෂික කමිටු රැස්වීම් ගණන - 04

## ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් - 2019

| නම | 31/12/2019 දින වන විට අධ්‍යක්ෂක තත්වය | නියමිත වූ රැස්වීම් ගණන | පැමිණි රැස්වීම් ගණන |
|---|---|---|---|
| එන්. විජයනාතන් මහතා | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටුවේ සභාපති) | 04 | 04 |
| එල්. ජයසිංහ මහතා (2019 ජූනි 28 වන දින ඉල්ලා අස් විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |
| ඩී. පී. විමලසේන මහතා (2019 පෙබරවාරි 27 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 01 | 01 |
| එන්. ආර්. අනීස් මිය (2019 මාර්තු 25 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 03 | 03 |
| ආචාර්ය එස්. එන්. මොරායස් මහතා (2019 ජූනි 28 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |

*2019 වසරේ පැවැත්වූ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් ගණන - 04

## අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් - 2019

| නම | 31/12/2019 දින වන විට අධ්‍යක්ෂක තත්වය | නියමිත වූ රැස්වීම් ගණන | පැමිණි රැස්වීම් ගණන |
|---|---|---|---|
| ආචාර්ය කේ. ඩී. ගුණවර්ධන මහතා (2019 මාර්තු 14 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටුවේ සභාපති) | 04 | 04 |
| එන්. ආර්. අනීස් මිය (2019 මාර්තු 25 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 04 | 04 |
| ආචාර්ය එස්. එන්. මොරායස් මහතා (2019 ජූනි 28 වන දින පත් කරන ලදී) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 01 | 00 |
| ඩී. පී. විමලසේන මහතා (2019 පෙබරවාරි 27 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 01 | 01 |
| එල්. ජයසිංහ මහතා (2019 ජූනි 28 වන දින ඉල්ලා අස් විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |
| යූ. එච්. සී. ප්‍රියන්ත මහතා (2019 අගෝස්තු 22 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 04 | 04 |

*2019 වසරේ පැවැත්වූ මණ්ඩල විගණන කමිටු රැස්වීම් ගණන - 05

# පාලනය සහ ආචාර ධර්ම

**සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු නිරීක්ෂණ කමිටු රැස්වීම් - 2019**

| නම | 31/12/2019 දින වන විට අධ්‍යක්ෂක තත්වය | නියමිත වූ රැස්වීම් ගණන | පැමිණි රැස්වීම් ගණන |
|---|---|---|---|
| ආචාර්ය ආර්. එච්. මීවක්කල මහතා (2019 නොවැම්බර් 19 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක (කමිටුවේ සභාපති) | 04 | 04 |
| ආර්. ඒ. චුලානන්ද මිය | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 04 | 04 |
| ආචාර්ය එස්. එන්. මොරායස් මහතා (2019 ජූනි 28 වන දින පත් කරන ලදි) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 01 | 01 |
| යූ. එච්. සී. ප්‍රියන්ත මහතා (2019 අගෝස්තු 22 වන දින ඉල්ලා අස්විය) | විධායක නොවන / ස්වාධීන අධ්‍යක්ෂක | 02 | 02 |

*2019 වසරේ පැවැත්වූ සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු නිරීක්ෂණ කමිටු රැස්වීම් ගණන - 04

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2019 මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ සමාලෝචනයට භාජනය වූ කාල සීමාව සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟින් 2019 වාර්ෂික වාර්තාව කොටස් හිමිකරුවන් වෙත ඉතා සතුටින් යුතුව ඉදිරිපත් කර සිටියි.

### 01. මූලික කරුණු

- HDFC යනු කොටස් වෙළඳපලෙහි ලියාපදිංචි, 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. 2019 දෙසැම්බර් 10 වන දින දක්වා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ බැංකුව එකී කාලසීමාවෙන් පසුව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇත.

- ඉහත සඳහන් කර ඇති පරිදි, මෙම වාර්ෂික වාර්තාව 2019 මූල්‍ය වර්ෂය (ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා) ආවරණය කරන අතර ව්‍යවස්ථාපිත නියාමන අවශ්‍යතා සහ පවත්නා හොඳම ගිණුම්කරණ පිළිවෙත් අනුව සකස් කර ඇත.

- තවද මෙම වාර්ෂික වාර්තාව 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (සංශෝධන) 2007 අංක 07 දරණ සමාගම් පනත (අදාල අවස්ථා වලදී) 1988 අංක 30 දරණ බැංකු පනත සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ රීති යනාදියෙහි අවශ්‍යතාවයන්ට ද අනුකූලව වේ.

- සියලු ප්‍රධාන තොරතුරු හා කොටස් හිමිකරුවන්ගේ සහ බැංකුවේ යහපත සඳහා වන සියලු තොරතුරු අනාවරණය කරන ලද අතර අදාල මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමත කර ඇත.

### 02. ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුවේ බලපත්‍රයෙහි පරිදි කිසිදු වෙනසක් නොමැතිව නිවාස සෑදීමේ අරමුණු සහ ඒ ආශ්‍රිත කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයීම බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරය ලෙස අඛණ්ඩව පවත්වාගෙන යන ලදී මීට අමතරවඃ බැංකු පනතෙහි (iv) වන උපලේඛනයේ දක්වා ඇති පරිදි බැංකුව ව්‍යාපාරික කටයුතුවල ද නිරත වේ සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනසක් සිදු නොවීය.

### 03. ව්‍යාපාර සමාලෝචනය

බැංකුවෙහි දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ වාර්ෂික වාර්තාවේ 03 වන පිටුවේ දක්වා ඇත.

සභාපතිගේ පණිවිඩය (පිටු අංක 14 සිට 16 දක්වා) සහ සාමාන්‍යාධිකාරිවරයාගේ /ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය පිටු අංක 17 සිට 19 දක්වා සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ බැංකුවේ සමස්ත මූල්‍ය තත්ත්වය කාර්යසාධනය තත්ත්වය සහ සිදුවූ වැදගත් සිදුවීම් සාකච්ඡා කරයි.

2019 මූල්‍ය වර්ෂය තුළ මෙහෙයුම් සමාලෝචනයක් සහ මෙහෙයුම් ප්‍රතිඵල පිටු අංක 122 සිට 123 දක්වා ආදායම් ප්‍රකාශයේ ලබා දී ඇත. මෙම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අත්‍යාවශ්‍ය අංගයක් වේ.

### 04. අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් ඉහත සඳහන් HDFC පනත හා නිවාස සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්තිමය තීරණ සමඟ සමපාත වේ. වැඩි විස්තර සඳහා කරුණාකර ඉහත සඳහන් කළ සභාපතිවරයාගේ පණිවිඩය සහ සාමාන්‍යාධිකාරිවරයාගේ / ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය බලන්න.

### 05. මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට හා 1988 අංක 30 දරණ බැංකු පනතට අනුකූලව සකස් කරන ලදී 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අත්‍යාවශ්‍ය අංගයක් වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 සිට 162 දක්වා ඇත.

### 06. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවේ පිටු අංක 127 සිට 136 දක්වා ඇත. කොටස්වල වෙනස්වීමෙහි බලපෑම වාර්ෂික වාර්තාවේ 125 වන පිටුවේ දක්වා ඇත.

### 07. විගණකවරුන්ගේ වාර්තාව

HDFC බැංකුවේ විගණකවරයා ලෙස කටයුතු කරන ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා විසින් සමාලෝචනයට භාජනය වන කාල සීමාව සඳහා HDFC බැංකුවේ මූල්‍ය ප්‍රකාශයෙහි විගණනය සිදු කරන ලද අතර අදාල විගණක වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 118 සිට 121 දක්වා අඩංගු වේ.

### 08. අඛණ්ඩ පැවැත්මේ සංකල්පය

අවශ්‍ය විමසීම් සිදු කිරීමෙන් පසුව, අපේක්ෂිත අනාගතය සඳහා මෙහෙයුම් කටයුත් පවත්වාගෙන යාම සඳහා බැංකුවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන් හට සාධාරණ අපේක්ෂාවක් ඇත. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ සංකල්පය අනුගමනය කර ඇත.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

## 09. ආදායම

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ ආදායම රුපියල් මිලියන 8,090 කි. ආදායම පිළිබඳ විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 1,2,3,4 සහ 5 හි දක්වා ඇත.

## 10. ලාභය සහ විසර්ජනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය සේවා සඳහා ආදායම් බදු, එකතු කළ අගය මත බදු (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වලට පෙර ලාභය රුපියල් මිලියන 1,244 කි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 476 කි.

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2018 රු. මිලියන | 2019 රු. මිලියන |
|---|---|---|
| මූල්‍ය සේවාවන් සඳහා VAT, DRL & NBT | 290 | 470 |
| බදු සඳහා ප්‍රතිපාදන | 64 | 299 |
| බදු වලින් පසු සාමාන්‍ය ක්‍රියාකාරකම් මත ලාභය | 564 | 476 |
| ඉතිරි ලාභය / (එකතු කළ අලාභ) ඉදිරියට ගෙනඇා | 2,840 | 3,275 |
| විසර්ජන සඳහා ලාභය | 3,404 | 3,752 |
| යෝජනා කළ පළමු හා අවසාන විසර්ජන ලාභාංශ | - | |
| සංචිත අරමුදල් වෙත මාරු කිරීම | 85 | 71 |
| ඉදිරියට ගෙනයනු ලැබූ ඉතිරි ලාභය | 3,320 | 3,680 |

## 11. සංචිත

2019 දෙසැම්බර් 31 දින වන විට මුළු සංචිත ප්‍රමාණය රුපියල් මිලියන 5,119 කි. මූල්‍ය ප්‍රකාශයේ 30,31,32 සහ 33 සටහන් වල මූල්‍ය තත්ව ප්‍රකාශයේ විස්තර දක්වා ඇත.

## 12. පරිත්‍යාග

වර්ෂය තුළ බැංකුව කිසිදු පරිත්‍යාගයක් සිදු කර නැත.

## 13. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය සහ සේවකයින් සම්බන්ධ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් යාවත්කාලීන කර ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමෙන් හා විශ්වාසයෙන් උපරිම ලෙස සෑහීමකට පත්වේ.

## 14. බදු සඳහා ප්‍රතිපාදන

බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් වර්ධනය වන බදු අය කළ හැකි ආදායම මත 2019 වර්ෂය සඳහා ආදායම් බද්ද 28% ක් ලෙස ලබා දී ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ 141 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන වල සටහන 11 හි අනාවරණය කර ඇත.

## 15. ලාභාංශ

බැංකුවේ අවම ප්‍රාග්ධනය රු. බිලියන හතයි දශම පහක් (බිලියන 7.5) දක්වා ඉහළ දැමීම සඳහා වූ නියාමන අවශ්‍යතාවය සැළකීමට ගනිමින් 2019 මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ගෙවනු නොලැබේ.

## 16. දේපළ, යන්ත්‍ර හා උපකරණ, සින්නක්කර වත්කම්

දේපළ, යන්ත්‍ර සහ උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම රු.මිලියන 72 ක් වන අතර, ඒ පිළිබඳ තොරතුරු 146 සිට 149 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 19හි දක්වා ඇත.

## 17. සින්නක්කර දේපළවල වෙළඳපල වටිනාකම

සින්නක්කර දේපළවල වෙළඳපල වටිනාකම පිළිබඳ විස්තර 149 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 19.2 හි දක්වා ඇත.

## 18. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය නිකුත් කිරීමෙන් පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කිරීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන ප්‍රධාන සිදුවීම් කිසිවක් මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය නිකුත් කිරීමෙන් පසුව ඇතිවී නොමැත.

## 19. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2019 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.මිලියන 962 ක් වන අතර සාමාන්‍ය කොටස් 64,710,520 කින් සමන්විතය.

## 20. කොටස් තොරතුරු සහ ණයකර

කොටස් හා ණයකර පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ 168 සිට 170 දක්වා සහ 152 සිට 153 දක්වා පිටුවල දක්වා ඇත.

## 21. සියලුම පාර්ශවකරුවන්ට සමානව සැලකීම

සියලුම කොටස් හිමිකරුවන් හට ඔවුන් වෙත නිකුත් කරන ලද මුල් නියමයන්ට අනුකූලව සාධාරණ ලෙස සලකනු ලැබේ.

## 22. අධ්‍යක්ෂ මණ්ඩලය

සම්පූර්ණ අධ්‍යක්ෂකවරුන්ගේ ලැයිස්තුව සහ ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද සඳහා කරුණාකර 100 සිට 101 දක්වා පිටුවල අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ පරිච්ඡේදය බලන්න.

**සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මණ්ඩලයෙහි පත්වීම් හා ඉල්ලා අස්වීම්**

| අංකය | නම | සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ පත්වීම් | සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ ඉල්ලා අස්වීම් |
|---|---|---|---|
| 01 | ආචාර්ය ආර්. එච්. මීවක්කල | 02/01/2019<br>(සභාපතිවරයා වශයෙන් පත් කරන ලදී) | 19/11/2019 |
| 02 | එල්. එස්. පලන්සූරිය මහතා | 14/03/2019<br>(නැවත පත්කිරීම) | 28/11/2019 |
| 03 | ආචාර්ය. කේ. ඩී. ගුණවර්ධන මහතා | 14/03/2019<br>(අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම) | - |
| 04 | එන්. ආර්. අනීස් මිය | 25/03/2019<br>(අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම) | - |
| 05 | ආචාර්ය. එස්. එන්. මොරායස් මහතා | 28/06/2019<br>(අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම) | - |
| 06 | යූ. එච්. සී. ප්‍රියන්ත මහතා | - | 22/08/2019 |
| 07 | එල්. ජයසිංහ මහතා | - | 28/06/2019 |
| 09 | ඩී. පී. විමලසේන මහතා | - | 27/02/2019 |

## 23. මණ්ඩල අනු කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව යනාදියෙහි ආයතනික පාලන නියෝග යටතේ නියම කර ඇති පරිදි අදාල අනු කමිටු පත් කරන ලද අතර එම උප කමිටුවල සාමාජිකත්වය, රාජකාරි, වගකීම් සහ කාර්යසාධනය වාර්ෂික වාර්තාවේ 94 සිට 99 දක්වා පිටුවල දක්වා ඇත.

## 24. අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

රැස්වීම් සඳහා මණ්ඩල සහ මණ්ඩල අනු කමිටු වල පැමිණීම පිළිබඳ කොටස සඳහා 79 සිට 82 දක්වා පිටුවල බලන්න

## 25. මූල්‍ය වාර්තාකරණය සඳහා වන අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම

HDFC බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් පිළිබිඹු කිරීම සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ කරුණාකර පිටු අංක 116 සිට 117 දක්වා වූ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය බලන්න. මෙම කොටස අධ්‍යක්ෂකවරුන්ගේ වාර්ෂික වාර්තාවේ අත්‍යාවශ්‍ය අංගයක් වේ.

## 26. අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතා

161 වන පිටුවේ දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතා පිළිබඳව බැංකුව විසින් අවශ්‍ය ප්‍රකාශයන් සිදු කරන ලදී. අනාවරණය කළ ඒවා හැරුණු විට අධ්‍යක්ෂවරුන් හට, කොටස් හිමිකරුවන් වෙත හෙළි කළ යුතු කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් කෙරෙහි සෘජු හෝ වක්‍ර අවශ්‍යතාවයක් නොමැත. අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතාවයන්ට සම්බන්ධ කරුණු හෝ කොන්ත්‍රාත්තු පිළිබඳ සාකච්ඡාවලට හෝ අනුමත කිරීමේ ක්‍රියාවලියට හෝ ඒ සම්බන්ධ ඡන්දය ප්‍රකාශ කිරීමකට සහභාගී වීමෙන් ඔවුන් වැළකී සිටින ලදී.

ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට සම්බන්ධ ගැටළු සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ අවශ්‍යතා (ඇත්නම්) අනාවරණය කර ඇත.

## 27. අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය පහත පරිදි වේ:

| | 31/12/2019 | 01/01/2019 |
|---|---|---|
| ආර්. වී. චුලානන්ද මිය | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| එන්. විජයනාතන් මහතා | 3,979 | 3,979 |
| රොහාන් ද සිල්වා මහතා | 2,241 | 2,241 |
| ආචාර්ය කේ. ඩී. ගුණවර්ධන මහතා | 1,000 | ශූන්‍ය වේ |
| එන්. ආර්. අනීස් මිය | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| ආචාර්ය එස්. එන්. මොරායස් මහතා | 1,000 | ශූන්‍ය වේ |
| මුළු එකතුව | 8,220 | 6,220 |

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

### 28. අධ්‍යක්ෂකවරුන්ගේ ණයකර හිමිකාරිත්වය

අධ්‍යක්ෂවරුන්ගේ ඒක පුද්ගල ණයකර හිමිකාරිත්වය පහත පරිදි වේ:

| 2019 දෙසැම්බර් 31 වන විට | 2019 | 2018 |
|---|---|---|
| | ණයකර සංඛ්‍යාව | වටිනාකම (රු) |
| ආර්. ඒ. චුලානන්ද මිය | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| එන්. විජයනාතන් මහතා | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| ජේ. ආර්. යූ. ද සිල්වා මහතා | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| ආචාර්ය කේ. ඩී. ගුණවර්ධන මහතා | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| එන්. ආර්. අහීස් මිය | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| ආචාර්ය එස්. එන්. මොරායස් මහතා | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |
| මුළු එකතුව | ශූන්‍ය වේ | ශූන්‍ය වේ |

### 29. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ බැංකුව, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ කොළඹ කොටස් හුවමාරුවෙහි නීති රීති සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූල වී ඇති බව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රකාශ කර සිටියි. සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුපිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ 161 වන පිටුවේ දක්වා ඇත.

### 30. අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් විස්තර 140 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් අංක 9 හි දක්වා ඇත.

### 31. පාරිසරික ආරක්ෂාව

බැංකුව අදාල පාරිසරික නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බව අධ්‍යක්ෂක මණ්ඩලයේ දැනුම පරිදි සනාත කරයි පරිසරයට අහිතකර හෝ අනතුරුදායක වන කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නොමැත.

### 32. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළදී, බැංකුවේ අවදානම් දෙපාර්තමේන්තුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සහ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයට අදාල මූලාරම්භයන් ගෙන ඇත, කරුණාකර 37 සිට 42 දක්වා පිටුවල අවදානම් තක්සේරු වාර්තාව බලන්න.

තවද, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ, මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය නිරන්තරයෙන් සමාලෝචනය කරන ලදී. IRMC සහ BAC කමිටු සභා වාර්තා සෘජුවම අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

කරුණාකර පිටු අංක 99 හි මණ්ඩල විගණන කමිටු වාර්තාව සහ පිටු අංක 90 සිට 91 දක්වා අභ්‍යන්තර පාලනයන් පිළිබඳ ස්වාධීන විගණක වාර්තාව බලන්න.

### 33. ආයතනික පාලනය

4,400 (SLSRS) යටතේ නිකුත් කරන ලද විගණක "කරුණු සෙවීමේ වාර්තා" වල කරුණු සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලන විධිවිධාන පරිදි ඉදිරිපත් කරන ලද ආයතනික පාලන වාර්තාව සඳහා පිටු අංක 46 සිට 78 දක්වා බලන්න.

### 34. අදාල නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

බැංකුවෙහි අනුකූලතා නිලධාරියා විසින් පාලන නීති වලට අනුකූලව බැංකුවේ අනුකූලතා තත්ත්වය සෘජුවම IRMC වෙත වාර්තා කරයි, අධ්‍යක්ෂකවරුන්ගේ දැනුම පරිදි, බැංකුව විසින් අනාවරණය කළ යුතු ව්වැනි නීති හෝ නියාමනයන් උල්ලංඝණය කිරීමක් සිදුවී නොමැති අතර සේවක කළමනාකාරණය ඇතුළු බැංකුව මත සැළකිය යුතු මූල්‍යමය බලපෑමක් ඇති කළ හැකි කිසිදු අසාමාන්‍යතාවයක් ද සිදු වී නොමැත.

බැංකුවට අදාල වන ව්‍යවස්ථාවන්හි නියෝගයන්ගෙන් පැන නැගෙන සියලුම නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුව කටයුතු කරයි, ව්වා අතරට 1997 අංක 07 දරණ HDFC පනත (සංශෝධන) 1988 අංක 30 දරණ බැංකු පනත, බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් සහ නිර්ණායක, 1949 අංක 58 දරණ මූල්‍ය නීති පනත, 2007 අංක 7 දරණ සමාගම් පනත. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන සම්මත පනත, 2006 අංක 5 මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත, 2005 අංක 25 ත්‍රස්තවාදී මූල්‍ය මර්දනය පිළිබඳ සම්මුතිය, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත, 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත, 2005 අංක 5 මූල්‍ය පනත, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ නීති, 1987 අංක 36 දරණ සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත, 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත, 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත, 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් පනත සහ ව්වැනි ව්‍යවස්ථා සංශෝධනය කිරීම් ඇතුළත් වේ.

## 35. විගණකවරුන් පත් කිරීම

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සහ 1997 අංක 07 දරණ HDFC පනතේ දක්වා ඇති පරිදි විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා ලෙස කටයුතු කරයි.

## 36. විගණකවරුන්ගේ වේතනය සහ බැංකුව සමඟ කටයුතු කිරීමට ඇති අවශ්‍යතාවය

විගණන ගාස්තු ලෙස 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකවරුන්ට රු. 3,767,526 ක් ගෙවා ඇත. විගණකවරුන්ට බැංකුව සමඟ ගිවිසුම් සඳහා වෙනත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට අවශ්‍යතාවයක් නොමැත.

ඉහත අනාවරණය කළ කරුණු හැරුණු කොට අධ්‍යක්ෂවරුන්ගේ දැනුම පරිදි විගණන නිලධාරීන්ට හට බැංකුව සමඟ කිසිදු සම්බන්ධයක් හෝ අවශ්‍යතාවයක් නොමැත.

## 37. විගණන කමිටුව

විගණන කමිටුවේ සංයුතිය සහ ඔවුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 99 වන පිටුවෙහි දක්වා ඇත.

## 38. රැස්වීම් පිළිබඳ දැනුම්දීම

බැංකුවේ 35 වන වාර්ෂික මහා සභා රැස්වීම 1997 අංක 07 දරණ HDFC පනතේ 35 වන වගන්තිය අනුව 2019 මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 9 ක් ඇතුළත පැවැත්වෙන අතර ඒ පිළිබඳව කොටස් හිමිකරුවන් වෙත දැනුම්දීම යථාකාලයේදී සිදු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව අත්සන් කර ඇත



**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
සභාපතිනිය



**කේ. ටී. ඩී. ඩී. ද සිල්වා මිය**
සමාගම් ලේකම්

30/04/2020

# මූල්‍ය වාර්තාකරණයේ පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

**වගකීම**

2007 අංක 12 දරණ බැංකු පනතෙහි 3 (8) (ii) (b), වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සමාගම් බැංකුවේ ('බැංකුව') ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය හා ඵලදායීතාවය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ('මණ්ඩලය') වගකිව යුතුය. එසේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සලකා බැලීමේදී, බැංකුකරණ ව්‍යාපාරයේදී කළමනාකරණ පදනමක් මත අවදානම, ප්‍රතිඵල සමඟ සමතුලිත කිරීම අවශ්‍ය බව මණ්ඩලය හඳුනාගෙන ඇත. එම නිසා අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි අවදානම් රුචිය අයත් වන සීමාවන්ගෙන් සහ දර්ශක වලින් බැහැරවීම් ඉස්මතු කිරීමේ අරමුණින් ය.

මේ අනුව බලන කල, අභ්‍යන්තර පාලන ක්‍රමයට සැපයිය හැක්කේ මූල්‍ය තොරතුරු සහ වාර්තා අවප්‍රකාශවීම් වලට එරෙහිව හෝ මූල්‍ය අලාභ හෝ වංචාවන්ට එරෙහිව සාධාරණ, නමුත් නිරපේක්ෂ නොවන සහතිකයක් පමණි.

බැංකුව මුහුණ දී ඇති සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලය විසින් අඛණ්ඩ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇත. ව්‍යාපාරික පරිසරයෙහි හෝ නියාමන මාර්ගෝපදේශවල වෙනස්කම් සිදු වන විටදී මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීමද මෙම ක්‍රියාවලියට ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂකවරුන් සඳහා වන මාර්ගෝපදේශය' ට අනුකූලව මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ. එම මාර්ගෝපදේශනයේ දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා ගිණුම් මූලධර්ම සැලකිල්ලට ගනිමින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය පූර්ණ සහ ප්‍රමාණවත් වන බව මණ්ඩලයේ මතය වේ. එමෙන්ම බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, අදාල ගිණුම්කරණ මූලධර්ම වලට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බවත් මණ්ඩලය විසින් පිළිගනියි.

අවදානම් සහ පාලනය පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීමෙන් සහ මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම තුළින් කලමණාකාරිත්වය මණ්ඩලයට සහයෝගය දක්වයි.

**මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම් යෙදීමේදී සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී යොදාගත් ක්‍රියාවලියේ ප්‍රධාන අංග**

- බැංකුවේ දෛනික මෙහෙයුම් වල ඵලදායීතාවය සහ බැංකුවේ මෙහෙයුම්හි ආයතනික අරමුණු, උපායමාර්ග සහ වාර්ෂික අයවැය මෙන්ම අනුමත කර ඇති ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික උපදෙස් වලට අනුකූල වන බවට සහතික කිරීම සඳහා මණ්ඩලයට සහාය වීම පිණිස විවිධ කමිටු මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ඔවුන්ගේ විගණන ක්‍රියාවලිය අතරතුරදී දී අභ්‍යන්තර පාලන පද්ධති වල ඵලදායීතාවය සහ ඒවා ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූල වන්නේද යන්න පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කරයි. මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලද වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව ශාඛා හා දෙපාර්තමේන්තු වල විගණනයන් සිදු කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර විගණන වල අනාවරණයන් සහ ඔවුන් විසින් සිදුකරන ලද බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම විගණන කමිටුව විසින් සමාලෝචනය කරයි. විගණන කටයුතු සහ අනුමත විගණන සැලැස්ම ආවරණය කිරීමේ විෂය පථය හා ප්‍රමාණවත්ද යන බව සහ ඒ සඳහා අවශ්‍ය වන වැඩිදියුණු කිරීම් ද කමිටුව විසින් සමාලෝචනය කරයි.

- බාහිර විගණක, නියාමන අධිකාරීන් සහ කළමනාකාරිත්වය විසින් හඳුනාගෙන ඇති අභ්‍යන්තර පාලන ගැටළු බැංකුවේ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරන අතර අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය ද ඇගයීමට ලක් කරයි. එමෙන්ම, අවදානම් කලමණාකරනය, විගණන වල විෂය පථය සහ අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කමිටුව විසින් අභ්‍යන්තර විගණන ක්‍රියාවන් සමාලෝචනය කරයි. මණ්ඩල විගණන කමිටු රැස්වීම්වල සභා ආවර්තික පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම්වලදී සභාගත කරනු ලැබේ. බැංකුවේ විගණන කමිටුව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර තොරතුරු 99 වන පිටුවේ 'මණ්ඩල විගණන කමිටු වාර්තාවේ' දක්වා ඇත.

- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය තක්සේරු කිරීමේදී, බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් සැලකිය යුතු ගිණුම් හා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයන් හා සම්බන්ධ සියලුම ක්‍රියා පටිපාටි සහ පාලනයන් ඒකාබද්ධ කරන ලදි. ඒවායේ සැලසුම් යෝග්‍යතාවය සහ ඵලදායීතාවය සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මේවා අඛණ්ඩ පදනමක් මත පිළිවෙලින් නිරීක්ෂණය කොට පරීක්ෂා කරන ලදී. මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂය තුළ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයට අදාලව බාහිර විගණකවරුන් විසින් පළ කරන ලද අදහස් / නිර්දේශයන් සැලකිල්ලට ගනු ලැබේ.

## තහවුරු කිරීම

ඉහත ක්‍රියාදාමයන් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා වන අතර එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදු කර ඇති බව මණ්ඩලය සනාථ කරයි.

## බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කිරීම

බාහිර විගණකවරයා වන විගණකාධිපතිවරයා විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධව ඉහත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කර ඇත. එහිදී විගණකාධිපතිවරයා විසින් බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ සැලසුම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධයට අනුව නොගැළපීම් කිසිත් අවධානයට යොමු වී නොමැති බව මණ්ඩලයට වාර්තා කර ඇත. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ ඔවුන්ගේ ස්වාධීන තහවුරු කිරීමේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 90 සිට 91 දක්වා පිටුවල දක්වා ඇත.

මණ්ඩලයේ නියෝගය අනුව,

**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
*සභාපතිනිය*
2020 පෙබරවාරි 07

**මහාචාර්ය කේ.ඩී ගුණවර්ධන මහතා**
*විගණන කමිටු සභාපති*
2020 පෙබරවාරි 07

**පාලිත ගමගේ මහතා**
*සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී*
2020 පෙබරවාරි 07
කොළඹ

# අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික



**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**



මගේ අංකය எனது இல. My No. } BAF/ 01/C/HDFC/IC/19/17 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 27 April 2020

සභාපති

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සමාගම් බැංකුව

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සමාගම් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සහතික කිරීමේ වාර්තාව**

---

**හැඳින්වීම**

මෙම වාර්තාව මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සමාගම් බැංකුවේ 2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ අඩංගු වූ මූල්‍ය වාර්තාකරණය (වාර්තාව) අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සහතික කරයි.

**කළමනාකාරිත්වයේ වගකීම**

2007 අංක 12 දරණ බැංකු පනතේ 3 (8)(ii)(ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා බැංකු අධ්‍යක්ෂවරුන් වෙත මග පෙන්වීම" සමග අනුකූල වන පරිදි ප්‍රකාශය සැකසීම හා ඉදිරිපත්කිරීමට කළමනාකාරිත්වය වගකිව යුතුය.

**SLSAE 3050 සමග අනුකූල වීම සම්බන්ධයෙන් මගේ වගකීම**

මෙම ප්‍රකාශය සැකසීම පිළිබඳව වාර්තාවක් මණ්ඩලය වෙත නිකුත් කිරීම මාගේ වගකීමයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කර ලද සහතික කිරීමේ කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය SLSAE 3050 - අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයන්ට අනුකූලව මම මගේ කටයුතු සිදු කළෙමි.

**ඉටු කරන ලද කාර්යයේ සාරාංශය.**

සකස් කරන ලද ලියකියවිලි මගින් අධ්‍යක්ෂවරුන් වෙත හෝ ප්‍රකාශයට සහාය දක්වන්නේද යන්න සහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති ක්‍රියාලිය තක්සේරු කිරීම සඳහා මම මගේ මැදිහත්වීම සිදු කර ඇත.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සිදු කරන ලද ක්‍රියා පටිපාටීන් මූලික වශයෙන් බැංකු සේවකයින්ගේ විමසීම් වලට සීමාව ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියලියට සහාය වන නියැදි පදනමක් මත ලියකියවිලි ගොඩනගා ඇත. SLSAE 3050 මගින් බැංකුවේ සියලු අවදානම් හා පාලනයන් සැලකීමට හෝ බැංකුවේ වී සඳහා වූ ක්‍රියාවලීන්ගේ ඵලදායීතාව ගැන අදහස් පළ කිරීමට අවශ්‍ය බව නොදක්වයි. වාර්ෂික වාර්තාවෙන් හෙළි වන කිසියම් වැදගත් ගැටලුවක ද්‍රව්‍යමය අභ්‍යන්තර පාලන පැතිකඩ සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කර ඇති ක්‍රියාදාමයන්  වශයෙන්ම ගැටලුවලට පිළියම් සපයන්නේද යන්න සලකා බැලීමට ද LSAE 3050 මගින් අවශ්‍යතාවක් දක්වා නොමැත.

**නිගමනය**

සිදුකරන ලද ක්‍රියා පටිපාටිය පදනම්ව අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම් සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති ක්‍රියාවලිය පිළිබඳ වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය නොගැළපෙන බවට විශ්වාස කිරීමට හේතු වන කිසිවක් මගේ අවධානයට යොමු වී නොමැත.

**ඩබ්. පී. සී. චිත්‍රමරත්න**

විගණකාධිපති

# Assurance Report of the Auditor General on Corporate Governance


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. } BAF/ 01/C/HDFC/CG/19/18 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 27 April 2020

සභාපති

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සමාගම් බැංකුව

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය නියෝග සඳහා අනුකූලතාව පිළිබඳව ශ්‍රී ලංකා HDFC බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සමාගම් බැංකුවේ කරුණු සොයා ගැනීම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

---

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන වාර්තාවට අදාළව මෙම වාර්තාවට ඇමුණුම 01 හි දක්වා ඇති ක්‍රියා පටිපාටි මම ඉටු කර ඇත්තෙමි. එකඟ වූ ක්‍රියා පටිපාටි කටයුතුවලට බලපාන අදාළ සේවාවන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතීන් 4400 (SLSRS4400) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම කටයුතු සිදු කර ඇත. ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා ඔබට සහාය වීම සඳහා පමණක් මෙම ක්‍රියා පටිපාටි සිදු කරනලදී.

අමුණා ඇති ඇමුණුම - 01. හි මගේ සොයාගැනීම් මෙම වාර්තාවට එක් කරමි.

ඉහත ක්‍රියා පටිපාටීන් ශ්‍රී ලංකා විගණ ප්‍රමිතිවලට හෝ සමාලෝචන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව කරන ලද විගණනයක් හෝ සමාලෝචනයක් නොවන හෙයින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනයේ නියමයන්ට අනුකූල වීම පිළිබඳව මම කිසිදු සහතිකයක් ලබාදීම පිළිබඳ සඳහන් නොකරන්නෙමි.

සමාලෝචන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට හෝ ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව මා අතිරේක ක්‍රියා පටිපාටියක් සිදු කර ඇත්නම් හෝ පාලන වාර්තාව විගණනයක් හෝ සමාලෝචනයක් කර තිබේ නම් වෙනත් කරුණු ඔබ වෙත වාර්තා කිරීමට හැකියාව තිබිණි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ වාර්තාව මෙම වාර්තාවේ පළමු ඡේදයේ දක්වා ඇති අරමුණු සඳහා සහ ඔබේ දැනුවත්භාවය සඳහා ම පමණක් වන අතර එය වෙනත් කිසිදු කටයුත්තක් සඳහා භාවිතයට හෝ වෙනත් පාර්ශවයක් වෙත බෙදා හැරීමට නොවේ.

මෙම වාර්තාව ඉහත දක්වා ඇති අයිතමවලට පමණක් සම්බන්ධ වන අතර සමස්තයක් ලෙස ගත් විට ශ්‍රී ලංකා HDFC බැංකුවේ කිසිදු මූල්‍ය ප්‍රකාශයක් දක්වා විහිදෙන්නේ නැත.

**ඩබ්. පී. සී. වික්‍රමරත්න**

විගණකාධිපති

# මණ්ඩල අනු කමිටු වාර්තා

### මණ්ඩල මානව සම්පත් හා පාරිතෝෂික කමිටුව

මානව සම්පත් හා පාරිතෝෂික ප්‍රතිපත්ති ප්‍රකාශ කිරීම සහ බැංකුවේ ඵලදායී මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග සකස් කිරීම සඳහා BHRRC ප්‍රධාන වශයෙන් වගකිව යුතුය. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ, කාරක සභාවේ අදාළ විෂය පථය පුළුල් කිරීම සඳහා ඉහත කාරක සභාවේ විමර්ශන කොන්දේසි සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

ඒ අනුව මානව සම්පත් හා පාරිතෝෂික කමිටුව පහත දැක්වෙන වගකීම දරයි.

01. ප්‍රධාන විධායක නිලධාරි (CEO) සහ බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ වැටුප් ප්‍රදානය (වැටුප් දීමනා සහ අනෙකුත් මුදල් ගෙවීම්) තීරණය කිරීම.

02. ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ඉලක්ක හා අරමුණු නිර්ණය කිරීම.

03. නියමිත වේලාවට නියමිත ඉලක්ක සඳහා ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය වරින් වර ඇගයීමට ලක් කළ යුතු අතර වේතනය, ප්‍රතිලාභ සහ වෙනත් ගෙවීම් කාර්ය සාධනය මත පදනම් වූ දිරිගැන්වීම් සංශෝධනය කිරීමේ පදනම තීරණය කළ යුතුය.

04. තනතුරු නාම වෙනස් කිරීම.

05. බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සියලුම දේශීය හා විදේශීය පුහුණුවීම් සහ විදේශීය සම්මන්ත්‍රණවලට සහභාගී වීම.

06. කාර්ය මණ්ඩලයේ සේවා කාලයන් දීර්ඝ කිරීම.

07. විනය කටයුතු පිළිබඳ තීරණ ගැනීම / හෝ අභියාචනා තීරණය කිරීම (බැංකුවේ විනය සංග්‍රහය යටතේ අවශ්‍ය නම්)

08. සේවකයින්ගේ දුක්ගැනවිලි පිළිබඳ ඕනෑම අභියාචනයක් විමසීම.

09. කළමනාකරණ අධිකාරියේ මට්ටමෙන් ඔබ්බට සේවක සම්බන්ධ සියලු කරුණු (මණ්ඩලයේ අධිකාරිය යටතේ ඇති නිශ්චිත කරුණු හැර).

10. කාරක සභාව සඳහා සුදුසු විමර්ශන කොන්දේසි අනුගමනය කිරීම සහ එය සමාලෝචනය / සංශෝධනය කිරීම

### මණ්ඩලය වෙත කෙරෙන නිර්දේශ

කාරක සභාවට සහ විශේෂයෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ නිර්දේශ අධ්‍යයනය කිරීම

01. CBEU සමඟ බැංකුවේ සාමූහික ගිවිසුම.

02. බැංකුව සඳහා ආයතනික ව්‍යුහය.

03. අත්‍යවශ්‍ය සේවක බඳවා ගැනීම්, සේවක බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR).

04. නව තනතුරු හෝ තනතුරු, ස්ථානගත කිරීම්, සේවක හා සේවක අයවැය නිර්මාණය කිරීම.

05. සියලුම මානව සම්පත් සම්බන්ධ අදාළ ප්‍රතිපත්ති.

06. විනය කටයුතු පිළිබඳ තීරණ / අභියාචනා සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම (බැංකුවේ විනය සංග්‍රහය යටතේ අවශ්‍ය නම්).

07. කළමනාකරණ හා මානව සම්පත් කමිටු අධිකාරි මට්ටම් වලින් ඔබ්බට ගිය සේවක සම්බන්ධ සියලු කරුණු.

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ කාරක සභාව ඔවුන්ට පවරා ඇති අදාළ වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගත් අතර ඒ අනුව කාර්ය මණ්ඩලයට අදාළ වැදගත් ප්‍රතිපත්ති කිහිපයක් නිර්දේශ කිරීමට සමත් විය.

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලදී.

කාරක සභාවේ සාමාජිකත්වය සහ කමිටු රැස්වීම් පැමිණීම වාර්ෂික වාර්තාවේ 80 වන පිටුවේ දක්වා ඇත.

**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
සභාපතිනිය

**දර්ශනි ද සිල්වා මිය**
සමාගම් ලේකම්

කොළඹ,
30/04/2020

## මණ්ඩල නාමයෝජනා කමිටුව

නාමයෝජනා කමිටුව විසින් අධ්‍යක්ෂකවරුන් සහ මුඛ්‍ය කළමනාකරණ සාමාජිකයන් උදෙසා අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට මෙන්ම, පහත දෑ සඳහා ප්‍රධාන වශයෙන් වගකියනු ලැබේ.

- 01. නව අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ මුඛ්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය තොරා ගැනීම/ පත් කර ගැනීම සඳහා ක්‍රියාමාලාවක් ක්‍රියාත්මක කිරීමට.

- 02. සමස්තයක් ලෙස මණ්ඩලයේ වගකීම්වලින් නිදහස් වීම අවධාරණය කරමින්, ඒ සඳහා අධ්‍යක්ෂකවරයා විසින් සිදු කරන ලද කාර්යසාධනය සහ දායකත්වය සැලකිල්ලට ගනිමින්, වත්මන් අධ්‍යක්ෂකවරුන් යළි තෝරා පත් කර ගැනීම සඳහා නිර්දේශන සකස් කිරීමට.

- 03. ප්‍රධාන විධායක නිලධාරී තනතුර සහ මුඛ්‍ය කළමනාකරණ තනතුරු සඳහා පත් කිරීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීමට සලකා බැලීම සඳහා යෝග්‍යතාවට අවශ්‍ය වන සුදුසුකම්, අත්දැකීම් සහ මුඛ්‍ය උපලක්ෂණ වැනි යෝග්‍ය නිර්ණායකයන් අනුගමනය කිරීමට.

- 04. ව්‍යවස්ථාවන්හි දක්වා ඇති පරිදි සහ දී ඇති විධාන 3(3) හි නිශ්චය කොට ඇති පරිදි ධූරයට පත් වීම සඳහා අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ මුඛ්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩලය උචිත සහ නිසි පුද්ගලයන් වන බව තහවුරු කිරීම පිණිස යෝග්‍ය පද්ධතියක් අනුගමනය කිරීමට.

- 05. විශ්‍රාමික අධ්‍යක්ෂකවරුන් සහ මුඛ්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික පිළියෙල කිරීම් සහ අතිරේක/ නව ප්‍රවීණතාව සඳහා අවශ්‍යතා (කලින් කලට) නිර්දේශ කිරීමට.

ඉහත දක්වා ඇති පරිදි, නාමයෝනා කමිටුවේ විධිනියෝගයට අනුව, සමාලෝචනයට යටත් කාලපරිච්ඡේදය අතරතුර දී කමිටුව විසින් අවශ්‍ය මූලිකත්වයන් සිදු කරන ලදී.

කමිටුවේ සාමාජිකත්වය සහ රැස්වීමෙහි දී කමිටු සාමාජිකයන්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ 80 වැනි පිටුවෙහි දක්වා ඇත. නාමයෝජනා කමිටුව විසින් 2019 වර්ෂය අතරතුර දී පස් (05) වරක් රැස් වන ලදී.

**ආර්.එම්.ආර්.ඩබ්ලිව් මංචනායක මිය**
සභාපතිනිය

**දර්ශනී ද සිල්වා මහත්මිය**
සමාගම් ලේකම්

2020/04/30 දින,
කොළඹ දී ය.

# මණ්ඩල අනු කමිටු වාර්තා

### මණ්ඩල අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව

මණ්ඩල අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ආරම්භ කිරීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු අතර අදාළ අධිකාරිය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (BIRMC) පවරා ඇත. මහ බැංකුවේ (CBSL) මාර්ගෝපදේශයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ විමර්ශන කොන්දේසි (TOR) මත සංයුතිය, කාර්යයේ විෂය පථය සහ කාරක සභා කටයුතු පදනම් විය.

#### විෂයපථය හා කැපවීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලන මග පෙන්වීම යටතේ පහත දැක්වෙන බලතල සඳහා BIRMC පිහිටුවා ඇත.

01. කාරක සභාව විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග ඉතා සමීපව කටයුතු කළ යුතු අතර කාරක සභාව සඳහා පවරනු ලබන අධිකාරියේ වගකීම හා රාමුව ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.

02. අදාළ අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු මගින් සෑම අවදානමක්ම වනම් ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ මූලෝපායික අවදානම් ඇතුළු බැංකුවේ සියළුම අවදානම් මාසිකව ගණනය කළ යුතුය.

03. කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ වම අවදානම් කළමනාකරණය සඳහා වන ණය කමිටුව සහ වත්කම්-වග කීම් කමිටුව වැනි සියළු කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මකතාව හා කාර්යක්ෂමතාව සමාලෝචනය කරනු ලබයි.

04. බැංකුවේ ප්‍රතිපත්ති සහ රෙගුලාසි හා අධීක්ෂණ අවශ්‍යතා අනුව කමිටුව තීරණය කළ විචක්ෂණ මට්ටම් ඉක්මවන විශේෂිත අවදානම් හේතුවෙන් වන බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාරක සභාව විසින් ගත යුතු වේ. බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නිකුත් කරන ලද උපදෙස්, තීරණයන් සහ චක්‍රලේඛණ ද සලකා බලමින් ක්‍රියාමාර්ග ගත යුතු වේ.

05. යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු අංශ තක්සේරු කිරීම සඳහා කමිටුව අවම වශයෙන් කාර්තුමය වශයෙන් රැස්විය යුතුය.

06. කමිටුව e-රැස්වීම් පද්ධතියේ කොටසක් ලෙස ස්ථාපිත කර ඇති පරිදි පුවරු ඇසුරුම් මගින් කාලෝචිත වාර්තා ලබා ගත යුතුය.

07. නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරෙහිව කාරක සභාව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර කමිටුව විසින් නිර්දේශ කරනු ලබන පරිදි සහ / හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ උපදෙස් පරිදි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.

08. මණ්ඩලයේ අදහස්, විකඟතාව සහ / හෝ නිශ්චිත උපදෙස් සොයමින් කමිටුව සෑම රැස්වීමකින්ම සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

09. ව්‍යාපාර මෙහෙයුම් වල සියලුම අංශ සම්බන්ධයෙන් බැංකුවේ නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති වලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කළ යුතුය. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් තෝරාගත් කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කාර්යය ඉටුකර වරින් වර කමිටුවට වාර්තා කළ යුතුය.

#### සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේද තුළදී, පහත දැක්වෙන්නේ BIRMC විසින් ආවරණය කරන ලද ප්‍රධාන ප්‍රදේශ

- IT තොරතුරු තාක්ෂණ මෙහෙයුම් හා සම්බන්ධ අවදානම් ඇතුළුව ණය, මෙහෙයුම්, උපායමාර්ගික, මූල්‍ය හා ද්‍රවශීලතා අවදානම් ආවරණය වන පරිදි අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ මැනීම.

- අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වල විෂය පථය සහ ආවරණය ශක්තිමත් කිරීම සහ බැංකුවේ සංශෝධිත හා වැඩිදියුණු කරන ලද ICAAP ක්‍රියාත්මක කිරීම, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් වැඩිදියුණු කිරීම, ආදර්ශ අවදානම් කළමනාකරණ රාමුවක් හඳුන්වා දීම සහ අවදානම් කළමනාකරණය අවදානම් කළමනාකරණය මුල පිරීම්.

- ණය අවදානම් ශ්‍රේණිගත කිරීමේ සීමාව මිලියන 2.5 සිට මිලියන 1.5 දක්වා අඩු කිරීම, අභ්‍යන්තර අවදානම් වර්ගීකරණ පද්ධතිය නැවත සකස් කිරීම සහ LRM තක්සේරුව තීව්‍ර කිරීම සඳහා විෂය පථය සහ ආවරණය වැඩි දියුණු කිරීම තුළින් ණය අවදානම ශක්තිමත් කිරීම.

- ණය අනුමත කිරීම් විධිමත් කිරීම සහ ආපසු හැරවීමේ වේලාවන් සහ කඩදාසි භාවිතය සැලකිය යුතු ලෙස අඩු කිරීම අපේක්ෂාවෙන් අන්තර්ජාලය හරහා ණය අනුමත කිරීමේ පද්ධතිය වන LOS සංවර්ධනය කිරීම.

- ප්‍රධාන අවදානම් දර්ශක වෙනස් කිරීමෙන් උපකරණ පුවරු හරහා අවදානම් අධීක්ෂණය වැඩි දියුණු කිරීම සහ වරින් වර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා මණ්ඩලයට වාර්තා කිරීම.

බැංකුවේ කිසිදු නියාමන හෝ අධීක්ෂණ ගැටලු හෝ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු හෝ මහ බැංකුවේ උපදෙස් වලට අනුකූල නොවීම් නොමැති බව කම්ටුව සනාථ කරයි. මෙහිදී මහ බැංකුවේ  බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ මුදල් මණ්ඩලය විසින් මහජනතාවට හෙළි කළ යුතු යැයි ලබාදුන් නිර්දේශ මෙන්ම එවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව ගෙන ඇති ක්‍රියාමාර්ගද සමඟ මහජනතාවට හෙළිකිරීම පිළිබඳ ලබාදෙන ලද මාර්ගෝපදේශ ඇතුලත් වේ.

කාරක සභාවේ සාමාජිකත්වය සහ කම්ටු සාමාජිකයින්ගේ රැස්වීම වාර්ෂික වාර්තාවේ 81 වන පිටුවෙහි දක්වා ඇත. සමාලෝචනය කරන ලද කාල පරිච්ඡේදය තුළ කාරක සභාව හතර වතාවක් (04) රැස්විය.

**එන්. විජයනාතන් මහතා**
සභාපති

**දර්ශනි ද සිල්වා මිය**
සමාගම් ලේකම්

කොළඹ,
30/04/2020

# මණ්ඩල අනු කමිටු වාර්තා

### මණ්ඩල සම්බන්ධිද පාර්ශව ගනුදෙනු (Related Party Transactions – RPT)

අධීක්ෂණ කමිටුව වරින් වර බැංකුවේ නියාමකයින් (සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, (SEC), කොළඹ කොටස් හුවමාරුව (CSE) සහ මහ බැංකුව (CBSL) වැනි නියාමකයින් විසින් නියම කර ඇති පරිදි අදාළ පාර්ශවීය ගනුදෙනු අධීක්ෂණය කිරීමේ වගකීම අදාළ පක්ෂ ගනුදෙනු අධීක්ෂණ කමිටුව සතු වේ.

### විෂය පථය සහ කැපවීම

- HDFC හි නියාමකයින්ගේ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ උපදෙස් අනුව නියම කර ඇති පරිදි අදාළ පාර්ශවීය ගනුදෙනු වලින් ඇතිවිය හැකි ඕනෑම ගැටුම් පරිපාලනය කිරීම කමිටුව සතු වගකීමකි.

- බැංකුවේ යහපත උදෙසා බැංකු කටයුතු සිදු කෙරෙන බවට සහතික වීම සහ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, ප්‍රධාන කළමනාකරණය හෝ සැලකිය යුතු කොටස් හිමියන් ඔවුන්ගේ වාසි සඳහා ඔවුන්ගේ තනතුරෙන් ප්‍රයෝජන ගැනීම වැළැක්වීම.

- ඒ අනුව, RPT සමඟ දිගින් දිගටම කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC කේතය) සහ කොළඹ කොටස් වෙළඳපොලේ විධිවිධානවලට අනුකූලව කමිටුව වගකීම දරයි. (කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ නීති)

- එබැවින්, කාරක සභාව විසින් අදාළ පක්ෂ ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති අතර HDFC බැංකුවේ RPT ගනුදෙනු නිර්වචනය කිරීම සඳහා එහි කොන්දේසි මාලාව (TOR) වේ. අදාළ පාර්ශවීය ගනුදෙනු සමඟ කටයුතු කිරීමේදී, අදාළ පාර්ශවයන්ට හිතකර ලෙස සැලකීමක් සිදු නොවන බවට කමිටුව සහතික කරයි.

- තවද, කාරක සභාව විසින් මූල්‍ය වර්ෂය තුළ සමාලෝචනය කරන ලද අදාළ පාර්ශවීය ගනුදෙනු පිළිබඳ අදහස් / නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දී ඇත.

- ඉහත කරුණුවලට අමතරව, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ (කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ රීති) ලැයිස්තුගත කිරීමේ රීති 9 වන වගන්තියට අනුව වාර්ෂික වාර්තාවේ RPT

- තවද, RPT පිළිබඳ අදාළ තොරතුරු ග්‍රහණය කර පෝෂණය කිරීම සඳහා අධීක්ෂණ පද්ධති ක්‍රියාත්මක වන අතර, බැංකු කළමණාකරන පුද්ගලයින් (KMP), අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන් (CFM) පිළිබඳ තොරතුරු බැංකු දත්ත වකතු කිරීමේ පද්ධතියට ඇතුළත් වන අතර එම තොරතුරු වල නිරවද්‍යතාවය ද ඇතුළත් ය.

### අදාළ පාර්ශවීය ගනුදෙනු සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය සහ බැංකුව

අදාළ පාර්ශවීය කමිටුව, මණ්ඩලයේ අනුමැතිය ඇතිව, අදාළ පාර්ශවීය ගනුදෙනු විධිමත් කිරීම සඳහා අදාළ පක්ෂ ප්‍රතිපත්තියක් සහ කොන්දේසි මාලාවක් (TOR) සම්මත කර ගත් අතර, අදාළ පාර්ශව ගනුදෙනු සඳහා බැංකුවේ කිසිදු වාසිදායක ප්‍රතිකාරයක් ලබා නොදෙන බවට සහතික කිරීම සඳහා අදාළ පාර්ශවීය ගනුදෙනු පිළිබඳ දීර්ඝ ප්‍රතිපත්ති අනුගමනය කරයි. තවද, අදාළ පාර්ශවීය ගනුදෙනු සම්බන්ධයෙන් බැංකුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය එහි නියම කර ඇත. වරින් වර කමිටුව විසින් පවත්නා ප්‍රතිපත්තිය සමාලෝචනය කළ යුතු අතර අවශ්‍යතා මත කොන්දේසි මාලාවක් (TOR) අවශ්‍ය වන අතර අදාළ සංශෝධන අවශ්‍යතාවල පදනම මත සිදු කෙරේ.

### කමිටු රැස්වීම්

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළදී කාරක සභාව අදාළ පාර්ශවීය ගනුදෙනු සමාලෝචනය කර ඇති අතර අදහස් / නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කර ඇත.

### සාමාජිකත්වය

කාරක සභාවේ සාමාජිකත්වය සහ කමිටු සාමාජිකයින්ගේ රැස්වීම් වාර්ෂික වාර්තාවේ 82 වන පිටුවේ දක්වා ඇත. සමාලෝචනය කරන ලද කාල පරිච්ඡේදය තුළ කාරක සභාව හතර වතාවක් (04) රැස්විය.



**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
සභාපතිනිය



**දර්ශනි ද සිල්වා මිය**
සමාගම් ලේකම්

කොළඹ,
30/04/2020

## අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය සහ සුරුකුම්පත් සහ සුරුකුම්පත් හා ඒකාබද්ධව නිකුත් කරන ලද කොළඹ කොටස් වෙළඳපොලේ "ලැයිස්තුගත කිරීමේ රීති" සහ ආයතනික පාලනය පිළිබඳ හොඳම පිළිවෙත් සංග්‍රහයට අනුකූල වීම සඳහා විගණන කමිටුව මෙම වාර්තාව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලන අවශ්‍යතාවයන්ට අනුකූල වීම. කාරක සභාවේ ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද ප්‍රතිපත්තිය මත පදනම්ව මණ්ඩල විගණන කමිටුවෙහි (BAC) හි ක්‍රියා පටිපාටි පදනම් විය.

වර්ෂය අවසානයේ දී විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් මෙම කමිටුව සමන්විත වේ.

- මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන (සභාපති)
- යූ.එච්.සී ප්‍රියන්ත මහතා
- එන්.ආර්. අනීස් මිය

BAC රැස්වීමක් සඳහා ගණපූරණයට සාමාජිකයින් දෙදෙනෙකු (02) වේ.

ප්‍රධාන අභ්‍යන්තර විගණක BAC හි ලේකම් ලෙස කටයුතු කරයි. ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ විගණකාධිපතිගේ නියෝජිතයා ද BAC රැස්වීම්වලට සහභාගී වෙති.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ අනෙකුත් නිලධාරීන් ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගී වේ.

### විශේෂයෙන් BAC මගින්

- මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කරයි.
- ව්‍යාපාර අවදානම් අභ්‍යන්තර පාලන හා කළමනාකරණ පද්ධතිය පරීක්ෂා කරයි.
- විගණන ක්‍රියාවලීන් බාහිර හා අභ්‍යන්තර වශයෙන් සමාලෝචනය කරයි.
- නීති හා රෙගුලාසි වලට අනුකූල වීම සහ විශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ අධීක්ෂණය කිරීම සඳහා වන ක්‍රියා පටිපාටි සමාලෝචනය කරයි.

**සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කාරක සභාව පහත සඳහන් කරුණු වලට සහභාගී විය.**

a) 2019 වර්ෂය සඳහා බැංකුවේ ක්ෂේත්‍රවල අවදානම් පැතිකඩ මත පදනම්ව සකස් කරන ලද වාර්ෂික විගණන සැලැස්ම අනුමත කිරීම.
b) 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (7) (අ) වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාව සමාලෝචනය කිරීම සහ සාකච්ඡා කිරීම.
c) බැංකුවේ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ප්‍රකාශයට පත් කිරීම සඳහා නිර්දේශ කර ඇත.
d) 2017/2018 මහ බැංකුවේ ව්‍යවස්ථාපිත විභාග සහ පසු විපරම් විභාගවලදී මතු කරන ලද කරුණු සමාලෝචනය කර සාකච්ඡා කරන ලද අතර නිවැරදි කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
e) අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය.
f) තොරතුරු පද්ධති විගණන ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සහ සුදුසු වෙනස්කම් නිර්දේශ කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.

රැස්වීම් පහක් (05) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ පවත්වන ලදී. අභ්‍යන්තර විගණන වාර්තා, එහි නිරීක්ෂණය කරන ලද අඩුපාඩු, අදාළ දෙපාර්තමේන්තු / ශාඛා ප්‍රධානීන් විසින් දක්වන ලද ප්‍රතිචාර සහ නිරීක්ෂණය කරන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව BAC හිදී සලකා බැලිය. BAC රැස්වීම්වල වාර්තා තොරතුරු සඳහා මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

මහ බැංකුවේ ව්‍යවස්ථාපිත විභාග වාර්තා සහ විගණකාධිපති විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් 2019 වර්ෂය තුළ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව ද BAC විසින් පසු විපරම් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීම හා අනුකූල වීම සඳහා විගණකාධිපතිවරයාට අවශ්‍ය සියලු තොරතුරු හා ලේඛන සැපයීම BAC විසින් සහතික කරන ලදී. ප්‍රමාණවත් පාලනයන් හා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බව BAC හි අදහස වන අතර BAC හි ප්‍රතිපත්තිය සියලු ප්‍රධාන අංශවලට අනුකූල විය.



**මහාචාර්ය කේ.ඩී ගුණවර්ධන**
*සභාපති*

මණ්ඩල විගණන කමිටුව
2020 පෙබරවාරි 07

# අධ්‍යක්ෂක මණ්ඩලය




01 **ආර්.එම්.ආර්.ඩබ්ලිව්. මංචනායක** - (සභාපතිනිය) (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)
02 **මහාචාර්ය කේ.ඩී. ගුණවර්ධන** - (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)




03 **ආචාර්ය එස්.එන්. මොරයිස්** - (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)
04 **එන්. විජයනාතන් මහතා** - (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)
05 **ආර්.ඒ. චූලන්ද** - (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

# අධ්‍යක්ෂ මණ්ඩල විස්තර

01

**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය**
(සභාපතිනිය) විධායක නොවන
/ ස්වාධීන අධ්‍යක්ෂ

ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මහත්මිය 2020 ජනවාරි 02 දින සිට බලපැවැත්වෙන පරිදි HDFC බැංකුවේ අධ්‍යක්ෂකවරියක් සහ සභාපතිනිය ලෙස පත් කරන ලදී.

වසන්තා මංචනායක මහත්මිය නීතිඥවරියක වන අතර ඇය 1984 සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තක්සේරුකරුවෙකු ලෙස සම්බන්ධ වූ අතර 2014 දී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් තනතුරට උසස් කර ඇත. පසුව ඇය 2015 සිට 2019 දක්වා මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ බදු ප්‍රතිපත්ති උපදේශකවරියක් ලෙස සේවය කළාය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇයගේ සේවා කාලය තුළ ඇය ව්‍යාපෘති අධ්‍යක්ෂක ලෙස RAMIS ව්‍යාපෘතිය (ස්වයංක්‍රීය ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කිරීම සඳහා දායක වෙමින් සිය සේවය ක්‍රියාකාරීව හා සාර්ථකව සිදු කර ඇත. සිංගප්පූරු ඇ-රාජ්‍ය නායකත්ව මධ්‍යස්ථානය, ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ බදු වංචා විගණනය සහ එකතු කිරීමේ ක්‍රමවේදයන්, මැලේසියාවේ බදු ගිවිසුම් පිළිබඳ සාකච්ඡා, බදු පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන්, පාලන පුහුණුව හා නව්‍යකරණය පිළිබඳ විදේශයන්හි වැඩමුළු සහ පුහුණු වැඩසටහන් කිහිපයකට ඇය සහභාගී වී ඇත. නාග්පූර් සහ දිල්ලිය, පැරිසියේ OECD හුවමාරු මිලකරණය සහ තායිලන්තයේ රාජ්‍ය සේවයේ හොඳම පිළිවෙත් පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ද ලබා ඇත.

වසන්තා මංචනායක මහත්මිය ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක් වන අතර ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිය විශේෂයෙන් කාර්මික කළමනාකරණය පිළිබඳ උපාධිය ලබා ගෙන ඇත. ඇය ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයෙන් විදේශ භාෂා ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි ඩිප්ලෝමාව ලබා ඇත. ශ්‍රී ලංකා නීති විද්‍යාලයට සුදුසුකම් ලබා ඇති ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් උසස් වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් ලබා ඇත. පසුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ඇයට තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව ප්‍රදානය කළ අතර 2009 දී ඇයට රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය පිරිනමන ලදී.

# 02

**මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන**
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

මහාචාර්ය කෙනඩි ඩී. ගුණවර්ධන මහතා ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ අංශයේ ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ මහාචාර්යවරයෙකි.

ඔහුගේ අංශයේ ගිණුම්කරණ මහාචාර්යවරයා වීමට අමතරව, ඔහු අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා මෙන්ම එම විශ්ව විද්‍යාලයේම කළමනාකරණ වැඩසටහන, කළමනාකරණ අධ්‍යයන පීඨ සහ වාණිජ පීඨ සම්බන්ධීකාරක ද වේ. ඔහු උපාධි හා පශ්චාත් උපාධි සිසුන් සඳහා පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය, ගිණුම්කරණ තොරතුරු පද්ධති, ගිණුම්කරණය හා මූල්‍ය විද්‍යාව පිළිබඳ කෘතිම ස්නායුක ජාලයන් උගන්වයි.

මහාචාර්ය ගුණවර්ධන මහතා රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සංවිධාන කිහිපයක සභාපති ලෙස කටයුතු කර ඇති අතර වර්තමානයේ ඔහු ශ්‍රී ජයවර්ධනපුර හි පශ්චාත් උපාධි ආයතනයේ (PIM) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ (IHR) මානව සම්පත් උසස් කිරීමේ ආයතනයේ සින්ඩිකේට් කමිටුවේ සාමාජිකයෙකි.

ආයතනික අංශයේ අනාවැකි සඳහා ගණකාධිකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයට කෘතිම බුද්ධිය සමඟ සම්බන්ධකම් පැවැත්වූ පළමු ශ්‍රී ලාංකිකයා මහාචාර්ය ගුණවර්ධන ය. ඔහු ගිණුම්කරණය සඳහා කෘතිම ස්නායුක ජාලය නමින් නව පාඨමාලා ඒකකයක් නිර්මාණය කර ඇති අතර එය අද විශ්ව විද්‍යාල සිසුන් අතර ඉතා ජනප්‍රිය පාඨමාලාවකි .

මහාචාර්ය ගුණවර්ධන ගණකාධිකරණය, කළමනාකරණ තොරතුරු පද්ධති සහ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ ඔවුන්ගේ MBA වැඩසටහනේ මොරටුව විශ්ව විද්‍යාලයේ, කැලණිය විශ්ව විද්‍යාලයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර පීඨ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. විනිසුරු සම්මන්ත්‍රණ කටයුතු, තවත් ලිපි හා මොනොග්‍රැෆ්, ඉංග්‍රීසි භාෂාවෙන් පෙළ පොත් 6 ක් සහ සිංහල පොත් 3 ක් සමඟ පර්යේෂණ ලිපි 100 කට අධික ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කර ඇති අතර ජාත්‍යන්තර පොත් පරිච්ඡේද 2 ක් ඔහුගේ අක්තපත්‍ර යටතේ ඇත. මහාචාර්ය ගුණවර්ධන ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ ඉගැන්වීම්, පුහුණුව සහ පර්යේෂණ යන අංශවල ඉහළින්ම සිටී. මේ වන විට ඔහු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු ලෙස සේවය කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩල විස්තර

# 03

**ආචාර්ය. එස්. නේවිස් මොරයිස්**
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

ආචාර්ය නෙවිස් මොරයිස් පුළුල් ජාත්‍යන්තර අත්දැකීම් සහිත සංවර්ධන ආර්ථික විද්‍යාඥයෙකි. ඔහු තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයෙන් ආචාර්ය උපාධිය ලබාගත් අතර එම අධ්‍යයන කටයුතු සිදුකරන ලද්දේ ADB විසින් ලබාදුන් ශිෂ්‍යත්වයකිනි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබාගෙන ඇත. දැනට ඔහු ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨාධිපති ලෙස සේවය කරයි. ඉගැන්වීම, පර්යේෂණ, අධ්‍යයන පරිපාලනය සහ ජාතික සංවර්ධන මායිම් පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති ඔහු රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල දේශීය හා විදේශීය ප්‍රතිපත්ති සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටී. පශ්චාත් යුධ ආර්ථික පරිවර්තනයේ පුළුල් මායිමේ වැඩ කරමින්, ඔහුගේ යෙදවුම් 2014 සිට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මානව සංවර්ධන වාර්තාවලට සම්බන්ධ වෘත්තීය කණ්ඩායම් විසින් ධනාත්මකව ඇගයීමට ලක් කර ඇත. ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් තුළින් ජනතාව සවිබල ගැන්වීමට  ගත හැකි ප්‍රායෝගික ක්‍රියාමාර්ග පිළිබඳව ද ඔහු දැඩි උනන්දුවක් දැක්වීය. එමෙන්ම ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන බැංකු අංශයේ බැංකු නිලධාරීන් සවිබල ගැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව ප්‍රධාන විශ්ව විද්‍යාල වැඩසටහනක් සංවර්ධනය කිරීමට ඉවහල් විය. ඔහු විසින් සැලසුම් කරන ලද අනෙකුත් වැඩසටහන් අතර, ක්ෂුද්‍ර මූල්‍ය පර්යේෂණ වැඩසටහන සහ ස්වීඩනයේ ලුන්ඩ් විශ්ව විද්‍යාලය ද කැපී පෙනේ. එක්සත් රාජධානිය, දකුණු අප්‍රිකාව, උගන්ඩාව සහ වෙනත් රටවල ගෝලීය සම්මන්ත්‍රණවල ශ්‍රී ලාංකික තරුණ සංවර්ධන පුහුණුව සම්බන්ධ ගැටළු ද ඔහු ජාත්‍යන්තරව නියෝජනය කර ඇත.

විශේෂයෙන්ම ඔවුන්ගේ ජීවනෝපාය නංවාලීම අරමුණු කරගත් ව්‍යාපෘතිවල ගැටුම්වලින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් වැඩ කිරීමේ අත්දැකීම් ආචාර්ය මොරයිස් සතුව ඇත. විද්වත් දෘෂ්ටි කෝණයකින් පමණක් නොව, යුද්ධයෙන් වූ විනාශය අත්විඳින කෙනෙකුගේ දෘෂ්ටි කෝණයෙන් ද රටපුරා ආන්තිකකරණයට ලක්වූවන්ගේ සමාජ-ආර්ථික ගැටලු සමඟ සම්බන්ධ වීමට මෙය ඔහුට හැකියාව ලබා දෙයි. ඔහු භෞතික හා ද්‍රව්‍යමය සංවර්ධනය හා අධ්‍යාත්මික හා සංස්කෘතික සංවර්ධනය අතර නිසි සමබරතාවයක් ඇති මානව වර්ගයාගේ සමස්ථ සංවර්ධනය කෙරෙහි දැඩි විශ්වාසයක් ඇති සංවර්ධන ආර්ථික විද්‍යාඥයෙකි.

# 04

**එන්. විජයනතන් මහතා.**
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

නිරුපන් විජයනාදන් මහතා වේල්සයේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. සාමාන්‍ය බැංකුකරණය, භාණ්ඩාගාරය සහ මුදල් තැරැව්කරණය ආවරණය වන පරිදි බැංකු හා මූල්‍ය සේවා පිළිබඳ වසර 26 කට වැඩි පළපුරුද්දක් ඔහුගේ අවබෝධයට පිටුබලය සපයයි. ශ්‍රී ලංකාවේ සිටි බැංකුවේ වසර 11 ක් ආවරණය වන පරිදි ගෝලීය වෙළෙඳපොළ ප්‍රධානී ආයතනික විකුණුම් හා ව්‍යුහකරණ උප සභාපති ධුරය දරයි. විදේශ විනිමය / මුදල් වෙළෙඳපොළ / ස්ථාවර ආදායම් (ණය සුරැකුම්පත්) උපකරණ සහ පාරිභෝගික ව්‍යුහය හා උපදේශනය යන අංශවල වෙළඳාම පිළිබඳ ඔහුට විශාල අත්දැකීම් තිබේ. 2007-09 දක්වා ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ඔහු වසර 12 කට වැඩි කාලයක් විධායක කමිටුවේ සේවය කර ඇත. ඔහු ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලයේ ආදිශිෂ්‍යයෙකි.

# 05

**ආර්.ඒ. චූලනන්ද මහත්මිය.**
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

ආර්. ඒ. චූලනන්ද මහත්මිය 2016 අගෝස්තු මාසයේදී HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස පත් කරන ලදී. SLAN විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියක වන චූලනන්ද මහත්මිය මේ වන විට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නිවාස හා සංවර්ධන) ලෙස කටයුතු කරයි. ඇය 1991 දී කොළඹ මහ නගර සභාවේ සහකාර ලේකම්වරියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළාය.

ඉන් අනතුරුව ඇය කහවත්ත සහ ඉම්බුල්පේ සහකාර ප්‍රාදේශීය ලේකම්, අනුරාධපුර සහකාර දිස්ත්‍රික් ලේකම්, සෝරණතොට සහ තිම්බිරිග ස්යාය ප්‍රාදේශීය ලේකම් සහ ශ්‍රී ලංකා කාන්තා හා ළමා කටයුතු කාර්යාංශයේ අධ්‍යක්ෂ ධුරය ආදී ධුර රුසක් දැරුවාය. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් ද, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

# ආයතනික කළමනාකරණය




01 **කේ.ආර්.එම්.ඒ. බණ්ඩාර මහතා** - ප්‍රධාන කළමනාකරු - අනුකූලතාවය
02 **එම්.කේ. නම්බියුරුරන් මහතා** - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
03 **පාලිත ගමගේ මහතා** - සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී
04 **එච්.ඒ. අනුර මහතා** - මූල්‍ය ප්‍රධාන කළමනාකරු
05 **ඩබ්ලිව්.එන්.ඩී. බොතේජු මිය** - ප්‍රධාන කළමනාකරු - මානව සම්පත් සහ පරිපාලක
06 **එච්.එස්. ගුණතිලක මිය** - සහකාර සාමාන්‍යාධිකාරී ව්‍යාපාර, සංවර්ධන සහ කළමනාකරණ




07 **ඒ.ජේ. අතුකෝරල මහතා** - ප්‍රධාන අභ්‍යන්තර විගණක
08 **ඩී.වී. පතිරණ මහතා** - ප්‍රධාන මූල්‍ය නිලධාරී
09 **සී.ආර්.සී. බාලසූරිය මහතා** - සහකාර සාමාන්‍යාධිකාරී භාණ්ඩාගාරය
10 **කේ.ටී.ඩී.ඩී. ද සිල්වා මහතා** - ප්‍රධාන කළමනාකරු - බැංකු මණ්ඩල ලේකම්
11 **ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.සී. පෙරේරා මිය** - සහකාර සාමාන්‍යාධිකාරී නීති
12 **ඩී.එම්.ඩී.එම්.කේ. දිසානායක මහතා** - ණය ප්‍රධානී
13 **ඒ.එම්. නීලචන්ද්‍ර** - (IT) ප්‍රධානී

# ආයතනික කළමනාකරුවන්ගේ විස්තර

### පාලිත ගමගේ මහතා
ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී

*B. Sc (Engineering) Hons degree (University of Moratuwa) MBA -Asian Institute of Technology, Thailand*

බැංකුකරණයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ බැංකුකරුවෙකු වන පාලිත ගමගේ මහතා 2018 අගෝස්තු 16 වන දින ශ්‍රී ලංකා HDFC බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී ලෙස පත් කරන ලදී. ගමගේ මහතා 1978 දී HDFC බැංකුවෙන් සිය බැංකු ජීවිතය ආරම්භ කළේය. 1987 දී HDFC බැංකුවට සම්බන්ධ වීමට පෙර ඔහු ශ්‍රී ලංකාවේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කළේය. HDFC හි ඔහු ආයතනික බැංකුකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ආයෝජන බැංකුකරණය, සැලසුම් සහ මෙහෙයුම් යන අංශවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයක සේවය කළේය. ඊට අමතරව ඔහු HDFC වර්ධන බැංකුවේ ආයතනික ණය ප්‍රධානියා ලෙසද සේවය කළේය.

HDFC බැංකුවේ GM /CEO ලෙස සම්බන්ධ වන විට ඔහු DFCC බැංකුවේ විධායක උප සභාපති (ඒකාබද්ධ අවදානම් කළමනාකරණය) / ප්‍රධාන අවදානම් නිලධාරී තනතුර හෙබවීය. ඔහු 2010 සිට වසර තුනක් ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහ 2014 සිට වසර හතරක් ජාතික වත්කම් කළමනාකරණ සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළේය. මීට අමතරව ඔහු වසර දෙකක කාලයක් NAMAL හි මණ්ඩල විගණන කමිටුව සහ Acuity Securities බවෝ හි අවදානම් කළමනාකරණ කමිටු ප්‍රධානී ලෙස කටයුතු කළේය.

ගමගේ මහතා සිය වෘත්තීය ජීවිතය තුළ බැංකුකරණයේ විවිධ අංශ ආවරණය වන පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සහ වැඩමුළු රාශියකට සහභාගී වී ඇත.

ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (ඣඡඒ) සමත් වූ අතර ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකි.

### එම්.කේ. නම්බියාරූරන් මහතා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

*Master's in Financial Economics (University of Colombo) Master's in Business Administration PIM, University of Sri Jayewardenepura*

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජික විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාමාජික - ඕස්ට්‍රේලියා, බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජික

නම්බියරූන් මහතා ක්ෂේත්‍ර කිහිපයක සුදුසුකම් ඇත. ණය, ලීසිං, නිෂ්පාදන සංවර්ධනය, ශාඛා මෙහෙයුම්, මූල්‍ය, අයවැය සැලසුම් සහ පාලනය, භාණ්ඩාගාරය සහ උපාය මාර්ග පිළිබඳ විශේෂ දැනුමක් ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පෞද්ගලික බැංකුවක බැංකු හා මූල්‍ය අංශයන්හි දශක 3 කට අධික කාලයක් ඔහු සේවයේ යෙදී සිටියේ. නම්බියුරන් මහතා වසර 7 කට වැඩි කාලයක් සමූහ භාණ්ඩාගාරයේ ප්‍රධානියා ලෙසත්, මූල්‍ය සමාගමක සාමාන්‍යාධිකාරිවරයෙකු ලෙසත් පාරිභෝගික ඉලෙක්ට්‍රොනික් පිළිබඳ අවධානය යොමු කරන ප්‍රමුඛ පෙළේ විවිධාංගීකරණය වූ සමාගමක කළමණාකාරවරයෙක් ලෙසත් සේවය කර ඇත. ඔහුගේ විදේශීය අත්දැකීම් අතර කැනඩාවේ ඩෙල්මා එක්ස්චේන්ජ් - අබුඩාබි, මේජන් එක්ස්චේන්ජ් - ඕමාන් සහ කොමර්ෂල් ඉන්ටර්ලින්ක් හි විකල්ප අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම ඇතුළත් වේ.

### ඩී. විද්‍යාන පතිරණ මහතා
ප්‍රධාන මුදල් නිලධාරී

*BSc, MBA, FCA, FCMA, FCPM*

පත්වීමේ දිනය - 2004 සැප්තැම්බර් 15

විගණනය, ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති හා ආයෝජන ප්‍රවර්ධනය, කළමනාකරණ ගිණුම්කරණය, ව්‍යාපෘති මූල්‍ය, ව්‍යාපාර සංවර්ධන හා අලෙවිකරණ, බැංකු, භාණ්ඩාගාර කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර 33 කට වැඩි පළපුරුද්දක් ඔහු සතුය. ඔහු දැනට බැංකුවේ මුදල් හා සැලසුම් අංශයේ වගකීම දරයි.

### ඒ.ජේ. අතුකෝරල මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

*BSc, ACMA, CISA, CISM, Dip in Computer System Design (NIBM)*

පත්වීමේ දිනය - 2009 ජූලි 01

විගණන කටයුතු පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති බැංකු කර්මාන්තයේ වසර 32 කට වැඩි විධායක පළපුරුද්දක් ඔහු ගණන් ගනී. ඔහු පෞද්ගලික හා රාජ්‍ය අංශයේ බැංකු වල සේවය කර ඇත

### ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.එස්. සී. පෙරේරා මිය
සහකාර සාමාන්‍යාධිකාරී - නීති

*Attorney at Law and Notary Public*

පත්වීමේ දිනය - 1992 නොවැම්බර් 16

ඇය HDFC බැංකුවේ නීති නිලධාරිනියක ලෙස සිය සේවය ආරම්භ කළ අතර 2001 දී නීති කළමනාකරු තනතුරට උසස් කරන ලද අතර ඇය 2015 වසරේදී සහකාර සාමාන්‍යාධිකාරී ලෙස පත් කරන ලදී.

නිවාස මූල්‍ය, බැංකු හා නඩු පැවරීම් පිළිබඳ විශේෂඥයෙකු වන ඇය නීති ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි වෘත්තීය පළපුරුද්දක් ඇත.

### එච්. ගුණතිලක මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සංවර්ධන හා අලෙවිකරණ)

*MBA, PGD in Marketing, PGD in Urban Management (IHS Netherlands), BA (Sri Lanka)*

පත්වීම් දිනය -201 ජුනි 20

ඇය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිවාස ක්ෂේත්‍රයේ වසර 34 කට වැඩි පළපුරුද්දක් ඇත.

### සී.ආර්.පී. බාලසූරිය මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාරය

*Master in Financial and Economics, B Com (Special), MAAT*

පත්වීමේ දිනය - 2004 මාර්තු 22.

ඔහු වෙළඳ හා විශේෂිත බැංකු අංශයේ දශක දෙකකට වැඩි වෘත්තීය පළපුරුද්දක් ඇත.

### මංජුල කිත්සිරි දිසානායක මහතා

ප්‍රධාන කළමනාකරු - ණය

*ACA, ADCM (IBSL)*

පත්වීම් දිනය - 2012 ජුනි 18

ඔහුට ණය හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇත. HDFC බැංකුවට සම්බන්ධ වීමට පෙර ඔහු ප්‍රධාන පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතනවල ණය නිලධාරී, ගිණුම් කළමනාකරු, ජ්‍යෙෂ්ඨ ගිණුම් කළමනාකරු, ගණකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු ලෙස ණය හා මෙහෙයුම් කටයුතු කළේය. ඔහුට විගණනය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, මෙහෙයුම් සහ ණය කළමනාකරණය යන ක්ෂේත්‍රවල අත්දැකීම් තිබේ.

### කේ.ටී. දර්ශනි. ඩී සිල්වා මිය

බැංකු / මණ්ඩල ලේකම් / ප්‍රධාන කළමනාකරු

*Masters in Business administration (MBA), Masters in law (LLM) and higher diploma in Banking Finance and insurance*

ඇය HDFC නීති අංශයට අනුයුක්ත නීතිඥවරියක් ලෙස සේවය ආරම්භ කර ඇති අතර පසුව බැංකුවේ / මණ්ඩලයේ ලේකම් ලෙස පත් කර ඇත. ඇය නීති ලේකම්වරියක ලෙස වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති අතර, ඇය සමාගම් ලේකම් ක්ෂේත්‍රයේ වර්තමාන කටයුතුවලට අමතරව නඩු, ප්‍රතිසාධනය, මානව සම්පත් යනාදිය පිළිබඳ අත්දැකීම් ලබා ඇත. ඇය සිය වෘත්තීය දිවියේ ආරම්භක අවධියේදී සිවිල් උසාවියට අනුයුක්තව සිටි අතර පසුව HDFC ආයතනයට සම්බන්ධ වීමට පෙර එලායන්ස් ෆිනෑන්ස් සමාගමේ සේවය කළාය.

### එච්.ඒ. අනුර මහතා

ප්‍රධාන කළමනාකරු - මූල්‍ය

*MBA,PGDM (RJT), B.Sc. Accy (Sp) (USJ), FIPA (Au),FFA(UK), MAAT, Inter. of CA Sri Lanka,*

පත්වීම් දිනය -1 ඔක්තෝබර් 2004

බැංකුකරණය, ණය, ප්‍රතිසාධනය, අරමුදල් බලමුලු ගැන්වීම, ශාඛා මෙහෙයුම්, ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, විගණනය, භාණ්ඩාගාර කළමනාකරණය, අනුකූලතාවය, ආයතනික මූල්‍ය වාර්තාකරණය සහ වාර්ෂික වාර්තා, අයවැයකරණය සහ මූල්‍ය සැලසුම්කරණය පිළිබඳ දශක දෙකක සේවා පළපුරුද්දක් ඔහු සතුව ඇත.

1996 දී බී.එම්.සී. සහ ලංකා ඩීවර සංස්ථාවේ ගණකාධිකරණය පිළිබඳ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු 1998 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට විගණන / විධායක නිලධාරී, සහකාර කළමණාකරු ලෙස සම්බන්ධ වී 2004 දී HDFC හා සම්බන්ධ වූයේ ගම්පහ ශාඛා කළමනාකරු ලෙසය. 2007 සිට ගණකාධිකාර භාණ්ඩාගාරය, ගණකාධිකාරී මූල්‍ය, ජ්‍යෙෂ්ඨ කළමනාකරු මූල්‍ය ලෙසින් සේවය කළේය.

### ඩබ්ලිව්.එන්.ඩී . බොටෙජු මිය

ප්‍රධාන කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන

*Bsc. Business Administration (special), CBA (CA Sri Lanka), CBF*

පත්වීම් දිනය - 1995 ජූලි 01

කළමනාකරණ, මූල්‍ය, මානව සම්පත් සහ වෙනත් විෂය ක්ෂේත්‍රයන්හි පෞද්ගලික හා බැංකු අංශයේ වසර 24 කට වැඩි පළපුරුද්දක් ඇය සතුය

### කේ.ආර්.එම්. අරුණ බණ්ඩාර මහතා

ප්‍රධාන කළමනාකරු - අනුකූලතා නිලධාරී

*B. Com(Special), CBA (CA Sri Lanka), SAT (AAT Sri Lanka), CBF*

පත්වීම් දිනය - 1999 මැයි 03

ඔහු රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල විගණන, ගිණුම්කරණ ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ලබා ගනී. HDFC බැංකුවට එක්වීමට පෙර ඔහු රාජ්‍ය සංස්ථා විගණනය කිරීම හා අරමුදල් සම්පාදනය කළ ව්‍යාපෘති සඳහා විශේෂඥයෙකු ලෙස සේවය කළේය. ඔහු 2012 ජනවාරි 02 දින සිට බලපැවැත්වෙන ප්‍රධානියා ලෙස පත් කරන ලදී.

### ඒ.එම්. නීලවන්ද්‍ර

ප්‍රධාන කළමනාකරු - තොරතුරු තාක්ෂණය

*Bsc" NIBM" CCPSP*

පත්වීම් දිනය - 1997 දෙසැම්බර් 01.

ඔහු බැංකු හා රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකු ලෙස වසර 24 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත. පුළුල් පරාසයක යුනික්ස් පදනම් කරගත් පද්ධති ස්ථාපනය කිරීම, විනාශ කිරීම සහ නඩත්තු කිරීම, දත්ත සමුදායන් විනාශ කිරීම සහ නඩත්තු කිරීම, ජාල පරිපාලනය පිළිබඳ පුළුල් අත්දැකීම් ඔහු සතුව ඇත. ඔහු HDFCහි නව මූලික බැංකු ක්‍රියාත්මක කිරීම සහ පද්ධති පරිවර්තනය පිළිබඳ ව්‍යාපෘති කළමනාකරු ලෙස කටයුතු කළේය. ඔහු පරිගණක හා තාක්ෂණ කවුන්සිලයේ වසර දෙකක් සේවය කර ඇත.

# අංශ ප්‍රධානීන්



**එල්.ඒ.එස්.සී. විජේතුංග මහත්මිය**
- ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පරිපාලනය



**බී.එම්.පී. පෙරේරා මහතා**
- කළමනාකරු - ණය පරිපාලනය සහ වෙනත් ආදායම් භාරව



**ටී. බී. කරුණානබන්දු මහතා**
- කළමනාකරු - රන් ණය



**එල්.ඩී.එස්.එච්. ලියනගේ මහත්මිය**
- කළමනාකරු - ගෙවීම



**ආචාර්ය කේ.ඒ.ඒ. නිර්මාලි මහත්මිය**
- කළමනාකරු - ගිණුම් පාලනය



**ඩී.එන්. ධර්මරත්න මහතා**
- ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ලීසිං



**ඩී.එම්.ඒ. දිසානායක මහතා**
- කළමනාකරු - ආයතනික හා සංවර්ධන මූල්‍ය



**අයි. නිශාන්ත මහතා**
- අවදානම් නිලධාරී  ජ්‍යෙෂ්ඨ කළමනාකරු



**එල්. ගුණතිලක මහත්මිය**
- ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අයකර ගැනීම්



**එම්.යූ.එස්. ඩි කොස්තා මහත්මිය**
- කළමනාකරු - මෙහෙයුම්



**එන්.එල්. විජේසිරි මහත්මිය**
- කළමනාකරු - තාක්ෂණික හා පරිශ්‍ර නඩත්තු



**ඩබ්ලිව්.එම්. චන්ද්‍රසේන මහතා**
- කළමනාකරු - තක්සේරු කිරීම

# ප්‍රාදේශීය කළමනාකරුවන්



**ආර්.ඒ.ජේ.එන්. රණසිංහ මහතා**
- ප්‍රාදේශීය කළමනාකරු



**බී.ඩබ්ලිව්.එම්.සී. කුමාරසිරි මහතා**
- ප්‍රාදේශීය කළමනාකරු



**අයි.කේ. දවාතංග මහතා**
- වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු



**එච්. එම්. තිලකරත්න මහතා**
- ප්‍රාදේශීය කළමනාකරු



**ඩබ්ලිව්. ඩී. කේ. සෙනෙවිරත්න මහතා**
- ප්‍රාදේශීය කළමනාකරු

# ශාඛා කළමනාකාරවරු

| නම | ශාඛාව | තනතුර |
|---|---|---|
| එස්.එච්.කේ. ගමගේ මහතා | හලාවත | ශාඛා කළමනාකරු |
| එන්.ඒ.එන්.එස්. නිස්සංකා මිය | ගම්පොල | ශාඛා කළමනාකරු |
| ඩී.ආර්.ජී.ඩී බී. ජයතිලක මහතා | රත්නපුර | වැඩබලන ශාඛා කළමනාකරු |
| ඩී.ටී.ඒ. ජයසිංහ මිය | අවිස්සාවේල්ල | ශාඛා කළමනාකරු |
| එස්.එම්.එස්.කේ. බණ්ඩාරා මහතා | නුවරඑළිය | ශාඛා කළමනාකරු |
| එල්.එස්.බී. රත්නායක මහතා | මහනුවර | ශාඛා කළමනාකරු |
| ඩබ්ලිව්.එස්. දිසානායක මහතා | මාතලේ | වැඩබලන ශාඛා කළමනාකරු |
| ජී.ඩබ්ලිව්.ඒ.එන්. කාලින්ද මහතා | මාතර | ශාඛා කළමනාකරු |
| ඒ.එම්.යූ.එස්.බී. අත්තනායක මහතා | කුලියාපිටිය | ශාඛා කළමනාකරු |
| එච්.එම්.යූ. සමරවීර මහතා | කුරුණෑගල | ශාඛා කළමනාකරු |
| ඒ.යූ.ටී. ප්‍රනාන්දු මහතා | නුගේගොඩ | වැඩබලන ශාඛා කළමනාකරු |
| ආර්.එස්.අයි සිල්වා මිය | කළුතර | ශාඛා කළමනාකරු |
| ටී.එම්.ඩී.ඩී.කේ. මදටුවා මිය | ජා-ඇල | ශාඛා කළමනාකරු |
| පී. ඒකනායක මහතා | ගාල්ල | ශාඛා කළමනාකරු |
| ඩී.කේ.පී. ද සිල්වා මිය | කොළඹ | ශාඛා කළමනාකරු |
| ඒ.අයි. කිරිඇල්ල මහතා | හයිඩ් පිටිය | ශාඛා කළමනාකරු |
| එච්.එන්.ජේ මහතා. පෙරේරා | පිළියන්දල | වැඩබලන ශාඛා කළමනාකරු |
| එච්.ඒ.එස්.එල්. හපන්ගම | කිරිබත්ගොඩ | ශාඛා කළමනාකරු |
| එස්.කේ.පී. සමන්ති මිය | නිට්ටඹුව | වැඩබලන ශාඛා කළමනාකරු |
| එස්.ඒ.ආර්.සී.පී. කුමාර මහතා | ඇඹිලිපිටිය | ශාඛා කළමනාකරු |
| එම්.ඒ.එස්. දේශප්‍රිය මහතා | තංගල්ල | ශාඛා කළමනාකරු |
| එම්.එල්.එන්. අනුරාධ මහතා | තිස්සමහාරාම | ශාඛා කළමනාකරු |
| ඩබ්ලිව්.බී.එම්.ඒ. ප්‍රනාන්දු මිය | ගම්පහ | ශාඛා කළමනාකරු |
| එම්.ජී.ඩී.පී. සෙනෙවිරත්න මිය | බදුල්ල | ශාඛා කළමනාකරු |
| ඒ.ඒ.එස්.අයි.ටී. සමන්තිලක මහතා | අම්බලන්ගොඩ | ශාඛා කළමනාකරු |
| ටී.ජී.ආර්.එම්.ආර්.එම්. රත්නායක මහතා | දඹුල්ල | ශාඛා කළමනාකරු |
| ඩී.ඒ.එන්.පී.කේ. පියදස මහතා | නිකවරටිය | ශාඛා කළමනාකරු |
| එච්.ආර්.එම්. තාරක මහතා | පොළොන්නරුව | වැඩබලන ශාඛා කළමනාකරු |
| ටී.එච්.එම්.ඒ. හේවගේ මහතා | පෑලියගොඩ | ශාඛා කළමනාකරු |
| ටී.වී.ඩී. නයනජිත් මහතා | මොණරාගල | වැඩබලන ශාඛා කළමනාකරු |
| කේ.ඒ.ඒ.පී.එස්. කුමාර මහතා | හෝමාගම | ශාඛා කළමනාකරු |
| ආර්.ඒ.සී.එස්. පුෂ්පකුමාර මහතා | කෑගල්ල | ශාඛා කළමනාකරු |
| එල්. ජයශංකර් මහතා | මඩකලපුව | වැඩබලන ශාඛා කළමනාකරු |
| පී.ඒ. විරාජ් සම්පත් මහතා | හොරණ | වැඩබලන ශාඛා කළමනාකරු |
| එච්.එම්.ඩී. කුමයිහාමි මහතා | අම්පාර | වැඩබලන ශාඛා කළමනාකරු |
| ඩී.එස්.ආර්. දිසානායක මහතා | අනුරාධපුර | වැඩබලන ශාඛා කළමනාකරු |
| එස්. සුයනියා මිය | යාපනය | වැඩබලන ශාඛා කළමනාකරු |
| ඒ.ජී. ස්ටෙෆාන් මහතා | ත්‍රිකුණාමලය | වැඩබලන ශාඛා කළමනාකරු |
| ටී. වෙල්ෂ්කුමා මහතා | වවුනියාව | වැඩබලන ශාඛා කළමනාකරු |

# ජනතාවට ආර්ථික ස්ථාවරත්වයක්

## වේගවත්ව ලබා දීම වෙනුවෙන් අපි කැපවුණෙමු




**මූල්‍ය වාර්තා**
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන් සතු වගකීම/ 116
විගණක වාර්තාව/ 118
ආදායම් ප්‍රකාශය/ 122
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය/ 123
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය/ 124
කොටස්වල වෙනස්කම් ප්‍රකාශය/ 125
මුදල් ප්‍රවාහ ප්‍රකාශය/ 126
ගිණුම්කරණ ප්‍රතිපත්ති/ 127
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්/ 137

**ශ්‍රී ලංකා HDFC බැංකුව**
වාර්ෂික වාර්තාව 2019



# මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC) පනතේ (2003 අංක 15 පනත හා 2011 අංක 45 දරණ පනත මගින් සංශෝධනය කරන ලද) සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත සඳහන් ප්‍රකාශයේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් බාහිර විගණකගේ වගකීම් විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දක්වා ඇත.

සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඒවා මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ඒ පිළිබඳ වන සටහන් යනාදිය ඇතුළත් වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පහත දෑ පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි.

1. 2019 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ කටයුතු; සහ
2. අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ ලාභය හෝ අලාභය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂවරුන් පහත දෑ සහතික කළ යුතුය.

1. සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ඒවා ස්ථිර ආකාරයකින් ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රධාන අපගමන තිබේ නම් ඒවා හෙළිදරව් කර පැහැදිලි කර ඇති බව;
2. තීන්දු සහ ඇස්තමේන්තු කර ඇති දෑ සාධාරණ හා විචක්ෂණශීලීය යන වග;
3. අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව;

මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම සාධාරණීකරණය කරමින් බැංකුවට අඛණ්ඩව ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සහතික කළ යුතුය.

තවද, බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව, ප්‍රමාණවත් ගිණුම් වාර්තා බැංකුව සතුව ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂවරු වගකිව යුතුය.

මෙම වාර්තාවේ සකස් කර ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2012 ජනවාරි 01 දින සිට බලාත්මක වූ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRC), 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන සම්මත පනත, 1988 අංක 30 දරණ බැංකු පනත සහ සංශෝධන, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත (වරින් වර සංශෝධනය කළ), කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති, සහ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හා ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ සහ පිළිවෙත් සංග්‍රහය යන නීති රෙගුලාසි මත පදනම්ව සකස් කර ඇත.

මීට අමතරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආකෘතියට මෙම මූල්‍ය ප්‍රකාශන අනුකූල වේ.

වසර පුරා බැංකුව මුහුණ දී ඇති සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, වාර්තාගත කිරීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරු ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරන්තර සමාලෝචනයට ලක්ව ඇත.

අභ්‍යන්තර සමාලෝචන, අභ්‍යන්තර විගණනය සහ බැංකු කටයුතු විධිමත්ව කරගෙන යාමට අවශ්‍ය මූල්‍ය හා වෙනත් පාලන ක්‍රම, වත්කම් ආරක්ෂා කිරීම, වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ හඳුනා ගැනීම, සහ වාර්තා වල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය ප්‍රායෝගිකව ආරක්ෂා කිරීම යනාදියෙන් මෙය සමන්විත වේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සිදු කරන ලද ඒවැනි සමාලෝචනවල ප්‍රතිඵල “අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය” වාර්ෂික වාර්තාවේ 88 සිට 89 දක්වා පිටුවල දක්වා ඇත. “අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය” පිළිබඳ බාහිර විගණකගේ සහතික වාර්තාව වාර්ෂික වාර්තාවේ 90 සිට 91 දක්වා පිටුවල දක්වා ඇත.

බැංකුව විසින් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාම සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වලදී සහ මණ්ඩල විගණන කමිටුව හරහා සෘජුවම සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් සුදුසු පියවර ගෙන තිබේ. එකී කාරක සභාවේ වාර්තාව 99 වන පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂ විගණන කමිටුවේ සමාලෝචනයක් හා නිර්දේශයකින් පසුව ඒවා නිකුත් කිරීමට පෙර අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ වාස්තවිකතාව පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාර ගනී. අධ්‍යක්ෂවරුන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට බැංකුවේ බාහිර විගණක ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයාට සහාය විය යුතුය. අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳ ඕනෑම සමාලෝචනයක් හා පරීක්ෂාවක් සිදුකිරීමට අවශ්‍ය සෑම අවස්ථාවක්ම, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ඔවුන්ගේ ස්වාධීන විගණන මතය ප්‍රකාශ කිරීම සඳහා සුදුසු සහ අවශ්‍ය යැයි ඔවුන් සලකනු ඇත.

සමාගම් පනතේ 150 (1) (ආ) වගන්තිවලට අනුව වගකිව යුතු නිලධාරියා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරීවරු විසින් සහතික කර ඇත. බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර ඇත.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව බැංකුව විසින් අනුගමනය කළ යුතු සියලුම අදාළ නියාමන හා ව්‍යවස්ථාපිත බලධාරීන්ට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා ඇති බවට හෝ අදාළ අවස්ථාවන්හි දී අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි සියල්ලෝම තම වගකීම් ඉටු කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්,



**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
*සභාපතිනිය*

30/04/2020
කොළඹ

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAF/ 01/C/HDFC/1/19/16

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 27 April 2020

සභාපති

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා**

---

**1. මූල්‍ය ප්‍රකාශ**

**1.1 මතය**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, වෙනස්වීම් ප්‍රකාශය, ගෙවුණු වර්ෂය සඳහා කොටස්වල වෙනස්කම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, මූල්‍ය ප්‍රකාශනවල සටහන් සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව මගේ මඟ පෙන්වීම යටතේ, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ විධිවිධානවලට අනුකූලව සකස් කෙරෙන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව නියමිත වේලාවට සභාගත කෙරෙනු ඇත.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඔවුන්ගේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මාගේ මතය යි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 මතය සඳහා පදනම**

මම මෙම විගණනය කරන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට ඊඕ* අනුකූලවය. එම ප්‍රමිතීන් යටතේ මගේ වගකීම්, මා ඉදිරිපත් කළ වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම යන කොටසින් දක්වා ඇත. මාගේ මතය සඳහා පදනම වෙනුවෙන් මා ලබාගත් විගණන සාක්ෂි සුදුසු සහ ප්‍රමාණවත් බව මම විශ්වාස කරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශ සඳහා පාලන බලය පැවරුවන්ගේ සහ කළමනාකාරිත්වයෙහි වගකීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ කමනාකාරිත්වයෙහි තීරණය අනුව අභ්‍යන්තර පාලනය ලබා ගැනීම සඳහා කළමනාකාරිත්වයෙහි වගකීම්, වංචා හෝ දෝෂ නිසා ඇතිවන අවප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන සැකසීම කළ යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, බැංකුව ද්‍රවශීල කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට කළමනාකාරිත්වය අදහස් නොකරන්නේ නම්, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමේ හැකියාව තක්සේරු කිරීම, අඛණ්ඩ පැවැත්මට අදාල වන පරිදි කරුණු අනාවරණය කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීම කළමනාකාරිත්වයෙහි වගකීම වේ.

පාලන බලය පැවරුවන්ගේ වගකීම වන්නේ මූල්‍ය ප්‍රකාශ සැකසීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික හා වරින් වර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා බැංකුව සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළියෙළ කිරීම සඳහා බැංකුව සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම්

**1.4 මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකවරයාගේ වගකීම්**

මගේ පරමාර්ථය වන්නේ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හෝ දෝෂ නිසා වැදගත් අවප්‍රකාශයන්ගෙන් තොර ද යන්න පිළිත් විගණන වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතික කිරීම ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදු කරන ලද විගණනයක් සෑම විටම වැදගත් අවප්‍රකාශයන් හඳුනාගනු ඇති බවට සහතිකයක් නොවේ. සැලකිය යුතු තරමේ අවප්‍රකාශයන් වංචාවක් හෝ වැරැද්දක් නිසා ඇතිවිය හැකි අතර ඒවා තනි තනිව හෝ සමස්තයක් වශයෙන් ගත් කල, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනු ලබන පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කරනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල විගණනයක කොටසක් ලෙස මම වෘත්තීය විනිශ්චයක් අනුගමනය කරන අතර, විගණනය පුරාවට වෘත්තීය සංශයභාවය පවත්වා ගනිමි. එසේම මම,

# විගණකාධිපති වාර්තාව




- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වැදගත් අවප්‍රකාශ සිදුවීමේ අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීම සහ මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. වංචාවක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ වැදගත් අවප්‍රකාශයන් හඳුනා නොගැනීමේ අවදානම තනි දෝෂයකට වඩා වැඩි ය. මන්ද, වංචාවට සම්බන්ධ වීම, වංචා කිරීම, හිතාමතා මඟ හැරීම, සාවද්‍ය නිරූපණයන් හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම යනාදිය ඊට ඇතුළත් විය හැකිය.

- බැංකුවේ අභ්‍යන්තර පාලන ඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි.

- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ භාවිතයේ යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද අනාවරණය කිරීම් ඇගයීම.

- කළමනාකරණයේ ගිණුම්කරණ කටයුතුවල අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සිදුවීම් හෝ කොන්දේසි හා සම්බන්ධ වැදගත් අවප්‍රකාශයන් පවතින්නේද යන්න සහ අඛණ්ඩ පැවැත්මත් ලෙස බැංකුවට කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳව තීරණය කරමි. වැදගත් අවප්‍රකාශයන් පවතින බව මා නිගමනය කරන්නේ නම්, හෝ අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද අනාවරණයන් පිළිබඳව මගේ විගණක වාර්තා මතය වෙනස් කිරීම සඳහා අවධානය යොමු කළ යුතු වේ. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණන වාර්තා දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්මට බලපෑ හැක.

- මූල්‍ය ප්‍රකාශනවල සමස්තය ඉදිරිපත් කිරීම, අනාවරණය කිරීම් ඇතුළුව ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් ලබා ගන්නා ආකාරයට ගනුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනය සතු සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන අනාවරණයන් සම්බන්ධයෙන් පාලන බලය පැවරූවන් සමඟ සාකච්ඡා කරමි.

**2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතට පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර, මගේ විමර්ශනයෙන් පෙනී යන පරිදි, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 19 හි 12 (අ) වගන්තියේ නියමයට අනුව බැංකුව නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෟ) (සසස) වගන්තියේ නියමයට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂයට අනුකූල වේ.

- ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෟ) (සඩ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූලව පෙර වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි වැදගත් කරුණු වලට පමණක් සීමා වී ඇති අතර පහත කිසිවක් සිදුවී ඇති බව මගේ අවධානයට යොමු වී නොමැත.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෟ) වගන්තියේ දක්වා ඇති නියමයට අනුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැරව බැංකුව විසින් අත්සන් කරන ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධව බැංකුවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර පුද්ගලික සබඳතාවක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (1) වගන්තියේ නියමයට අනුව බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලේඛනගත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් වලට බැංකුව අනුකූල වී නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ දක්වා ඇති අවශ්‍යතාවයට අනුව බැංකුව සිය බලතල, කාර්යයන් සහ යුතුකම් අනුව කටයුතු කර නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ දක්වා ඇති නියමයට අනුව බැංකුවේ සම්පත් දෙන ලද කාල රාමුව තුළ සහ අදාළ නීතියට අනුකූලව සකසුරුවම් ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර නොමැති බව.

**ඩබ්. පී. සී. වික්‍රමරත්න**

විගණකාධිපති

# ආදායම් ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා (සංඛ්‍යා රු. වලිනි)

| විස්තරය | සටහන් | බැංකුව 2019 | 2018 |
|---|---|---|---|
| **ආදායම** | | 8,090,464,850 | 7,120,235,055 |
| පොලී ආදායම | | 7,683,161,881 | 6,679,052,243 |
| පොලී වියදම | | (4,783,234,818) | (4,440,675,426) |
| **ශුද්ධ පොලී ආදායම** | 1 | 2,899,927,063 | 2,238,376,817 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 2 | 358,302,968 | 380,261,924 |
| ගාස්තු සහ කොමිස් වියදම | | - | - |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | | 358,302,968 | 380,261,924 |
| ශුද්ධ වෙළඳ ලාභ / (පාඩු) | 3 | - | - |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද මූල්‍ය උපකරණවලින් ලද ශුද්ධ ලාභය / (පාඩුව) | 4 | 500,000 | (750,000) |
| වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ) | 5 | 48,500,000 | 61,670,888 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | 3,307,230,031 | 2,679,559,629 |
| අඩු: භාණ්ඩාගාර ගාස්තු / (ආපසු හැරවීම) | 6 | 322,893,049 | 92,705,576 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | 2,984,336,982 | 2,586,854,053 |
| **අඩු වීම්: වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 7 | 1,164,468,698 | 1,113,571,585 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් | 8 | 163,763,041 | 85,714,476 |
| වෙනත් වියදම් | 9 | 411,624,661 | 468,905,305 |
| **මුළු වියදම්** | | 1,739,856,401 | 1,668,191,365 |
| **එ.අ.බ, ජා.ගො.බ සහ ණ.අ.ගෙ බදු වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩු)** | | 1,244,480,582 | 918,662,687 |
| අඩු: මූල්‍ය සේවා මත එ.අ.බ, ජා.ගො.බ සහ මූල්‍ය සේවා මත එ.අ.බ, ජා.ගො.බ සහ ණ.අ.ගෙ බදු | 10 | 469,972,694 | 289,882,285 |
| **එ.අ.බ, ජා.ගො.බ සහ ණ.අ.ගෙ බදු වලට පසු මෙහෙයුම් ලාභය/(පාඩු)** | | 774,507,887 | 628,780,402 |
| ආශ්‍රිතයන්ගේ හා ඒකාබද්ධ ව්‍යාපාරවල ලාභ කොටස | | - | - |
| **බදු පෙර ලාභය / (අලාභය)** | | 774,507,887 | 628,780,402 |
| අඩු: බදු වියදම් | 11 | 298,795,445 | 64,389,591 |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | | 475,712,442 | 564,390,811 |
| **ලාභ මත කොටසකට ඉපැයීම්** | | | |
| සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම (රු.) | 12 | 7.35 | 8.72 |
| සාමාන්‍ය කොටස් සඳහා ගලපන ලද ඉපයීම | | - | - |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා (සංඛ්‍යා රු. වලිනි)

| | | බැංකුව | |
|---|---|---|---|
| **විස්තරය** | **සටහන්** | **2019** | **2018** |
| වර්ෂය සඳහා ලාභය | | 475,712,442 | 564,390,811 |
| **ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කෙරෙන අයිතම** | | | |
| විදේශ මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්කම් | | - | - |
| මුදල් ප්‍රවාහ ලැබීම මත ශුද්ධ ලාභ/අලාභ | | - | - |
| ණය උපකරණයන්හි ආයෝජන මත ශුද්ධ ලාභ / අලාභ සාධාරණ අගයට මිනුම් කරන ලද විස්තීර්ණ ආදායම | | - | - |
| සාධාරණ අගය මත මිනුම් කරන ලද වෙනත් ණය උපකරණ විස්තීර්ණ ආදායම | | - | - |
| වෙනත් (දක්වන්න) | | - | - |
| අඩු: ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කළ අයිතමවලට අදාළ බදු වියදම් | | - | - |
| **එකතුව** | | - | - |
| **ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම** | | | |
| හිමිකාරිත්ව ආයෝජනය මත සාධාරණ වටිනාකම් වෙනස | | - | - |
| සාධාරණ අගය මත සාධාරණ අගයට නම් කළ උපකරණවල වෙනත් විස්තීර්ණ ආදායම | | - | - |
| බැංකුවෙහි මූල්‍ය වගකීම්වල ණය අවධානම වෙනස්වීමට ඇ අදාල සාධාරණ අගය මත වන ලාභ / (අලාභ) | | - | - |
| නැවත ගණනය කළ විශ්‍රාමික අරමුදල් වගකීම | 26 | (20,118,822) | (58,917,967) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් | | - | - |
| ආශ්‍රිත සමාගම් හි හා බද්ධ ව්‍යාපාරයන්හි ලාභ කොටස | | - | - |
| විකිණීමට ඇති දේවල් ප්‍රතිආගණනය මත ලාභ හා අලාභ | | - | - |
| මූල්‍ය වත්කම් | | - | - |
| වෙනත් | | - | - |
| අඩු: ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම වලට අදාල බදු වියදම් | | 5,633,270 | 16,497,031 |
| **එකතුව** | | (14,485,552) | (42,420,936) |
| **වර්ෂය සඳහා බදු අඩු කළ වෙනත් විස්තීර්ණ ආදායම** | | (14,485,552) | (42,420,936) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | 461,226,890 | 521,969,874 |
| **වෙන්කරන ලද :** | | | |
| හවුල්කරුවන් | | 461,226,890 | 521,969,874 |
| කොටස්හිමියන්ට පාලනයට යටත් නොවන හිමිකම | | - | - |
| **එකතුව** | | 461,226,890 | 521,969,874 |

# මූල්‍ය තත්ව ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**
**සංඛ්‍යා රු. වලිනි**

| විස්තරය | සටහන් | බැංකුව 2019 | 2018 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන වත්කම් | 13 | 421,218,289 | 210,466,904 |
| මහ බැංකුවේ ඇති ශේෂය | 14 | - | - |
| අනෙක් බැංකු වල ඇති තැන්පතු | 15 | 7,539,925,299 | 5,396,308,712 |
| ලාභ හෝ අලාභය තුළින් හඳුනාගත් මූල්‍ය වත්කම් | 16 | 19,250,000 | 18,750,000 |
| මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අත්තිකාරම් | 17 | 41,215,592,671 | 37,948,619,994 |
| - ණය සහ වෙනත් උපකරණ | 18 | 4,880,392,998 | 3,980,888,836 |
| දේපළ, පිරියත, සහ උපකරණ | 19 | 380,300,199 | 466,243,583 |
| ROUA කල්බදු | 19.4 | 351,112,109 | - |
| ආයෝජන දේපළ | 20 | 920,000,000 | 871,500,000 |
| විලම්භිත බදු වත්කම් | 21 | 112,649,070 | 87,528,467 |
| වෙනත් වත්කම් | 22 | 114,205,713 | 304,984,592 |
| **මුළු වත්කම්** | | 55,954,646,348 | 49,285,291,088 |
| **වගකීම්** | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 23 | 953,384,855 | 1,001,987,444 |
| මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 24 | 42,504,294,457 | 37,016,036,358 |
| - වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු | 24 | 1,603,783,508 | 1,611,914,273 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 25 | 4,042,358,842 | 4,038,675,896 |
| බදු වගකීම් | 25.1 | 310,149,189 | - |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් | 26 | 635,835,310 | 554,254,947 |
| ජංගම බදු වගකීම් | 27 | 333,629,689 | 57,327,668 |
| අනෙකුත් වගකීම් | 28 | 185,394,569 | 248,482,126 |
| **මුළු වගකීම්** | | 50,568,830,420 | 44,528,678,713 |
| **ණය ප්‍රාග්ධනය** | | | |
| සදාතනික බැඳුම්කරය | 29 | 266,708,172 | - |
| **කොටස්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරා ඇති ප්‍රාග්ධනය | 30 | 962,092,936 | 962,092,936 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 31 | 209,601,642 | 188,424,906 |
| රඳවාගත් ඉපැයුම් | 32 | 3,679,558,147 | 3,319,553,632 |
| අනෙකුත් සංචිත | 33 | 267,855,032 | 286,540,902 |
| **සමස්ත කොටස් හිමියන්ගේ හිමිකම්** | | 5,119,107,757 | 4,756,612,376 |
| පාලනය නොවන හිමිකාරිත්වය | | - | - |
| **සමස්ත හිමිකම්** | | 5,119,107,757 | 4,756,612,376 |
| **සමස්ත හිමිකම් හා වගකීම්** | | 55,954,646,348 | 49,285,291,088 |
| කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | | 79.11 | 73.51 |
| අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් | 34 | 432,241,260 | 528,184,484 |
| වෙනත් තොරතුරු | | | |
| සේවකයන් ගණන | | 558 | 561 |
| ශාඛා සංඛ්‍යාව | | 39 | 39 |

පිටු අංක 127 සිට 162 දක්වා ඇති වැදගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන හා අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS/SLFRS) අනුකූලව සකස් කර ඇත.

**ඩී.වී. පතිරණ**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

**පාලිත ගමගේ**
ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් තබන ලද්දේ,

**ආර්. එම්. ආර්. ඩබ්ලිව්. මංචනායක මිය**
සභාපතිනිය
දිනය 17/04/2020
කොළඹදී

**ආචාර්ය කේ.ඩී. ගුණවර්ධන**
අධ්‍යක්ෂක

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

31-12-2019 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

බැංකුව

| රු. වලින් (000) | ඡන්දබලය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | OCI සංචිත | ප්‍රත්‍යගණන සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | එකතුව | පාලනය නොකළ හිමිකාරීත්වය | මුළු කොටස් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01-01-2018 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 160,313 | -3,176 | 29,762 | 2,844,675 | 237,931 | 4,231,599 | - | 4,231,599 |
| IFRS 9 ප්‍රතිස්ථාපිත | - | - | -108 | - | - | -4,854 | -216 | -5,178 | - | -5,178 |
| ගැලපීම් (IFRS 9 අලාභහානි) | - | - | - | - | - | - | 9,097 | 9,097 | - | 9,097 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | - | - | - | - | - | 564,391 | - | 564,391 | - | 564,391 |
| වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ බදු) | - | - | - | -42,421 | - | - | - | -42,421 | - | -42,421 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | - | -42,421 | - | 564,391 | - | 521,970 | - | 521,970 |
| කොටස් හිමියන් සමඟ ගනුදෙනු කිරීම: පිළිගත් | - | - | - | - | - | - | - | - | - | - |
| සෘජුවම හිමිකම ඇති | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් නිකුතුව / පැවරුම් ප්‍රාග්ධනය වැඩි කිරීම | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රසාද නිකුතුව | - | - | - | - | - | - | - | - | - | - |
| හිමිකම් නිකුතුව | - | - | - | - | - | - | - | - | - | - |
| ආයෝජන අරමුදල් පැවරුම | - | - | - | - | - | - | - | - | - | - |
| කාල සීමාව තුළ සංචිත වෙත මාරුකිරීම් | - | - | 28,220 | - | - | -84,659 | 56,439 | - | - | - |
| ගෙවන ලද ලාභාංශ | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රධාන කාර්යාලයට වෙත යවන ලද ලාභය | - | - | - | - | - | - | - | - | - | - |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභය (පිරිවැය ක්‍රමය අනුමත නම්) | - | - | - | - | -875 | - | - | -875 | - | -875 |
| වෙනත් | - | - | - | - | - | - | - | - | - | - |
| **කොටස් හිමියන් සමඟ සමස්ත ගනුදෙනු** | - | - | 28,220 | - | -875 | -84,659 | 56,439 | -875 | - | -875 |
| **31-12-2018 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 188,425 | -45,597 | 28,887 | 3,319,554 | 303,251 | 4,756,612 | - | 4,756,612 |

| රු. වලින් (000) | ඡන්දබලය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | OCI සංචිත | ප්‍රත්‍යගණන සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | එකතුව | පාලනය නොකළ හිමිකාරීත්වය | මුළු කොටස් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01-01-2019 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 188,425 | -45,597 | 28,887 | 3,319,554 | 303,251 | 4,756,612 | - | 4,756,612 |
| IFRS 9 ප්‍රතිස්ථාපිත ිී ණයකර දුර්වලතා) | - | - | -1,419 | - | - | -24,118 | -2,837 | -28,374 | - | -28,374 |
| ගැලපීම් (ලැබිය යුතු ලීසිං රක්ෂණ) | - | - | -1,444 | - | - | -24,540 | -2,887 | -28,871 | | -28,871 |
| ගැලපීම්ිබැසීී 16 ආරම්භක බලපෑම) | - | - | 253 | - | -28,887 | 4,307 | 507 | -23,819 | | -23,819 |
| පෙර වසර ගැලපීම් | - | - | - | -17,667 | - | - | - | -17,667 | - | -17,667 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභ/(පාඩු) | - | - | - | - | - | 475,712 | - | 475,712 | - | 475,712 |
| වෙනත් විස්තීරණ ආදායම් (ශුද්ධ බදු) | - | - | - | -14,486 | - | - | - | -14,486 | - | -14,486 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | - | -14,486 | - | 475,712 | - | 461,227 | - | 461,227 |
| කොටස් හිමියන් සමඟ ගනුදෙනු කිරීම, පිළිගත් | - | - | - | - | - | - | - | - | - | - |
| සෘජුවම හිමිකම ඇති | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් නිකුතුව/පැවරුම් ප්‍රාග්ධනය වැඩි කිරීම | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රසාද නිකුතුව | - | - | - | - | - | - | - | - | - | - |
| හිමිකම් නිකුතුව | - | - | - | - | - | - | - | - | - | - |
| කාල සීමාව තුළ සංචිත වෙත පැවරුම් | - | - | 23,786 | - | - | -71,357 | 47,571 | - | - | - |
| ගෙවන ලද ලාභාංශ | - | - | - | - | - | - | - | - | - | |
| ප්‍රධාන කාර්යාලය වෙත යවන ලද ලාභය | - | - | - | - | - | - | - | - | - | - |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභය (පිරිවැය ක්‍රමය අනුමත නම්) | - | - | - | - | - | - | - | - | - | - |
| වෙනත් | - | - | - | - | - | - | - | - | - | - |
| **කොටස් හිමියන් සමඟ ඇති මුළු ගනුදෙනු** | - | - | 23,786 | - | - | -71,357 | 47,571 | - | - | - |
| **31-12-2019 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 209,602 | -77,750 | - | 3,679,558 | 345,605 | 5,136,775 | - | 5,119,108 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | බැංකුව | |
|---|---|---|
| | 2019 | 2018 |
| | රු | රු |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | |
| පොලී ලැබීම් | 7,104,296,774 | 6,224,050,114 |
| පොලී ගෙවීම් | (4,202,627,702) | (4,787,888,525) |
| ශුද්ධ කොමිස් ලැබීම් | 222,437,514 | 154,854,706 |
| වෙළඳ ආදායම් | - | - |
| සේවකයන්ට ගෙවීම් | (1,061,302,484) | (1,006,373,760) |
| මූල්‍ය සේවා මත වි.අ.බ, ජා.ගො.බ සහ ණ.අ.ගෙ | (496,325,295) | (327,182,644) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම් | 189,119,434 | 210,944,426 |
| අනෙකුත් මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ගෙවීම් | (486,837,714) | (453,106,920) |
| **මෙහෙයුම් වත්කම් වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | 1,268,760,527 | 15,297,398 |
| **මෙහෙයුම් වත්කම් අඩුවීම / (වැඩිවීම) :** | | |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇති ශේෂයන් | - | - |
| ක්‍රමක්ෂය පිරිවැයට ඇගයූ මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් | (3,014,868,675) | (2,678,782,767) |
| වෙනත් වත්කම් | (205,930,984) | (81,069,129) |
| | (3,220,799,659) | (2,759,851,896) |
| **මෙහෙයුම් බැරකම්වල වැඩිවීම / (අඩුවීම)** | | |
| ක්‍රමක්ෂය පිරිවැයට ඇගයූ මූලික වගකීම - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 4,931,556,554 | 711,099,058 |
| ක්‍රමක්ෂය පිරිවැයට ඇගයූ මූලික වගකීම - ණය සුරැකුම් හිමිකරුවන්ට ගෙවිය යුත | - | (1,072,816,895) |
| ක්‍රමක්ෂය පිරිවැයට ඇගයූ මූලික වගකීම - වෙනත් ගැනුම්කරුවන්ට ගෙවිය යුත | 249,901,382 | (193,851,988) |
| වෙනත් වගකීම් | (34,997,315) | (89,983,777) |
| | 5,146,460,622 | (645,553,601) |
| **ආදායම් බද්දට පෙර මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ශුද්ධ මුදල්** | 3,194,421,490 | (3,390,108,100) |
| ගෙවන ලද ආදායම් බදු | (38,272,244) | (107,650,728) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල්** | 3,156,149,246 | (3,497,758,828) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (68,100,964) | (42,461,023) |
| විකුණුම් දේපළ, පිරියත හා උපකරණ වලින් ලැබෙන ආදායම | 701,513 | 3,678,689 |
| ආයෝජන සුරැකුම්පත් මිලදී ගැනීම | (5,777,429,743) | (1,680,581,402) |
| මූල්‍ය ආයෝජන විකිණීම හා කල් පිරීමේ ශුද්ධ ආදායම | 2,649,190,532 | 5,144,808,014 |
| අස්පර්ශ්‍ය වත්කම් මිලදී ගැනීම | - | - |
| අනුබද්ධ, ආශ්‍රිත සහ ඒකාබද්ධ ව්‍යාපාරවල ආයෝජන අත්පත් කර ගැනීමෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | - | - |
| අනුබද්ධිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන වලින් ලැබී ඇති ලාභාංශ | 240,800 | 206,400 |
| වෙනත් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් | (3,195,397,862) | 3,425,650,679 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලද ශුද්ධ ලාභය | - | - |
| අනෙකුත් හිමිකම් උපකරණ නිකුත් කිරීමෙන් ලද ශුද්ධ ශුද්ධ ලාභය | - | - |
| යටත් සමාගම් ණය නිකුත් කිරීමෙන් ලද ශුද්ධ ලාභය | 250,000,000 | - |
| යටත් සමාගම් ණය ආපසු ගෙවීම | - | - |
| යටත් සමාගම් ණය මත පොලිය | - | - |
| පාලනය නොකරන පොලී සඳහා ගෙවන ලාභාංශ | - | - |
| මව් සමාගම වන කොටස් හිමියන් වෙත ගෙවනු ලබන ලාභාංශ | - | - |
| වෙනත් හිමිකම් උපකරණ හිමිකරුවන් වෙත ගෙවනු ලබන ලාභාංශ | - | - |
| වෙනත් | - | - |
| මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් | 250,000,000 | - |
| මුදල් හා ඒ හා සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | 210,751,384 | (72,108,149) |
| කාලාරම්භ මුදල් හා ඒ හා සමාන වත්කම්වල | 210,466,904 | 282,575,053 |
| කාලාවසාන මුදල් හා ඒ හා සමාන වත්කම්වල | 421,218,289 | 210,466,904 |
| **මුදල් හා මුදල් මුදල් හා ඒ හා සමාන වත්කම් සැසඳුම** | | |
| අතැති මුදල් | 150,212,979 | 154,694,507 |
| බැංකුව සතු මුදල් | 271,005,310 | 55,772,397 |
| | 421,218,289 | 210,466,904 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තා කරන්නා

1956 ජාතික නිවාස පනතෙහි 11 වන කොටස යටතේ සංවර්ධන ණය දෙන සමිතියක් ලෙස ශ්‍රී ලංකා HDFC බැංකුව 1984 දී ස්ථාපිත කරන ලදී. අනතුරුව 1997 අංක 7 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍යායතනය යටතේ සංස්ථාවක් බවට සහ 2003 අංක 15 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (සංශෝධිත) පනත යටතේ විශේෂිත බැංකුවක තත්ත්වය සහ සංශෝධිත 2011 අංක 45 යටතේ 1988 අංක 30 දරණ බැංකු පනතේ iv වැනි උපලේඛනය හා ඉන් පසුව ඇතිවන සංශෝධනවල ඇති සියළු ක්‍රියාකාරකම් සඳහා අවසර දෙනු ලැබීය. ඍතක බැංකුවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරි ලේකම් කාර්යාලය, කොළඹ 02 යන ලිපිනයෙහි ය.

## 2 සැකසුම් පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වෙතිහාසික පිරිවැය පදනම සහ සාධාරණ වටිනාකම ගණනය කිරීම මත අඛණ්ඩව අවශ්‍ය අවස්ථාවන්හිදී සිදු කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය සියළු නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සඳහා හඳුන්වා දුන් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් මෙම මූල්‍යමය ප්‍රකාශයන් සකස් කිරීම සඳහා භාවිතා කරන ලදී. ඉහත ප්‍රමිතීන් අනුව සංසන්දනාත්මක දත්ත නැවත සකස් කර ඇත. කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීමේ නියමයන් අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් ද නිසි අනාවරණයක් සපයයි.

### 2.2 භාවිත හා සැකසුම් මුදල් ඒකකය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනය බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන ලද මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 1 හි "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" මගින් අවසර ලබාදී ඇති පරිදි හැරුණු විට, ආසන්නතම රුපියලට වටයා ඇත,

### 2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන අනුව සහ එහි සංශෝධන හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය තම වගකීම අවබෝධ කරගත් බව මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයි හි දක්වා ඇත.

### 2.4 ගිණුම් වර්ග සහ පූර්ව වසර අගයයන්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ගිණුම් ආකෘතිය අනුව ඉදිරිපත් කරනු ලබන අතර, බැංකුව විසින් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුව පූර්ව මූල්‍ය වර්ෂය හා අනුකූල වේ.

### 2.5 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරන ලද බැංකුවේ වත්කම් හා වගකීම් ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩගත කර ඇති අතර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව හා කල් පිරෙන රටාවට අනුව ලැයිස්තු ගත කර ඇත. බැංකුවෙහි වත්කම්වල සහ වගකීම්වල කල් පිරුණු රටාවන් පිළිබඳ විශ්ලේෂණය කල් පිරුම් පරතර විශ්ලේෂණ වාර්තාවේ ඉදිරිපත් කෙරේ.

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර ඇති අතර හඳුනාගත් අගයයන් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූල බලාත්මක අයිතියක් ඇත්නම් සහ පූර්ණ වශයෙන් පියවීමට අවශ්‍යතාවක් ඇත්නම්, හෝ වත්කම් අවබෝධ කරගැනීමට හා එකවිට බැරකම් පියවීම සිදු කළ යුතු නම් එම ශුද්ධ එකතුව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇත. බැංකුවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල නිශ්චිත වශයෙන් අනාවරණය කොට ඇති පරිදි සහ ඕනෑම ගණකාධිකරණ ප්‍රමිතියක් හෝ අර්ථකථනයක් මඟින් අවශ්‍ය ව ඇති හෝ දැක්වීමක් සිදු කර නොමැති නම්, ආදායම් ප්‍රකාශය තුළ දී ආදායම් සහ වියදම් හිලව් නොකෙරේ.

### 2.6 ප්‍රමාණාත්මකබාවය හා සංයුක්ත කිරීම

එකිනෙක ප්‍රමාණාත්මක සමාන අයිතම කාණ්ඩ මූලික ප්‍රකාශනවල වෙන වෙනම දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව ප්‍රමාණාත්මක නොවේ නම් ස්වභාවයෙන් හා ක්‍රියාකාරිත්වයෙන් අසමාන අයිතම ද වෙන වෙනම ඉදිරිපත් කරයි.

### 2.7 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු වඩා යෝග්‍ය ලෙස ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම සඳහා නැවත වර්ගීකරණය කරනු ලැබේ.

## 3ග සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

### 3.1 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස අඛණ්ඩව ඉදිරියට යාම සඳහා ඇති හැකියාව පිළිබඳව කළමනාකරණය විසින් තක්සේරු කර , ඉදිරි කාලය සඳහා ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවදුරටත්, අඛණ්ඩ පැවැත්මක් වෙනුවෙන් බැංකුවේ පවතින හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසියම් ප්‍රධාන අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වයට දැනගැනීමට ලැබී නොමැත. එබැවින්, අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශයන් සකසා ඇත.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.2 වත්කම් තක්සේරු කිරීම

#### 3.2.1 ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්

අනාගතයේ විය හැකි ණය පාඩු සඳහා හානිකරණ අගයට පසු ශුද්ධ අගය මත ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ.

*3.2.1.1 හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන*

2018 ජනවාරි 1 දා සිට බලපවත්වන ප්‍රතිපත්තිය
මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (ECL)
ආයුකාල අපේක්ෂිත ණය අලාභ (ECL) හා මාස 12ක අපේක්ෂිත ණය අලාභ (ECL) මගින් ආයතනය ණය දීමනා ලබාදීම් මනිනු ලබයි. අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීමේදී මූල්‍ය වත්කමක ණය අවදානම මුල් හඳුනාගැනීමට සාපේක්ෂව ක්‍රමානුකූලව වර්ධනය වී ඇත්දැයි ආයතනය පරීක්ෂා කරනු ලබයි. මේ සඳහා ආයතනය අනවශ්‍ය වියදම් හෝ ආයාසයන් නොමැති සාධාරණ හා සහයෝගී විස්තර සලකා බලයි. බැංකුවේ ඓතිහාසික අත්දැකීම්, ඉදිරි දැක්මේ තොරතුරු ඇතුලත්ව හා දැන්වූ ණය තක්සේරු මත පදනම්ව, ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ විශ්ලේෂණයන්ද ඇතුළත් වේ.

2018 ජනවාරි 1 දාට පෙර බලපවත්වන ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) අංක 09 "මූල්‍ය උපකරණ- බැංකුවල මූල්‍ය ප්‍රකාශවල හඳුනාගැනීම හා මිනුම් කිරීම් සමග අනුකූල වීම සඳහා භව්‍ය අක්‍රමිකතා හානි පූරණ ගනුදෙනුකරුවන්ට දෙන සියළු ණය හා අත්තිකාරම් අබණ්ඩ සමාලෝචනය කරනු ලබයි. අවශ්‍ය වන පරිදි සාධාරණ වටිනාකම ගණනය කිරීම සඳහා පහත දැක්වෙන තක්සේරු ක්‍රම භාවිතා කරන ලදී.

**1. සාමූහික හානිකරණ ක්‍රමය** (Collective Impairment Method)
**2. තනි හානිකරණ ක්‍රමය** (Individual Impairment Method)

*3.2.1.1.1 සාමූහික හානිකරණ ක්‍රමය*

සාමූහික හානිකරණ මගින් බැංකුවේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 09 'මූල්‍ය උපකරණ - බැංකුවල මූල්‍ය ප්‍රකාශවල හඳුනාගැනීම හා මිනුම් කිරීම් හා අනුකූලව භව්‍ය ණය හානි පූරණයන් සිදු කරයි. තනි අපහාහනය ප්‍රධාන නොවන අවස්ථාවන්හි දී පිරිවටන අනුපාත ක්‍රමය අනුව බැංකුව සාමූහික හානිකරණ ප්‍රතිපාදන සිදු කරන ලදී. මෙම හානිකරණ ප්‍රතිපාදන පාඩු පැහැර හැරීමේ (Loss Given Default-LGD) අනුපාතය අනුව සකස් කර ඇත.

*3.2.1.1.2 තනි හානිකරණ ක්‍රමය*

*3.2.1.1.2.1 විකිණීම සඳහා ලබාගත් දේපල*

ඍහක බැංකුවට උකස් කරන ලද දේපළ සාධාරණ කාලයකට ගනුදෙනුකරුවන් ගෙවීම් පැහැර හැර ඇති විට, වෙන්දේසිවලදී නොවිකිණෙන දේපල අත්පත් කරගත් දේපල වශයෙන් ණය සහ අත්තිකාරම් යටතේ ඉදිරිපත් කර ඇත. සාධාරණ සහතිකයක් සහිතව අනාවැකි පළ කර ඇති මුදල් ප්‍රවාහ මගින් එම දේපලවල තක්සේරු තනි තනිව සිදු කරනු ලැබේ.

*3.2.1.1.2.2 රු. මිලියන 10 ඉක්මවූ ණය සහ මාස 36 ඉක්මවූ නොපියවන ලද වගවූ ණය*

මාස 36 ඉක්මවූ නොපියවන ලද වගවූ ණය, අනාගත මුදල් අයකරගැනීම් පිළිබඳ සාධාරණ සහතිකයක් ඇති රු. මිලියන 10 ඉක්මවූ ණය ඇතුලත්ව උකස් හා මුදල් හැර අනෙකුත් ණය සඳහා තනි හානිකරණ ක්‍රමය භාවිතා කෙරිණි.

*3.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්*

SLFRS 15 වන "ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් ලැබෙන ආදායම " සහ පහත දැක්වෙන" බතඤ 9 - 'මූල්‍ය උපකරණ' හි දක්වා ඇති වෙනස්කම් හැරෙන්නට, මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේදයන්ට පිටු අංක ං සිට ං දක්වා සටහන් ං සිට ං හි දක්වා කර ඇති ගිණුම් ප්‍රතිපත්තිය බැංකුව නිරන්තරව අදාළ කර තිබේ :

**SLFRS 15 – "ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් ලැබෙන ආදායම"**
SLFRS 15 මගින් ආදායම පිළිගැනීමේදී කාලය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා වූ පුළුල් රාමුවක් ඉදිරිපත් කර තිබේ. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාව මගින් ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් මගින් ඇතිවන ආදායම් සහ මුදල් ප්‍රවාහයන්හි අවිනිශ්චිත බව, ස්වභාවය, ප්‍රමාණය හා කාලය පිළිබඳ මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට අවබෝධ කර ගැනීමට හැකිවේ.

ආදායම් හඳුනාගන්නේ කවදාද සහ කුමන වටිනාකමකින්දැයි තීරණය කිරීමට ආයතන පියවර පහකින් යුක්ත ආකෘතියක් අනුගමනය කර ඇත. ආකෘතියේ සඳහන් කරන ලද්දේ ද, ආදායම පිළිගනු ලබන්නේ ද, ආයතනය විසින් ආයතනය බලාපොරොත්තු වූ මිලට ද, පාරිභෝගිකයා වෙත භාණ්ඩය හා සේවා මාරු කළ විටය. කිසියම් නිර්ණායකයක් සපුරා තිබේද යන්න මත පදනම්ව, ආදායම පිළිගනු ලැබේ.

එය LKAS 18 - "ආදායම්" හා LKAS 11 - "ඉදිකිරීම් කොන්ත්‍රාත්" සහ IFRIC 13 - "පාරිභෝගික හිතෛෂී වැඩසටහන්" ඇතුළුව පවත්නා ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපනය කරයි. පූර්ව භාවිතයට අවස්ථාව දී ඇතිවිට හා 2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා SLFRS 15 ක්‍රියාත්මක වේ.

බැංකුව සිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත ගාස්තු සහ කොමිස් ආදායම මත ඇති විය හැකි බලපෑම් පිළිබඳ මූලික සමාලෝචනය සම්පූර්ණ කර ඇත. මූලික සමාලෝචනය මගින් පෙන්නුම් කරන්නේ පිළිගැනීමේ හෝ මිනුම් කිරීමේ කාල සීමාව මත මූල්‍ය ප්‍රකාශයන්ට SLFRS 15 මගින් ප්‍රධාන බලපෑමක් ඇති නොවන බවයි.

**SLFRS 9 – 'මූල්‍ය උපකරණ' (Financial Insturments)**
බැංකුව 2018 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි 2014 ජූලි මස නිකුත් කළ 'මූල්‍ය උපකරණ', යොදා ගන්නා ලදී. SLFRS 9 සතු අවශ්‍යතාවන් LKAS 39 - 'මූල්‍ය උපකරණ : හඳුනාගැනීම හා ඇගයීමගි ට වඩා පැහැදිලි වෙනස්කම් දරයි. නව ප්‍රමිතිය මූල්‍ය වත්කම් සඳහා ගිණුම්කරණය හා මූල්‍ය බැරකම් සඳහා ගිණුම්කරණයේ සැලකිය යුතු පැතිකඩක් වෙත මූලික වෙනස්කම් ගෙන එයි.

SLFRS 9 යොදා ගැනීමෙන් බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට සිදුවූ ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

**මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් වර්ගීකරණය**
SLFRS 9 සතුව මූල්‍ය වත්කම් සඳහා ප්‍රධාන වර්ගීකරණ තුනක් තිබේ. එනම්, ක්‍රමක්ෂය වූ පිරිවැය ගණනය, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය (FVOCI) සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය (FVOCI) යි. මෙම ප්‍රමිතිය දැනට පවත්නා LKAS 39 සතු ඉඩහැරි කල් පිරීම්, ණය සහ ලැබීම් හා විකිණීමට ඇතිදේ යන ප්‍රවර්ගයන් ඉවතලයි. SLFRS 9 වර්ගීකරණය පාදක වී ඇත්තේ මූල්‍ය වත්කම් හා මූල්‍ය ප්‍රවාහ කළමනාකරිත ව්‍යාපාර ආකෘති මත ය.

SLFRS 9 යටතේ, එහි විෂය පථය තුළ දරන්නා මූල්‍ය වත්කමක් වන ගිවිසුම්වල අඩංගු ව්‍යුත්පන්න කිසි විටක නොබෙදිණි. ඒ වෙනුවට, සම්පූර්ණ දෙබිඩි උපකරණ වර්ගීකරණය සඳහා තක්සේරු කෙරේ.

SLFRS 9 විශාල වශයෙන් මූල්‍ය බැරකම් වර්ගීකරණය සඳහා දැනට පවත්නා බණී් 39 සතු අවශ්‍යතාවන් මත රඳා පවතී. කෙසේ නමුත්, LKAS 39 තුළ සියළු බැරකම් වෙනස්වීම් අගය යටතේ සාධාරණ වටිනාකම් විකල්පය ලාභ හා අලාභ තුළ හඳුනා ගන්නා අතර SLFRS 9 යටතේ සාධාරණ අගය වෙනස්වීම් මූලික වශයෙන් පහත පරිදි වේ.

